

# විදර්ශනා මාර්ග දීපනිය

සහ

# සංක්ෂේප රූපසංග්‍රහ වර්ණනාව.

# විද්‍යාමාර්ග දීපනිය

සහ

# සංක්ෂේප රූපසඞ්ග්‍රහ වර්ණනාව.


කොළඹ දෙමටගොඩ මහා විශුද්ධාරාමාධිපති

ආචාර්ය

**සිරිධම්ම ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ**

විසින් සම්පාදනය කරනලදී.



රත්නපුරේ අමුවල පදිංචි ඩබ්ලිව්. රත්‍රන්හාමි

වන මා විසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ මුද්‍රණයන්ත්‍රාලයේ මුද්‍රණය කරවනලදී.


# VIDYAMARGA DEEPANI

AND

## SANKSHEPA RUPASANGRAHA WARNANA

BY


**ACHARYA SIRIDHAMMA THERO,**

*Maha Visuddharamaya, Dematagoda, Colombo.*



PRINTED AND PUBLISHED BY

**W. RATHRANHAMY**

AMUWALA, RATNAPURA.

AT THE

GRANTHAPRAKASA PRESS, COLOMBO.

2466.

1922.

# විද්‍යාමාර්ග දීපනිය

සහ

# සංක්ෂෙප රූපසඞ්ග්‍රහ වර්ණනාව.

කොළඹ දෙමටගොඩ මහා විශුද්ධාරාමාධිපති

ආචාර්ය්‍ය

**සිරිධම්ම ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ**

විසින් සම්පාදනය කරනලද.

රත්නපුරේ අමුවල පදිංචි ඩබ්ලිව්. රත්‍රන්හාමි

වන මා විසින්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ මුද්‍රායන්ත්‍රාලයේ මුද්‍රණය කරවනලදී.

# VIDYAMARGA DEEPANI

AND

## SANKSHEPA RUPASANGRAHA WARNANA

BY

**ACHARYA SIRIDHAMMA THERO,**

*Maha Visuddharamaya, Dematagoda, Colombo.*

PRINTED AND PUBLISHED BY

**W. RATHRANHAMY**

**AMUWALA, RATNAPURA**

AT THE

GRANTHAPRAKASA PRESS, COLOMBO.

2466.

1922.

# සංඥාපනය.

විද්‍යාමාර්ග දීපනී නම්වූ මේ ධර්ම ග්‍රන්ථය අප විසින්ම සම්පාදනය කරනලදින් මුද්‍රණයට පමුණුවා පළවීතිබෙන බෞද්ධ **ඥානාලෝක** නමැති පොතේ සංඥාපනයෙහි නම සඳහන්වූ ගෞරවාර්හ බදුල්ලේ **ඥානවිලාස** ස්ථවිරයන්වහන්සේගේ ආරාධනාවෙන් ලියා සකස්කරනලද්දකි.

(මූන්වහන්සේ නාමරූපස්කන්ධයන්ගේ උදයව්‍යය ලක්ෂණයන් අකුරුදන්නා කාටත් බලා පහසුවෙන් තේරුම් ගත හැකි පරිද්දෙන් මෙය ලියා සකස්කරණීනට ආරාධනා කළ නමුත් ආරාධනාකළ කටයුත්ත නිමවීමට ප්‍රථම ස්වකීය ස්කන්ධ භේදය කරණකොටගෙන ලෝකයාට අනිත්‍යය ප්‍රකාශකළාක් මෙන් ඝෝරතර මරුවාට වසඟවූයෙන් ඒ බව මෙහි සංවේග පුරස්සරව පළමුකොටම සිහිකරන්ට සිදුවිය අහෝ ඛේදයක!)

පඤ්චවිධ විද්‍යාවන්ගේ සහ පඤ්චවිධ ප්‍රධානීයාඞ්ගයන්ගේ සවිස්තාර විනිශ්චයකුත් සමග ලෝකෝත්තර ආර්යවිද්‍යාව උපදවන අන්දම මෙහි විස්තරවද පැහැදිලිවද ප්‍රකාශවන හෙයින් මෙය බලා යම් යම් නැනවතුන්ට ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවලක්ෂණ උදයව්‍යය ලක්ෂණයන් හොඳින් වැටහුණි නම් ඒ නැනවතුන්ට සර්වඥශාසනය කෙරෙහි ඥානසම්ප්‍රයුක්ත අවකල්පන (සිත්සතන්හි වැදගත්) ශ්‍රද්ධාභක්තිය උපදවා කළණ පුහුදුන් බවට පැමිණගතහැකිවනු පමණක් නොව අනමතාග්‍ර සංසාරය මුළුල්ලෙහි සිත්සතන්හි මුහුකරමින් පැවතෙන්නාවූ සකල දුශ්චරිත දුරාජීව මිථ්‍යාදෘෂ්ටීන්ට සහ නිරය තිර්යක්ප්‍රේත අසුරපාසිකාදිදුඃඛධර්මයන්ටත් මූලාධාර සක්කායදිට්ඨි විචිකිච්ඡා නමැති කෙලෙශාග්නි බීජයන් වඳකරදමා ස්‍රෝතාපත්තිමාර්ග සොපාදිශෙෂ ප්‍රථම නිර්වාණාධිගමයටද මාර්ගීය පාදගත හැකිවේ.

යම් කෙනෙක් ඇතිතාක් ලෞකික විද්‍යාස්ථානයන්හි අචින්තිය අතිවිශාරද පාණ්ඩිත්‍යයන්ට පැමිණෙත්මුත් ශාසන ධර්මයෙහිලා වූවමනාමවූ කෘත්‍යය හා සසඳා බැලූකල්හි ඒ පාණ්ඩිත්‍යයන් සූක්ෂම ධාතු ස්වභාව දක්වාත් නොබස්නාවූ අවබෝධයටත් පහසුවූ කලාපයක්පාසාත් සම්මුඛවන්නාවූ සමූහ සන්තති සංස්ථානාදි ප්‍රඥප්ති නමැති පිටලෙල්ලෙහිම පැළඹෙන හෙයින් ඒකාන්තයෙන් ප්‍රශංසාර්හ නොවෙත්.

යම් කෙනෙක් වනාහි ශෛවාල පටලයෙන් වැසීගිය පොකුණක ඒ ශෛවාල පටලය ඉවතලමින් ජලය පාදා ගන්නාක්මෙන් ස්වපරසන්තාන කායයන්හි ඒ ප්‍රඥප්ති නමැති පිට ලෙල්ල ඉවතලමින් ඒකාන්තයෙන් විද්‍යමාන නාමරූප ධාතුස්වභාවම පාදාගෙන අනාත්මවශයෙන් (පිටත්තරවශයෙන්) ප්‍රතිවේධකරගත්තුනම් ඔවුන්ගේ ඒ ප්‍රතිවෙධයම ඒකාන්තයෙන් ප්‍රශංසාර්හවේ.

වදාළේමැනො ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් විසින්
ථෙරගාථා පාළියෙහි–

"සුඛුමං තෙ පටිවිජ්ඣන්ති වාලග්ගං උසුනා යථා
යෙ පඤ්චක්ඛන්ධෙ පස්සන්ති පරතො නොච අත්තතො"යි

යම් කෙනෙක් රූපාදි පඤ්චස්කන්ධයන් අනාත්මවශයෙන් (පිටත්තර වශයෙන්) මුත් ආත්මවශයෙන් (ඇතුළතවශයෙන්) නොදක්නාහුවෙත්ද ඔවුහුම වාලාග්‍රයක් විදපලන්නාක්මෙන් අති සූක්ෂ්ම ස්කන්ධ ධර්මයන් අනාත්මවශයෙන් ප්‍රතිවෙධකර ගත්තුය යනු භාවයි.

බුද්ධාදි ආර්‍ය්‍යයන් දක්නෝද මෙසේ ස්කන්ධධර්මයන් අනාත්මවශයෙන් ප්‍රතිවෙධකරගත් සත්පුරුෂයෝමය. ඒ එසේමැයි අප මහබෝසතාණන්වහන්සේ බුදුවීමට පළමු පස්වග්මහණුන්ගෙන් වෙන්වගොස් සාවුරුද්දක් මුළුල්ලෙහි දුෂ්කරක්‍රියාකොට බුදුව බරණැස ඉසිපතනාරාමයට පෙරලා වැඩි ගමනේදි බුදුවූ බව නොදත් පස්වග මහණුන් විසින් උන්වහන්සේට නාමයෙන් සහ ආවුසොවාදයෙන් කථාකරන ලදින් මහණෙනි! දැන් මම බුදුවීමි මට නාමයෙන් සහ ආවුසොවාදයෙන් කථානොකරව්යයි වදාළ නමුත් නොඇදහූ ඒ පස්වග මහණුන්ට නැවත නැවත කරුණු කියා පෑමෙන් ධාතු චක්ෂුසපැදුණු කල්හිම උන්වහන්සේගේ බුදුබව දත හැකිවිය.

එහෙයින්ම උදන් අනනලදි ආයුෂ්මත් වප්පස්ථවිරයන් වහන්සේ විසින්

"පස්සති පස්සො පස්සන්තං අපස්සන්තඤ්ච පස්සති
අපස්සන්තො අපස්සන්තං පස්සන්තඤ්ච න පස්සති"යි

ධාතු චක්ෂුසින් දක්නා පුද්ගලතෙම ධාතු චක්ෂුසින් දක්නා පුද්ගලයාද දකියි ධාතුචක්ෂුසින් නොදක්නා පුද්ගලයාද දකියි ධාතුචක්ෂුසින් නොදක්නා පුද්ගලතෙම ධාතුසින් නොදක්නා පුද්ගලයාද දක්නා පුද්ගලයාද නොද යනු භාවයි.

පෙර මේ ලක්දිව රෝහන ජනපදයෙහි සිතුල්පව් වෙහෙර රහතුන්ගෙන් බැබලෙමින් පැවති කාලයෙහි වාසයකළාවූ එක්තරා ක්ෂීණාශ්‍රවයන්වහන්සේ කෙනෙකුන්ට උපස්ථානකරමින් සිටි මහලු පැවිද්දෙක්ද එක්දිනක් ඒ ක්ෂීණාශ්‍රවයන්වහන්සේ සමග පිඬු සිඟාගොස් උන්වහන්සේගේ පාසිවුරුගෙන පිටිපසින් එමින් ස්වාමිනි! ආර්‍ය්‍යයෝ කෙබන්දෝදැයි විචාළේය එවිට ක්ෂීණාශ්‍රවයන්වහන්සේ ඇවත! මේ සස්නෙහි ආර්‍ය්‍යයන්ගේ පාසිවුරුගෙන වත්පිළිවෙත් කරමින් ආර්‍ය්‍යයන් සමග හැසිරෙමිනුත් ඇතැම් මහල්ලෙක් ආර්‍ය්‍යයෝ කෙබන්දෝදැයි නොදනිති මෙසෙයින් ආර්‍ය්‍යයන් දැකීම දුෂ්කර යයි වදාළකල්හිද ඒ මහලු පැවිදි තැනට උන්වහන්සේගේ ආර්‍ය්‍යභාවය නොදතහැකිවිය. අහෝ! අද පුහුදුන්බවට නින්දාවක්මවේවා.

මේ කිහ දම්සඟුණු අටුවාවෙහි –

"මංසචක්ඛුනා වා දිබ්බචක්ඛුනා වා අරියා දිට්ඨාපි අදිට්ඨාව හොන්ති"යි. මසැසින් හෝ දිවැසින් ආර්‍ය්‍යයන් දිටුවාහු නමුදු ඔව්හු ආර්‍ය්‍යයන් නොදිටුවෝම වෙත් යනු භාවයි.

ආර්‍ය්‍යයන් දක්නා ධාතුචක්‍ෂුස ඉපදවිය හැක්කේත් බුද්ධොත්පාදකාලයෙහිමය අබුද්ධොත්පාද කාලයෙහි වනාහි දෙව් මිනිස් ආදි කිසිවකුටත් ඉපදවීමට අවකාශයක් නැත්තේය.

එසින් කිහ විනයෙහි–

"බුද්ධාදිච්චෙව අනුප්පන්නෙ බුද්ධවංසෙ අනුග්ගතෙ
කෙසං සභාවධම්මානං නාම මත්තං න ඤායති"යි.

ලොකයෙහි සම්‍යක්සම්බුද්ධරාජසූර්‍ය්‍යයා නූපන් කල්හි සම්‍යක්සම්බුද්ධරාජචන්ද්‍රයා නූදාවූ කල්හි ස්වභාව උදයව්‍යය ලක්‍ෂණ අනාත්ම ධර්‍මයන්ගේ නාමමාත්‍රයද නොදතහැක්කේය යනු භාවයි.

මෙසේ ආ පෙල අටුවා වචනානුසාරයෙන් ළමැද හැනි හුලක් ඇත්තකු ඒ හුල උගුලාගනුපිණිස හිස ගිනිගත්තෙකු ඒ ගිනි නිවාගනු පිණිස සෙසු කටයුතු සියල්ලක් බැහැරලා උත්සාහ කටයුතුවාක්මෙන් අනාදිමත් සසර මුළුදා සිත් සතන්හි හැනී එන ආත්මදෘෂ්ටි නමැති හුල උගුලා ගැනීමට ගින්න නිවාගැනීමට උපකාර ධාතු චක්‍ෂුස මේ සස්නේදීවත් ඇතිකරගනු පිණිස සියල්ලන් විසින්ම උත්සාහකටයුතු.

අභිධර්මය මිනිසුන්ට උවමනාකරන ධර්මයක් නොවේ. අභිධර්මය ඉගෙනගතහොත් කෛරාපිකාවේ. ධර්මදේශනාදි කාලයන්හි පොතපතේ එන උපමාවකින්මුත් ඒ වේලාවේහි සිතට වැටහී ආ උපමාවකින් අර්ථය පැහැදිලිකර දක්වීම වරදය යනාදි දුර්මත උපදවා ජිනචක්‍රයට පවා පහර වදිනාකාරයෙන් නූගතුන් අතර ඒ මත පහලකරහරින්නන්ද ඇතිවී සිටිනබව සැලයි. ඊර්ෂ්‍යාව පණ්ඩිතමානීත්වය ආදි පාපධර්මයන්ට වසඟවූවන්ගෙන් පැනනඟිනා එබඳු දුර්මතවලට නොරැවටීම පිණිසද උත්සාහ කටයුතු.

මෙකල අපරදේශීය වෛද්‍යයන් විසින් දූරදර්ශීක කන්නාඩි ගුරුවිරකොටගෙන ප්‍රතිසන්ධිය ප්‍රදර්ශනිකර දක්වීම සත්ත්වයන්ගේ මොලකැපී මනෝවිඥානයන්ගේ නිඃශ්‍රය වස්තු කර දක්වීම රූප නිරොධයන් රූප අවස්ථානාන්තර පරිවර්තනයන් කර දක්වීම යනආදිවශයෙන් උපදවා තිබෙන සර්වඥමතයට ඉඳුරාම විරුද්ධවූ දාර්ශනිකමත විශ්වාසකරමින් භාෂාන්තර පාණ්ඩිත්‍යයම ගරුකරන්නාවූද ස්වසමයෙහි සැහෙන උගත්කමක් නැතත් ඇතැයි පණ්ඩිතමානීවී සිටින්නාවූද ඇතැම් බෞද්ධයන්ගේ පමණක්නොව අබෞද්ධයන්ගේද ඒ දුර්මත නිරාකරණයට මේ ග්‍රන්ථය අත්‍යන්තෝපකාරී වේමය.

අභිධර්මය ඉගෙනගන්නා ධර්මකාමීන්ගේ ප්‍රයෝජනය පිණිස "සංක්ෂේප රූපසංග්‍රහ වර්ණනාවක්ද" මිටම යාකර යෙදීමු.

අරංගල සිරිධම්ම ස්ථවිර.
A. Siridhamma Thero.

ශ්‍රී බු: ව: 2466 වන්නෙහි වෙසක් මස
පුර 15 වක් බුදදින දෙමටගොඩ
මහා විශුද්ධාරාමේදීය.

---

පොතේ 5 පිට 27 පෙළ 'ධාතුත්' යනු 'ධාතූන්' සීද, 8 පිට 18 පෙළ 'උපක්ෂයක' යනු 'උපෙක්ෂක' සීද, 10 පිට 4 පෙළ 'හෙතුකායයි' යනු 'ත්‍රිහෙතුකය' සීද, 11 පිට 3 පෙළ 'සුබයෙන්ද' යනු 'සුබයෙන් අ' සීද, 29 පිට 29 පෙළ 'යංසථා' යනු 'සංසථා' සීද, 31 පිට 3 පෙළ 'බැලූවෙත' යනු 'බැලූවොත්' සීද ශුද්ධකරගතයුතු.

# විද්‍යාමාර්ග දීපනිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

විජ්ජා විසුද්ධ සම්බුද්ධං විජ්ජා විසුද්ධ දෙසනං,
විජ්ජා විසුද්ධ සංඝඤ්ච නත්වා තිවිධ මාදරා.
ලේඛිශබෝධිවිඛ්‍යාත ශ්‍රීමමතේරෙන සඞ්ඛතං,
ගන්ථං නිස්සාය කස්සාහං විජ්ජා මග්ගස්ස දීපනිං.

විද්‍යා වනාහි වෛද විද්‍යා, මන්ත්‍ර විද්‍යා, ගන්ධාරී විද්‍යා, ලෞකික විද්‍යා, ආශ්චර්ය විද්‍යාවන්ගේ වශයෙන් පස්වැදෑරුම්වේ. ඔවුන් අතුරෙන් සාමවෙදය, යජුර්වේදය, ඍග්වෙදය, අථර්වන්වෙදය යනසතර වෙද විද්‍යා නම්.

නානාවිධ ලක්ෂණශාස්ත්‍ර, නානාවිධ නිමිත්තශාස්ත්‍ර, නානාවිධ ජ්‍යොතිශ්ශාස්ත්‍ර, නානාවිධ මන්ත්‍රශාස්ත්‍ර, නානාවිධ වෛද්‍යශාස්ත්‍ර, නානාවිධ ධාතුශාස්ත්‍රාදි ලෞකිකශාස්ත්‍ර සියල්ලක් මන්ත්‍රවිද්‍යා නම්. මේ වෙදවිද්‍යා මන්ත්‍රවිද්‍යාවය "කම්මායතන සිප්පායතන විජ්ජට්ඨානෙසු" යන ඤාණවිභඞ්ග පාළියෙහි දක්නා ලැබේ.

ඖෂධවිද්‍යා, යන්ත්‍රවිද්‍යා, පාරද (රසදිය) විද්‍යා, ලොහවිද්‍යායයි විද්‍යාධරශාස්ත්‍රයන්හි එන ධන, ඍජීවී, උදකා, කාශ, ආයු, විකතාමය සිද්ධි සම්පාදකවූ අභිඥා ඍද්ධි දෙවඍද්ධිමෙන් බලසම්පන්නවූ විද්‍යා සියල්ලක් ගන්ධාරී විද්‍යා නම්. මේ ගන්ධාරී* විද්‍යාව "තත්ථ කතමා ඒනනාමයා ඉද්ධි විජ්ජාධරා විජ්ජං පරිජපෙත්වා ආකාසෙ අන්තලික්ඛෙ හත්ථිම්පි දස්සෙන්ති අස්සම්පි

* ගන්ධාරනම් ඍෂියකු විසින් උපදවනලද නොහොත් ගන්ධාර රට උපන් විද්‍යාව ගන්ධාරී විද්‍යානම්වේ. ඒ ගන්ධාර රට බොහෝ ඍෂීහුවාසය කළෝය. ඔවුනතුරෙන් එක් ඍෂියකු විසින් උපදවනලද 'චින්තාමණි' යි සේයි දීඝනිකාය කෙවට්ට සුත්තට්ඨකථා.

**දසෙසන්ති රථම්පි දසෙසන්ති පත්තිම්පි දසෙසන්ති විවිධම්පි සෙනාබ්‍යූහං දසෙසන්ති අයං චින්තාමයා ඉද්ධි**" යන ප්‍රතිසම්භිදාමාර්ග පාළියෙහි දක්නා ලැබේ. අථ:—තත්‍ර, ඒ දශවිධ සෘද්ධීන් අතුරෙන්; කතමා, කවරක්; චින්තාමයාඉද්ධි, චින්තාමය සෘද්ධිවන්නීද? විජ්ජාධරා, විද්‍යාධරයෝ; විජ්ජං, විද්‍යාව; පරිජප්පෙත්වා, ජපකොට; අන්තලික්ඛෙ, රෙඛානොපෙනෙන ආකාසෙ, ආකාශයෙහි; හත්ථිම්පි, හස්තිසෙනාද; දසෙසන්ති, නිර්මිතකොටදක්වත්; අස්සම්පි, අශ්වසෙනාද; දසෙසන්ති, නිර්මිතකොටදක්වත්; රථම්පි, රථසෙනාද; දසෙසන්ති, නිර්මිතකොටදක්වත්; පත්තිම්පි, පාබලසෙනාද; දසෙසන්ති, නිර්මිතකොටදක්වත්; විවිධං, නානාප්‍රකාරවූ; සෙනාබ්‍යූහම්පි, සෙනාසමූහද; දසෙසන්ති, නිර්මිතකොටදක්වත්; අයං, මොතොමෝ; චින්තාමයාඉද්ධි, සිත්පූ පරිදි නිමවන හෙයින් චින්තාමය සෘද්ධිනම්වන්නීය.

මේ පාඨයෙන් චින්තාමයසෘද්ධිය ප්‍රකාශවන හෙයින්ම කියනලද ධන පෘථිවි උදකාකාශ ආයවාදි චින්තාමය සිද්ධි සියල්ලක් එහි ඇතුළත්වී එන බව දතයුතු.

මෙකල යම් කෙනෙක් මේ ගන්ධාරිවිද්‍යාව උපදවනු කැමැත්තේ වීනම් ඒ පුද්ගලයා විසින් පළමුකොට තෙරුවන් ගුණ මෙනෙහි කිරීමෙන් සවකීය සනතානය ගුණ පරිවාසිත කොට අරණ්‍යවෘක්ෂ පර්වත භූමිස්ථවූද වෘක්ෂලතා ශෛලමය භෛෂජ්‍යරක්ෂක ඖෂධාධිපතිවූද සියලුම සම්‍යග්දෘෂ්ටික දෙවතාවන් ඖරස පුත්‍රයන්මෙන් සලකා ඔවුන් කෙරෙහි මෙත්වැඩීමෙන් ඔවුන් සහායකොට ගෙන විද්‍යා විධානය කටයුතුවේ.

කුමක් හෙයිනයත්? ගන්ධාරිවිද්‍යාව දෙවියන්ගේ කර්මවිපාකජ දිව්‍ය සෘද්ධියපවා අභිභවනයට සමර්ථවිද්‍යාමය සෘද්ධියක් බැවින් දෙවියන්ට නොරිසිව ඖෂධවලටත් ජීවිතයටත් අන්තරායකළහැකි හෙයිනි.

අබුද්ධොත්පාදකාලයෙහි අරක, සරභඞ්ග, සුනෙත්‍රාදි ශාස්තෘවරයන් විසින් කසිණධ්‍යානාධිගමයට අනතුරුව පැමිණෙන ලද සෘද්ධිවිධ, දිව්‍යචක්ෂු, දිව්‍යශ්‍රොත්‍ර, චෙතොපර්‍ය්‍යාය, පූර්වෙනිවාස, යථාකම්මූපග, අනාගතාංශ සඞ්ඛ්‍යාත අභිඥාසප්තකය ලෞකිකවිද්‍යානම්. මේ ලෞකිකවිද්‍යාව ජාතකනිපාතාදියෙහි ඉතා පැහැදිලිව අවුත් තිබේ. බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ බුද්ධශ්‍රාවකයන්වහන්සේලාටද සාධාරණවිද්‍යාවකි. උන්වහන්සේලා විසින් උපදවනලද ත්‍රිවිද්‍යා අෂ්ට විද්‍යාවන්හි අන්තර්ගතවේ.

**ආර්‍ය විද්‍යා නම් අනිත්‍ය, දුඃඛ, අනාත්ම, මාර්ග, ඵල, විද්‍යායි.** ආර්‍යසත්‍ය ඥානයයිද කිවමනා වේ. ඒ වනාහි බුද්ධොත්පාද කාලයකම ඉපදවිය යුතුවේ. අබුද්ධොත්පාදකාලයෙහිවනාහි පසේ බුදුවරයන්වහන්සේලා හැර සෙසු දෙව් මිනිස් ආදි කිසිවකුටත් ඉපදවීමට අවකාශයක් නැත්තේය. එහෙයින් දැන් මේ පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි පවත්නා බුද්ධොත්පාද කාලයම ඒ ආර්‍යවිද්‍යාවට ක්ෂෙත්‍රය බව දතයුතු. ආර්‍යවිද්‍යාමාර්ගයෙහි ගමන්කොට කෙළතැන් පැමිණීම පිණිස උත්සාහවත්වූ පුද්ගලතෙමේම බුදුන් දක්කෙක්ය බුද්ධශාසනය සම්මුඛවූවෙක්යයි කියයුතුවේ. එහෙයින් වදාරන ලදී. ඉතිවුත්තක පාලියෙහි "ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු නපස්සති ධම්මං අපස්සන්තො මං නපස්සති ධම්මං හි සො භික්ඛවෙ භික්ඛු පස්සති ධම්මං පස්සන්තො මං පස්සති" යී" හි, ඒ මා සිවුරු කොණින්ගෙන පියෙන්පිය පසුපස්සේ ලුහුබැඳ ආවත් මට දුරින්ම දුරුවූවෙක්ය යන වචනය එසේමය; භික්ඛවෙ, මහණෙනි; සොභික්ඛු, ඒ මාසිවුරු කොණින් ගෙන පියෙන් පිය පසුපස්සේ ලුහුබැඳ ආවත් මට දුරින්ම දුරුවූවෙක්යයි කී මහණතෙම; ධම්මං, චතුස්සත්‍යධර්මය; න පස්සති, නොදකී; ධම්මං, චතුස්සත්‍යධර්මය; අපස්සන්තො, නොදක්නේ; මං, මා; නපස්සති, නොදකී; හි, ඒමටයොදුන් සියයකින් දුරුව වාසයකරන්නේවී නමුත් සමීපවූවෙක්ය යන වචනය එසේමය; භික්ඛවෙ, මහණෙනි; සොභික්ඛු, ඒමට යොදුන්සියයකින් දුරුව වාසය කරන්නේවී නමුත් සමීපවූ වෙක්යයි කී මහණතෙම; ධම්මං, චතුස්සත්‍යධර්මය; පස්සති, දකී; ධම්මං, චතුස්සත්‍යධර්මය; පස්සන්තො, දක්නේ; මං, මා; පස්සති, දකී; මේ අර්ථයි. බුදුන් නොදක්කෙක් නම් ශාසනය සම්මුඛ නොවූවෙක් නම් සංඝයා දක්කෙක්යයිද කිව නොහැක්කේමය.

මේ පවත්නා බුද්ධශාසනයෙහි යම්කෙනෙක් මේ ආර්‍යවිද්‍යාව මස්තකප්‍රාප්තකරනු කැමැත්තේවීනම් හෙතෙම කෙතෙක් අඞ්ගයකින් සමන්විතවිය යුත්තේද? යත්හොත්, 1. බුදුන් කෙරෙහි නිශ්චලවූ ශ්‍රද්ධාභක්තිය, 2. නීරොගීභාවය 3. ඇද නැති පිරිසිදු අදහස් ඇති බවය, 4. දෘඪතරවීර්‍යය, 5. නාම රූපස්කන්ධයන්ගේ උත්පාදභඞ්ගලක්ෂණවිනිවිද පෙනෙන ඥාණය යන පඤ්චාඞ්ගයෙන් සමන්විත විය යුත්තේය, එහෙයින් වදාරනලදී. අඞ්ගුත්තර නිකායාදියෙහි "සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං අප්පාබාධො හොති අප්පාතඞ්කො සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො නාති සීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය අසඨො

හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරිවා
විඤ්ඤූසුවා සබ්‍රහ්මචාරීසු ආරද්ධවීරියො විහරති අකුසලා
නං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාම
වා දළ්හ පරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු
පඤ්ඤවාහොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො
අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා" සී: අඞ්:-
සද්ධොහොති, බලවත්තර ශ්‍රද්ධාවෙන් සමන්විතවෙයි. තථාග
තස්ස, තථාගතයන්වහන්සේගේ; බොධිං, (සොළොස් ආකාර
යකින් චතුස්සත්‍යාවබොධයකළාවූ) ස්වයම්භූඥානය, සද්දහති,
අදහයි; අප්පාබාධොහොති, ආබාධරහිතවෙයි; අප්පාතඞ්කො
හොති, රොගරහිතවෙයි; නාතිසීතාය, ඉතා සිහිල්නොවූ;
නාච්චුණ්හාය, ඉතාඋණුසුම්නොවූ; මජ්ඣිමාය, හැමකල්හිම
මධ්‍යස්ථවූ; පධානක්ඛමාය, අතරනොනවත්වා අනත්මයදක්
වා කර්මස්ථාන භාවනා වීර්‍ය්‍යය ඉසිලිහැක්කාවූ; සමවෙපාකි
නියා, වැළඳූතාක් ආහාරපානවගී සමව පැසවීමට සමර්ථවූ,
ගහණියා, ජඨරාග්නියෙන්; සමන්නාගතොහොති, සමන්විත
වෙයි; අසඨොහොති, ශඨභාවයෙන් තොරවෙයි; අමායාවී
හොති, මායාවෙන්තොරවෙයි; සත්ථරිවා, ශාස්තෘන්වහන්සේ
කෙරෙහිද; විඤ්ඤූසු, තමාට වඩා ධර්මවිනයෙහි විශෙෂ දැනී
මක් ඇති; සබ්‍රහ්මචාරීසුවා, සබ්‍රම්සරුන්කෙරෙහිද; අත්තා
නං, තමා; යථාභූතං, තත්වූපරිද්දෙන්; ආවිකත්තා, ප්‍රකාශ
කරන්නෙක්; හොති, වෙයි; අකුසලානං, ලාමකවූ; ධම්මානං,
පාපධර්මයන්ගේ; පහානාය, ප්‍රහාණය පිණිස; කුසලානං, සුප
රිශුද්ධවූ; ධම්මානං, කුසලධර්මයන්ගේ; උපසම්පදාය, සම්පා
දනය පිණිස; ආරද්ධවීරියො, ආරබ්ධවීර්‍ය්‍යඇත්තේ; විහරති,
වාසය කරයි; ථාමවා, බලවත් කායිකචෛතසික වීර්‍ය්‍යඇත්
තේවෙයි; දළ්හපරක්කමො, දෘඪතර පරාක්‍රම ඇත්තේවෙයි;
කුසලෙසුධම්මෙසු, චාතුර්භූමික කුශලධර්මයන්හි; අනික්ඛිත්ත
ධුරො, නොබහාතබනලද වීර්‍ය්‍යඇත්තේවෙයි; පඤ්ඤවාහොති,
පැනවත්වෙයි; උදයත්ථ ගාමිනියා, අධ්‍යාත්මබාහ්‍ය ස්කන්ධවූ
නාම රූප ධර්මයන් ක්ෂණයෙක් ක්ෂණයෙක්හි පහළවන ආකා
රය සහ ක්ෂණයෙක් ක්ෂණයෙක්හි නිරුද්ධවී යන ආකාරයත්
ශීඝ්‍රවගොස් අසුකර ගැනීමෙහි සමර්ථවූ; අරියාය සාමාන්‍ය
පෘථග්ජන දිව්‍යමනුෂ්‍යයන්ට තරම්නොවැ අතිප්‍රණීතවූ;
නිබ්බෙධිකාය, ඝන ශෛලමය පර්වතකූටපර්වත ශිඛරයන් සිඳ
බිඳ හෙළමින් සුණුවිසුණු කිරීමෙහි සමර්ථවූ ශක්‍රයාගේ වජ්‍රා
වුධයමෙන් නාමස්කන්ධ රූපස්කන්ධයන් සිඳ බිඳ හෙළමින්
සුණු විසුණු කිරීමෙහි සමර්ථවූ; සම්මා, මනාකොට; දුක්ඛ

ක්ෂය ගාමිනීයා, සියලු සසරදුක්ගෙවා නිර්වාණක්ෂෙම භූමිය කරා පමුණුවන්නාවූ; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; සමන්නාගතො, සමන්විතවෙයි. මේ අර්ථයි.

යමෙක් බලවතර ශ්‍රද්ධාවෙන් සමන්විතවේද තථාගතයන් වහන්සේගේ සොළොස් ආකාරයකින් චතුසත්‍යාවබොධයෙහි සමර්ථවූ සර්වඥඥනය අදහාද විශ්වාස කෙරේද සේයි. හෙතෙම ප්‍රථමාඞ්ගයෙන් සමන්විතවේ.

**මේ පළමුවන අඞ්ගයි.**

---

යමෙක් ආබාධරහිතද රොගරහිතද ඉතා සිහිල්ද නොවූ ඉතා උණුහුම්ද නොවූ හැමකල්හිම මධ්‍යස්ථවූ අතර නොනවත්වා අනත්තිමය දක්වා කර්මස්ථාන භාවනාවීර්‍ය්‍යය ඉසිලිය හැක්කාවූ වැළඳුනාක් ආහාරපානවර්ග සමව පැසවීමෙහි පොහොසත්වූ ජඨරාග්නියෙන් සමන්විතද හෙතෙම ද්විතියාඞ්ගයෙන් සමන්විතවේ.

මේ විපත්තිකාලයෙහි මේ ද්විතියාඞ්ගයෙන් සමන්විතවූ කෙනෙක් සොයාගැනීම ඉතා දුෂ්කරවේ. ඒ එසේමයදන් මනුෂ්‍යයන්ගේ ප්‍රකෘති ජඨරාග්නිය ශීඝ්‍රව දල්වීනගින ශීඝ්‍රව නිවීබසින සුළුහෙයින් පිදුරු තණපත් ගින්නක් හා සදෘශවේ. එසේ ජඨරාග්නිය ශීඝ්‍රවදල්වීනගින ශීඝ්‍රවනිවී බසින සුළුහෙයින්ම මෙකල මනුෂ්‍යයෝ ශීඝ්‍රව ජරාජීර්ණවන්නාහුය ශීඝ්‍රව මිය යන්නාහුය එසේම යහපත් ආහාර පාන වර්ග සොයා අනුභවකරන්නටද යහපත් සෘතුගුණයෙන් යුක්තප්‍රදෙශ සොයා වාසයකරන්නටද ප්‍රමාණයෙන්යුක්තව ව්‍යායාමය කරන්නටද සිදුවී තිබේ.

මේ ජඨරාග්නියේ විෂමත්වය හෙතුකොට ගෙනම මනුෂ්‍යයන්ගේ රූපකායේ මලානික අප්‍රසන්නත්ත්ව අධිකවී තිබේ. රූපකායේ මලානික අප්‍රසන්නත්ත්ව අධිකවීමෙන් නාමකායවූ චිත්තක්ෂණයන්ගේ මලානික අප්‍රසන්නත්ත්වව අධිකවී තිබේ. යට උදුරා දක්වනලද පාළියෙහි එන මධ්‍යම ජඨරාග්නියෙන් යුක්තවූකෙනෙක් නම් යහපත් ආහාරපානවර්ග සොයා අනුභවනොකළේවී නමුත් යහපත් සෘතුගුණයෙන් යුක්ත ප්‍රදෙශවලවාසයට නොපැමිණියේවීනමුත්. ලදදෙයකින් යැපිය හැක්කේමය. පටන් ගන්නාලද වීර්‍ය්‍යයද අතර නොනවත්වාඅනත්තිමය දක්වාගෙනයාහැක්කේමය. ඒ එසේය මධ්‍යම ජඨරාග්නිය ශරීරයෙහි අපහසුගති මලානගති ඇතිවීමට ප්‍රත්‍යයවන පරිද්දෙන් ධාතූන්ගේ කැළඹීමක් බරගතියක්

ඇති නොකොට කනබොනලද ආහාරපාන වර්ග සියල්ලක් සමව පැසවා සැමකල්හිම ස්කන්ධකාය ප්‍රසන්නාකාරයෙන් යාපනයට පමුණුවමින් ආරක්ෂාකිරීමෙහි පොහොසත්වූ ධාතු ගිනි විශෙෂයකි. සම්පත්තිකාලවල නම් හැම සත්ත්වයන්ටම සාධාරණවශයෙන් ඇතිවේ. නුමුත් මේ විපත්තිකාලයෙහි මහ පිනැති උත්තමයන්ට පමණක් ඇතිවන්නේය. මඳ පිනැතියන්ට වනාහි "රසායන භෛෂද්‍ය"යන්ගෙන් ප්‍රතිසංස්කෘත කල්හිම ඇතිවේ. එහෙයින් වදාරනලදි, මහා ක්ෂීණාශ්‍රව **කාත්‍යායන** ස්ථවිරයන්වහන්සේ විසින් නෙත්ති පාළියෙහි:–"සක්කාතෙව ජරාය පතිකම්මං කාතුං"යි. ජරාවට පිළියම්කටහැක්කේමය යනු එහි අර්ථයි. ජරාවෙන් නොදිරනු පිණිස පිළියම් කට හැක්කේයයි වැදෑරීමෙන්ම ව්‍යාධියෙන් නොපෙළෙනු පිණිසද පිළියම්කට හැක්කේය යන අර්ථය එහි වදාරනලද්දේවෙයි.

විශුද්ධිමාර්ගයෙහිද "රසායන භෙසජ්ජංපන සුචිරම්පිකාලං ජීවිතං පවත්තෙතුං සක්කොතියෙව"යි කියන ලදි. අර්ථ:–රසායන භෙසජ්ජංපන, රසායන භෛෂද්‍යයවනාහි; සුචිරම්පිකාලං, ඉතාදීර්ඝකාලයක් මුළුල්ලෙහිද; (අවුරුදු සිය දහස් ගණන් මුළුල්ලෙහියි සේයි.) ජීවිතං, ජීවිතය; පවත්තෙතුං, පවත්වන්නට; සක්කොතියෙව, හැක්කේමය; "රසා අයන්තිවඩ්ඪන්ති එතෙනාතිරසායනං" යනු රසායන ශබ්දයාගේ නිරුක්තියි. අර්ථ:–එතෙන, මේ භෛෂද්‍යයකරණකොටනොහොත් හේතුකොටගෙන; රසා, දිනමාසසංවත්සර ශතසහස්‍රගණන් මුළුල්ලෙහි ජීවනයට උපකාරවූ ලේ මස් ආදිසාර රසධාතූහූ; අයන්ති යි සේයි; වඩ්ඪන්ති, අනුක්‍රමයෙන් වර්ධනයවෙත්; ඉති, එහෙයින්; තං, ඒ ධාතුභෛෂද්‍යය; රසායනං, රසායනනාම්.

පෙරකළ පින් මඳවූවද ඥාණවීර්යදෙකින් යුක්තව රසායන භෛෂද්‍යයෙන් ස්වකීය ස්කන්ධ කාය රූප පෙරළා ප්‍රතිසංස්කරණයෙහි සමර්ථවීනම් සියක් අවුරුදු පරමායුෂය දහසක් දසදහසක් අවුරුදු මුළුල්ලෙහිවුවත් පවත්නාසේ ප්‍රතිසංස්කරණයට පැමිණවිය හැක්කාවූ ආයුවර්ධන ධාතුභෛෂද්‍යයක යනු භාවයි.

"අභිවාදනසීලිස්ස නිච්චං වුඩ්ඪාපචායිනො
චත්තාරොධම්මාවඩ්ඪන්ති ආයුවණ්ණො සුඛං බලං"

යන බුද්ධ භාෂිත ආයුවර්ධන භෛෂද්‍යයද නොකඩව වැළඳි යුතු. සමහර ආචාර්යයෝවනාහි ආයුවර්ධනය පිණිස ප්‍රයත්නය ස්වකීය ජීවිතස්කන්ධයන්හි උපාදනවර්ධනයෙකි.

"කායෙහිද ජීවිතයෙහිද නිරපෙක්‍ෂකව ධර්‍මයෙහි හැසිරිය යුතුයි" වදාළ බුද්ධවචනයටද විරුද්ධයයි ගෙන රූක්‍ෂචීවර පිණ්ඩපාත සෙනාසන ප්‍රත්‍යය සෙවනය ශ්‍රෙෂ්ඨ ප්‍රතිපත්තිකොට ගෙන වීර්‍ය්‍යයකෙරෙත්. එසේ වීර්‍ය්‍යයකරත්මුත් ඔවුන්ගේ ඒ රූක්‍ෂ ප්‍රතිපත්ති උපාදානයන් තදඞ්ගප්‍රහාණවශයෙන් පහකිරීම් මාත්‍රය පිණිස මුත් සමුච්ඡෙදවශයෙන් පහකිරීම පිණිස පවත්නා ප්‍රතිපත්තිම නොවෙත්. වෘක්‍ෂලතාවන් ගෙන් ගහනවූ වන ප්‍රදෙශයක මුල්නූදුරු වනය පමණක් උඩින් කපාදැමීම නැවත වනය එහි තුබූනාටත් වඩා වැවීමට උපකාර වන්නාක්මෙන් ඇතම්විට අනාගත භවයන්හි උපාදානයන්ගේ අධික වර්‍ධනයටද උපකාරවියහැකි ප්‍රතිපත්තියකි.

ඒ උපාදානයන් සමුච්ඡෙද වශයෙන් පහකිරීමට සමත්වූ එකම ප්‍රතිපත්තියනම් තමන්ගේ සහ මෙරමාගේ ප්‍රත්‍යුත්පන්නාඅනාගත ස්කන්ධයන්ගේ අනිත්‍යතාදි ත්‍රිලක්‍ෂණ ප්‍රත්‍යක්‍ෂව දැක වඩනලද විදර්‍ශනා භාවනාවමැයි. එහෙයින් විදර්‍ශනා භාවනා නමැති ආර්‍ය්‍ය විජ්ජාව උපදවා කෙළුතැන් පමුණුවනු කැමැති යොගාවචරයන්ට උපකාරක අඞ්ගයන් හිලා වදාළ නිරොගී භාවයයි කියනලද මේ දෙවෙනි අඞ්ගයෙන් සමන්විතවීම පිණිස උත්සාහ කටයුතුමය.

**මේ දෙවන අඞ්ගයි.**

---

යම්කෙනෙක් ශඨකපට මායාගතිවලින් තොරව ශාස්තෘන් වහන්සේ කෙරෙහිත් තමාට වඩා ධර්‍මවිනයෙහි විශෙෂ දැනීමක් ඇති සබ්‍රම්සරුන් කෙරෙහිත් තමා තත්වූ පරිද්දෙන් ප්‍රකාශකරන්නෙක්වේද හෙතෙම තෘතියාඞ්ගයෙන් සමන්විත වෙයි.

සියසිත් සතන්තුල පවත්නා යහපත් අදහස් යහපත් වාසනා ගුණගතිත් අයහපත් අදහස් අයහපත් වාසනා අගුණ ගතිත් නොසගවා ඇතිසේ ප්‍රකාශකරන්නෙක් වෙයි. නූගතෙක්වැ උගතෙකුකොට ඇගවීම් නොදන්නෙක්ව දන්නෙකුකොට ඇගවීම් ස්වල්පදැනීමක් ඇත්තෙක්ව බොහෝ දැනීම ඇත්තෙකුකොට ඇගවීම් අදක්‍ෂයෙක්වැ දක්‍ෂයෙකුකොට ඇගවීම් ආදි ස්වල්ප මාත්‍රයකුදු ශඨකපට මායාගතියක් නූපදවා ඇදනැති පිරිසිදු සිත්සතන් ඇත්තෙක්ම වියයුතු යනු භාවයි.

**මේ තෙවන අඞ්ගයි.**

---

යම් කෙනෙක් ලාමකවූ පාපධර්මයන්ගේ ප්‍රහාණය පිණිස සුපරිශුද්ධ කුශලධර්මයන්ගේ සම්පාදනය පිණිස නිරන්තරයෙන් වීර්‍ය්‍යකරන්නේවේද බලවත්වූ කායික චෛතසික වීර්‍ය්‍ය ඇත්තේ දෘඪ පරාක්‍රම ඇත්තේවේද චාතුර්භූමික කුශල ධර්මයන්හි නොබහා තබනලද වීර්‍ය්‍යඇත්තේවේද හෙතෙම චතුරාඞ්ගයෙන් සමන්විතවෙයි.

මෙහි සියසතන්හි ඇතිතාක් අවිද්‍යාතෘෂ්ණාදි අකුශලධර්මයන් මේ ප්‍රත්‍යක්ෂ භවයෙහි අද අදම සමුච්ඡෙද ප්‍රහාණවශයෙන් මුලසිඳ පහකිරීමට පොහොසත්වූ කාම මහද්ගතලොකොත්තරසඞ්ඛ්‍යාත චාතුර්භූමික කුශලධර්මයන් ඉපදවීම පිණිස ඇතිකරගතයුතු දෘඪතර කායික චෛතසික වීර්‍ය්‍යයම අභිප්‍රෙතයී.

මේ සතරවන අඞ්ගයි.

---

ඝොර විෂසර්පයකු දෂ්ට කිරීමෙන් විෂමූර්ජිතව ඇස් නොපෙනී ආශ්වාස ප්‍රශ්වාස පවා නිරුද්ධවූ රොගීතෙම ස්වල්පවූ ඖෂධ සෙවනයකින් ආශ්වාස ප්‍රශ්වාස වැටෙන්ට පටන්ගත් පමණින් රොගය කෙරෙහි උපෙක්ෂක වියයුතුනොවේ. ඔබ්මොබ පෙරළිය හැකිවූ පමණිනුත් ඇස් පෙනෙන්ට පටන්ගත් පමණිනුත්රොගය කෙරෙහි උපෙක්ෂකවියයුතු නොවේ. බෙල්ලෙන් උඩ විෂ බැස්ස පමණිනුත් තුනටියෙන් උඩ විෂ බැස්ස පමණිනුත් දනින් උඩ විෂ බැස්ස පමණිනුත් රොගය කෙරෙහි උපෙක්ෂක වියයුතු නොවේ. හුදෙක් සර්පයා දෂ්ටකරනලද වණ මුඛයෙන් සියලුම විෂබැසගිය කල්හිම රොගය කෙරෙහි උපෙක්ෂක වියයුතු වන්නේය. මේ උපමායෙහි රූපාදි වස්තු කාම විෂයෙන් නීවරණ විෂයෙන් විෂ මූර්ජිතව ගිහිගෙයිවසන පුද්ගලයාගේ ශ්‍රමණ ප්‍රව්‍රජ්‍යාවකට හෝ තාපස ප්‍රව්‍රජ්‍යාවකට පැමිණිකාලය රොගියාගේ ස්වල්ප ඖෂධ සෙවනයකින් ආශ්වාස ප්‍රශ්වාස වැටෙන්ට පටන්ගත් අවස්ථාවහා සදෘශවේ * ශ්‍රමණ තාපස ප්‍රව්‍රජ්‍යාවකට පැමිණි පුද්ගලයාගේ ධුතාඞ්ගසමාදානයෙන් කෙලෙස් සතුරන් කම්පාකළ හැකි ප්‍රතිපත්ති පූරනකාලය රොගියාගේ ඔබ්මොබ පෙරළිය හැකි අවස්ථාවහා සදෘශයි. ශීලධුතාඞ්ග ප්‍රතිපත්තීන්හි පිහිටා විදර්ශනාභාවනා ක්‍රමය කියා දිය හැකි ආචාර්‍ය්‍යයකු සෙවනයකොට විදර්ශනාභාවනා ක්‍රමය හොඳින්

---

* ශීලවිශුද්ධිය ඇතිකරගත් පමණින් තෘප්තියට පැමිණිය යුතු නොවේ ජේසි.

කාඩවැසුම් සගිතව උගෙන විවෙකස්ථානයකට පැමිණ විදර්ශනා වැඩීමෙන් ස්වකීය ස්කන්ධකායෙහි නාම කලාප රූපකලාපව්‍යවස්ථා වශයෙන් වැටහීමෙන් නාමධර්මයන්ගේ උත්පාද නිරොධ රූපධර්මයන්ගේ උත්පාද නිරොධ ප්‍රකටවී ආකාලය ඇස් පෙනෙන අවස්ථාව හා සදෘශයි. * විදර්ශනාඥානය නිපුණවූ සොතාපන්නභාවයට පැමිණිකාලය රොගියාගේ බෙල්ලෙන් උඩ විෂ බැස්ස අවස්ථාව හා සදෘශයි.

ශකෘදාගාමි භාවයට පැමිණිකාලය තුනපියෙන් උඩ විෂ බැස්ස අවස්ථාව හා සදෘශයි. අනාගාමිභාවයට පැමිණි කාලය දනින් උඩ විෂ බැස්ස අවස්ථාව හා සදෘශයි. අර්හත්ත්වයට පැමිණිකාලය සර්පයා දෂ්ටකළ වණ මුඛයෙන් සියලු විෂ බැස ගොස් විෂ මූර්ජා රොගය සහමුලින් සංසිඳිගිය අවස්ථාව හා සදෘශයි. මේ උපමාවෙහි රොගාතුරයා විෂමූර්ජාරොගය සර්වප්‍රකාරයෙන් ව්‍යපශමණයට පැමිණෙනතුරු සෙසුකටයුතු සියල්ලක් බැහැරලීමෙන් ඒ විෂමූර්ජා රොග ව්‍යපශමණය පිණිසම වෑයම්කටයුතුවාක්මෙන් එක් දහස් පන්සියයක් (1500) කෙලෙස් නමැති විෂමූර්ජාවන්ගෙන් මූර්ජිතවූ පුද්ගලයා විසින්ද සම්‍යග් සම්බුද්ධ ආර්‍යවිද්‍යාධරයින්වහන්සේ නමක් හා විදර්ශනාප්‍රඥා . මාර්ගප්‍රඥානමැති විද්‍යාමය සාරෞෂධයොගයන් සම්මුඛකරගත් මේ එකම භවයෙහිදීවත් ඒ කෙලෙස්විෂ සර්වප්‍රකාරයෙන් නොසන්සිඳි පවත්නාතාක් අෂ්ටසමාපත්තිලාභිවද දශවිදර්ශනාඥානලාභිවද මාර්ගයකට ඵලයකට පැමිණෙනතුරු නොපසු බස්නා වීර්‍යයෙන් වීර්‍යවත් වියයුතුමැයි සේයි.

## මේ සතරවන අඞ්ගයි.

යම් කෙනෙක් අධ්‍යාත්මික බාහ්‍යස්කන්ධයන්හි නාමරූප ධර්මයන්ගේ ක්ෂණයෙක් ක්ෂණයෙක්හි ඉපද නිරුද්ධවියන අන් දම අසුකර ගැනීමෙහි පොහොසත්වූද සාමාන්‍ය පෘථග්ජන දිව්‍යමනුෂ්‍යයන්ට නොතරම්වැඅති ප්‍රණීතවූද ඝනශෛලමය පර්වතකූට පර්වත ශිඛරයන් සිඳ බිඳ හෙලමින් සුණුවිසුණු කිරීමෙහි සමර්ථ ශක්‍රයාගේ වජ්‍රායුධයමෙන් නාමරූප ස්කන්ධයන් සිඳ බිඳ හෙලමින් සුණු විසුණුකිරීමෙහි පොහොසත්වූ සියලු දුක්ගෙවා නිර්වාණ ක්ෂෙමභූමියට පමුණුවන්නාවූ ප්‍රඥාවෙන් සමන්විතවේද හෙතෙම පඤ්චමාඞ්ගයෙන් සමන්විත වේ. මේ පස්වන අඞ්ගයත්‍රිහෙතුකයන්තුළමුත් අහෙතුක

* මෙකල අරණ්‍යගත වන යොගීහුවනාහි මේ ඇස් පෙනෙන අවස්ථාවට වත් පැමිණ ගත හැක්කෝ නොවෙත්.

ද්විහේතුකයන්තුළ ඇති විය යුතු අඞ්ගයක් නොවේ. එහෙයින් යම්කෙනෙක් මේ පස්වන අඞ්ගයෙන් යුක්තද හෙතෙම ඒකාන්තයෙන් හෙතුකයයි නිශ්චයකට හැකිවේ.

## මේ පස්වන අඞ්ගයි.

මෙසේ යම් පඤ්චාඞ්ගයකින් යුක්ත පුද්ගලයකුට මේ ප්‍රත්‍යක්‍ෂභවයෙහිම ආර්යවිද්‍යාව උපදවා කෙළතැන් පැමිණ විය හැකිබව වදාරණලද්දේද ඒමේ පඤ්චප්‍රධානියඞ්ගවිභාගය සැකෙවින් කියා නිමවිය

‘ප්‍රධාන’යි කියන ලද්දේත් 1. සමම ඉතිරිවූවත් 2. නහරම ඉතිරිවූවත් 3. ඇටම ඉතිරිවූවත් 4. ලේ මස් වියළී ක්‍ෂයවීගියත් අභිමතාර්ථ සිද්ධියට පැමිණෙනතුරු නොපසුබටවන් නෙමිසී ප්‍රාරබ්ධචතුරඞ්ග සමන්වාගත වීර්‍ය්‍යයයි. ඒ වීර්‍ය්‍යයෙන් යුක්ත පුද්ගලතෙම ‘ප්‍රධානීය, නම්. ඒ පුද්ගලයාට සුදුසු පඤ්චාඞ්ගය ‘ප්‍රධානීයඞ්ග’නම්. මෙතෙකින් පඤ්ච ප්‍රධානීයඞ්ගයන් සමග ‘විද්‍යාපඤ්චක’ය සැකෙවින් කියා නිමියේයි.

---

දැන් යථෝක්ත පඤ්චප්‍රභේද විද්‍යාවන් අතුරෙන් ආර්යවිද්‍යාව කෙළතැන් පමුණුවනු කැමති යෝගාවචරයින්ගේ ප්‍රයෝජනය පිණිස අනිත්‍ය දුක්ඛ අනාත්ම දර්ශනසඞ්ඛ්‍යාත විද්‍යාත්‍රය උපදවන ආකාරය සංක්‍ෂෙපයෙන් කියනු ලැබේ.

“චතුමහා භූතිකො අයං කායො ඡප්පසාද මණ්ඩො උතුනං උදයො ආහාරෙහි ඵම්භිතො ජාතිධම්මො ජරාධම්මො මරණධම්මො අනිච්චො දුක්ඛො අනත්තාති, චතුමහා භූතිකොති එත්ථ ඉමෙ චත්තාරො මහාභූතා පඨවී, ආපො, තෙජො, වායො, තත්ථ ථද්ධභාවො මුදුභාවො පඨවී, ආබන්ධනං පග්ඝරණං ආපො, උණ්හභාවො සීතභාවො තෙජො, විත්ථම්භනං සමුදීරණං වායො යනු උද්දේශය සහිත මහාභූත ධාතු නිර්දේශයි.

අර්:-අයං කායො, මේ ස්කන්ධකාය; චතුමහාභූතිකො, සතර මහා භූත ධාතූන් සාරාංශයකොට ඇත්තේය; ඡප්පසාදමණ්ඩො, ෂඩ්විධ ප්‍රසාදරූප නැමති කැඩපතින් සරසනලද්දේය; උතුනං, දශප්‍රභේද සෘතුධාතුවගන්න්ගේ; උදයො, වර්ධනයෙක; ආහාරෙහි, දශප්‍රභේද ධාතුසොහයකින්; ඵම්භිතො; උපස්ථම්භිතය; ජාතිධම්මො, ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි ඉපදීම ස්වභාව කොට ඇත්තේය; ජරාධම්මො, ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි දිරීම ස්වභාවකොට ඇත්තේය; මරණධම්මො, ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි බිඳී අතුරු දන්වීම ස්වභාවකොට

ඇත්තේය; අනිච්චා, අසුරුසැණක් ඇසිපියවරක් පමණද ධරාසිටිය නොහෙන හෙයින් අනිත්‍යය; දුක්ඛා, සුඛයෙන්ද මිශ්‍ර ශුඛ දුඃඛරාශියක; අනත්තා, අභ්‍යන්තරයකොටගත මනාහරයක් නැත්තේය. ඉති(අයං)මේතොමේ; මාතිකා, මාතෘකායි.

චතුමහා භූතිකොති එත්ථ, චතුමහාභූතිකො යන මේ මාතෘකා පදයෙහි–

චත්තාරො මහාභූතා, සතරමහාභූතයෝනම්; පඨවී, පෘථිවීය; ආපො, ආපොය; තෙජො, තෙජොය; වායො, වායොය යන මේ සතරයි. තත්ථ, ඒ සතරමහා භූතයන් අතුරෙන් ථද්ධභාවො, ස්තබ්ධස්වභාවද; මුදුභාවො,මෘදුස්වභාවද; පඨවී, (එකාන්ත පරමාණු) පෘථිවීනම්වේ; ආබන්ධනං, බැඳීම් ස්වභාවද; පග්ඝරණං, වැගිරීම් ස්වභාවද; ආපො, (එකාන්තපරමාණු) ආපොනම්වේ; උණ්හභාවො, උණුසුම් ස්වභාවද; සීතභාවො, සිසිල්ස්වභාවද; තෙජො, (එකාන්තපරමාණු) තෙජොනම්වේ. විත්ථම්භනං, පුම්බවීම් ස්වභාවද; සමුදීරණං සැලීම් ස්වභාවද; වායො, (එකාන්ත පරමාණු) වායොනම්වේ. මේ අළු ව්‍යාඛ්‍යානය පළමුකොට හොඳින් පාඩම්කටයුතු.

## පරමාණු පෘථිවී ධාතු ලක්ෂණ.

අණුරෙණුවකින් ලක්ෂයෙන් පංගුවක පමණද දූවි හරයක් දූවි සටහනක් නැති ශුඛ ස්තබ්ධ ක්‍රියා ලක්ෂණය එකාන්ත පරමාණු පෘථිවියයි කියනලදී. ඉතාපැහැදි ජල සුළං ඉරු රැස් සඳරැස් තරුරැස් මිණිරැස් ගිනිරැස් සහ සුළඟට ගසායන සුගඳ දුගඳ සණ්ඨාබෙර සොරණෑ නළා ශබ්දාදී යත් ස්තබ්ධලක්ෂණ එකාන්ත පරමාණු පෘථිවී ධාතුන්ගෙන් පිරිගිය වස්තුහුය එසේ පිරීගිය වස්තූන් බව සතර මහා භූත ධාතුන්ගේ අවිනිර්භෝගවෘත්තියයි කියනලද ඔවුනොවුන්ගේ වෙන් නොවී පැවැත්මද "එකංමහාභූතං පටිච්ච තයො මහා භූතා තයො මහා භූතෙ පටිච්ච එකො මහාභූතො වෙමහාභූතෙ පටිච්ච වෙමහාභූතා"යි වදාළ ප්‍රස්ථානපාළියද පෘථිවී ධාතුව ආපො තෙජො වායො ධාතුන් පිළිගැනීම කෘත්‍යයකොට ඇත්තියයි ආ අටුවාවචනයද සාධකකොට දතයුතු.

ලක්ෂණ යුක්ති වශයෙන් වනාහි එකාබද්ධව පිහිටි ජල සුළංවල මතු මතු ජල සුළං යට යට ජල සුළඟින් තල්ලුකර ගෙන තිබෙන බව ප්‍රකටය. ඒ තල්ලු කිරීම ආපො ධාතුවට අයත් ක්‍රියාවක් නොවේ. ආපොධාතුවට අයත් ක්‍රියාව

නම් බැඳීම් ක්‍රියාවයි. ඒ තල්ලු කිරීම තේජොධාතුවට අයත් ක්‍රියාවක්ද නොවේ තේජෝ ධාතුවට අයත් ක්‍රියාවනම්යිනොෂණ ක්‍රියාවයි ඒ තල්ලු කිරීම ප්‍රථිවී වායො ධාතුවයට අයත් ක්‍රියාවකි. ඝනබද්ධ විෂ්ටම්භන ක්‍රියාදෙක එකතුවීමෙන් ඒ තල්ලු කිරීම ඇතිවන්නේය එයින් ඝනබද්ධ ක්‍රියාව ඒකාන්ත පරමාර්ථ පෘථිවිධාතුයි විෂ්ටම්භන ක්‍රියාව ඒකාන්ත පරමාර්ථ වායොධාතුයි. විෂ්ටම්භන ක්‍රියා වායො ධාතුහු විසින් ඝනබද්ධ ක්‍රියා පෘථිවිධාතුව නිඃශ්‍රය කරගනු ලැබේ. ඒ එසේමැයි වායො ධාතුව පෘථිවි ධාතුවෙන්තොරව ස්වකීය ශක්තියෙන් ක්‍රියාකළ හැකි ධාතුවක් නොවේ. මෙසේ ඝනබද්ධ ක්‍රියා පෘථිවී ධාතුවෙහිත් විෂ්ටම්භන ක්‍රියා වායො ධාතු වෙහිත් ලක්ෂණ වෙන්වී වැටහෙන පරිද්දෙන් බැලිය යුතු.

ඉතිරි ඉරුරස් සඳරුස් ඝණ්ඨා බෙර සොරණැශබ්ද සුගඳ දුගඳාදී වස්තූන්හි ඒ ඒ වස්තුවෙහි ප්‍රමාණයට වෙන වෙනම ඝනබද්ධ ක්‍රියා පෘථිවී ධාතු ඇතත් ඉතා සියුම්වූ ක්‍රියාමාත්‍ර බැවින් ආගම යුක්ති වශයෙන් මුත් ලක්ෂණ යුක්ති වශයෙන් දැන්විය හැකි නොවේ. මෙසේ මේ ජල සුළං ආදිය උදුරා දක්වන්ට උවමනා කළේ කක්ශ ලක්ෂණ ඝනබද්ධ ක්‍රියාමාත්‍රයම ඒකාන්ත පරමාර්ථ පෘථිවිධාතුව බවත් අනුරේණුවකින් ලක්ෂයෙන් පංගුවක පමණද ද්‍රව්‍යහරයක් ද්‍රව්‍ය සටහනක් එහි නැති බවත් හඟවනු පිණිසයි. ඒ ඝනබද්ධ ක්‍රියා පෘථිවී ධාතුහුගේ උත්කංසගත ඝනබද්ධාකාරය කාරණකොට ගෙන මන්ද ඝනබද්ධාකාරය මෘදුයයි කියනලදි. ශක්‍රයාගේ වජ්‍රායුධ ධාරාවෙහි ඝනබද්ධාකාරය ඝනබද්ධ භාවයෙන් කෙළතැන් පමුණුවා සඳරුස්වල ඝනබද්ධාකාරය මෘදුභාවයෙන් කෙළතැන් පමුණුවා මේ දැතුර ඝනබද්ධ ඝනබද්ධතර ඝනබද්ධතම මෘදු මෘදුතර මෘදු තමාදී නානා අවස්ථාවශයෙන් පවත්නා පෘථිවි ධාතුහුගේ ගති නානත්වය දතයුතු. මේ පෘථිවිධාතු ලක්ෂණය පරමාර්ථ ස්වභාව වශයෙන්මුත් ප්‍රකෘති මනුෂ්‍යයන්ගේ වැටහීමේහැටියට බලා දැක්කහැකි නොවේ.

ඒ එසේමය ප්‍රකෘති මනුෂ්‍යයින්ගේ වැටහීමේ හැටියට බලා සඳරුස්වල ඝනබද්ධලක්ෂණයක් ඝනබද්ධාකාරයක් සොයාගත හැකි නොවේ.

ආබන්ධනලක්ෂණ ආපොධාතුයුෂයෙන් ඒ ඝනබද්ධලක්ෂණ ඝනබද්ධාකාර පෘථිවිධාතු ලක්ෂකොටිගණන් එකට බැඳී අණුරේණුයි සම්මත ද්‍රව්‍ය පිණ්ඩද ඒ අණුරේණු ලක්ෂ කොටිගණන් එකටබැඳී උකුණු මකුණුයි සම්මත ද්‍රව්‍යපිණ්ඩද

ඇතිවී තිබේ. මෙසේ පිළිවෙළින් වැඩි සත්ත්වයන් අතුරෙන් යොදුන් සාරදහස් අටසියක් 4800 උස රාහුඅසුරේන්‍ද්‍රයාදක් වාද බහිඩාසනනාානයෙහි යොදුන් එක්ලක්‍ෂ අටසැටදහසක් 168000 උස මහාමෙරු පර්වතය යොදුන් දෙලක්‍ෂ සතලිස් දහසක් 240000 ඝනකඩ මහා බොල්පොළොව දක්වාද නොයෙක් ආකාර සටහන්වලින් යුක්තව කුඩු මහත් නොයෙක් ද්‍රව්‍යපුඤ්ජ ඇතිවී තිබේ. මෙසේ අණුරේණු උකුණු මකුණු ආදීන්ගේ පටන් සවිඤනක අවිඤනක වශයෙන් ඇතිතාක් ද්‍රව්‍යපුඤ්ජයන්හි ඝනබ්ධව ඝනභාවයට පැමිණීයහැකි ධාතුවනම් මේ පෘථිවිධාතුව මැයි. පෘථිවිධාතුව හැර ඝනබ්ධව ඝනභාවයට පැමිණීයහැකි අන් එකම ධාතුවකුදු නැත්තිය. ආපො තෙජො වායො ධාතුහුද පෘථිවිධාතුවම නිඃශ්‍රය කොට ගෙන ඇතිවන්නාහුය. මෙසේ පෘථිවිධාතුකෘත්‍යය අචින්තනීයමය. අති විශාලමය.

සම්පූර්ණමහාමෙරුපර්වතයෙහි සම්පූර්ණශිලා පෘථිවියෙහි පෘථිවිධාතුලක්‍ෂණය බලනවිටද අණුරේණු පමණකුදු දූවිහරයක් දූවි සටහනක් නැති ශුද්ධ ඝනබ්ධාකාර ලක්‍ෂණයම වෙන්කර බැලියයුතු කැඩපතක දියබඳුනක වැටෙන සෙවනැල්ලක් මෙන් පෙනී වැටහී එනවා ඇත. දිගට කොටට මහතට හෝ කුඩාවට අණුරේණු පමණකුදු දූවිහරයක් දූවිසටහනක් පෙනේනම් වැටහේනම් ඒ සංස්ථාන ප්‍රඥප්තිමිශ්‍රවූ වැටහීමකි වැටහීම සංස්ථානප්‍රඥප්තියෙන් මිශ්‍රවීගියහොත් උදයව්‍යයබලන කල නොවැටහී යන්ට පිළිවන.

මේ ධාතුකර්මස්ථානයෙහි ආයුෂමත් ආනන්දස්ථවිරයන්වහන්සේට ආයුෂමත් පූර්ණස්ථවිරයන්වහන්සේ අවවාදකළ සමයෙහි කැඩපත් සෙවනැලි උපමාවෙන් අවවාදකෙළේය. ඒ කැඩපත් සෙවනැලි උපමාවෙන්ම ආයුෂමත් ආනන්දස්ථවිරයන්වහන්සේ සොවාන්වූයේය.

සම්පූර්ණමහා මෙරුපර්වතයෙහි සම්පූර්ණ ශිලා පෘථිවියෙහි අණුරේණු පමණකුදු දූවිහරයක් දූවිසටහනක් මිශ්‍රවියනොදී එකාන්ත පරමාර්ථ ඝනබ්ධාකාර පෘථිවිධාතුවම මතුකරබැලීමෙහි සමර්ථපුද්ගලයාට ඊට කුඩා සවිඤනක අවිඤනක වස්තූන්හි එකාන්තපරමාර්ථඝනබධාකාර පෘථිවිධාතුව මතුකර බැලීම ඉතා පහසුවන්නේමය වෘක්‍ෂයකින්හෝ පර්වතයකින් ජලතලයක කැඩපතක වැටෙනසෙවනැල්ලක් මහාමෙරු පර්වත ශිලා පෘථිවි පමණට විශාලව පෙනෙන්නේවී නමුත් අණුරේණු පමණ කුදු දූවිහරයක් දූවිසටහනක් නැති හෙයින් අතුරුදන්වීමට අවකාශයක් එළඹ සිටි කල එක අසුරු

සැණක් තුළ සියවරකටත්වඩා අතුරුදන්වියහැකි වාක්මෙන් ඒ මහාමේරු පර්වත ශිලා පෘථිවි පමණටම එහි පැතිර පවත්නා ඝනබද්ධාකාර පරමාණු පෘථිවීක්‍රියාද අණුරේණු පමණ කුඩු හරයක අරටුවක කියා කිසිවක් නැති හෙයින් එක අසුරු සැණක්තුළ සියවරකටත් වඩා අතුරුදන්විය හැක්කේය. ස්වකීය කයෙහි ඒකාන්ත පරමාණු පෘථිවි ලක්ෂණය බලන කල ඥාණයෙන් අසුකර ගතහැකි ප්‍රමාණය දැන අඞ්ගවශයෙන් වෙන වෙනම ගෙන බැලියයුතු. ශීර්ෂාඞ්ගය ගෙන බලන කල ඇතුළත පිටතැයි වෙන්නොකොට එකට විනිවිද පෙනෙනාකාරයෙන්ගෙන බැලියයුතු. පෘථිවි නොවන වර්ණ ධාතූහු විසින් හරස්ව මුවා කළ හැක්කේය. සංස්ථාන ප්‍රඥප්තීන් විසින් හරස්ව මුවාකළ හැක්කේය. ඥාණය සල සලා යවනු. දෙපතුල දක්වා සියලූ අඞ්ගයන්ම ඥාණයෙන් අසුකර ගතහැකි ප්‍රමාණයට පිරිසිඳ පිරිසිඳ බැලියයුතු. අඞ්ගවශයෙන් සියල්ලක් බලා කෙළවරවූ කල ඥාණය හිස්මුදුනෙන් සිට යැවියයුතු දෙපතුල දක්වා විනිවිද යනවා ඇත. දෙපතුල සිටහෝ යැවියයුතු. හිස්මුදුන දක්වා විනිවිද යනවා ඇත. ස්වකීය ස්කන්ධකයෙහි ධාතු චක්ෂුස පහදාගත් පුද්ගලයාට අනන්තකල්ප අනන්තචක්‍රවාලගතසත්වයන්ගේ ස්කන්ධකායයන්හිද ධාතු චක්ෂුස පහසුවෙන් පහදා ගත හැකිවන්නේය. මෙසේ ඒකාන්ත පරමාණු පෘථිවි ධාතු ලක්ෂණය පෙනී ගිය කල ආපො, තෙජෝ, වායො, චක්ඛු, සොත, රූප, ශබ්දාදී ශේෂ අධ්‍යාත්මික බාහ්‍ය ධාතූන්ද අනායාසයෙන්ම පෙනී යනවා ඇත. මේ පරමාණු පෘථිවි ධාතුව ධර්ම චක්ෂුස පහදා ගනු වස් ධාතු එලියෙන් එලියකර බලන ආකාරයි.

## පරමාණු ආපො ධාතු ලක්ෂණ.

ආබන්ධන (බැඳීම්) ක්‍රියාව ඒකාන්ත පරමාණු ආපො ධාතුයි කියනලදි ඒ බැඳීම් ක්‍රියා ලක්ෂණ ඒකාන්ත පරමාණු ධාතුව වර්ධනයවී තෙත්වීමය වැගිරීමයයි කියනලද උත්සන්න ආපො බවට පැමිණෙන්නේය. ඒ ආබන්ධන ක්‍රියා ලක්ෂණ ශුද්ධ ආපොධාතුවෙහිද අණුරේණුවකින් ලක්ෂයෙන් පංගුවක පමණද හරයක අරටුවක කියා දෙයක් නැත්තේය. ශුද්ධ ආබන්ධන ක්‍රියා මාත්‍රයම ඇත්තීයි සේයි. ඒ ශුද්ධ ආබන්ධන ක්‍රියා ආපොධාතු ශූෂයෙන් කලාපකර (පිඬුකර) බඳිනලද්දුව පෘථිවි තෙජො වායො මහාභූත ධාතූහු ඒකකලාපිකව එකකට එකක් නිඃශ්‍රය ශක්තියෙන් උපස්ථම්භක ශක්තියෙන් උපකාරවීමට පොහොසත් වන්නාහුය. ඒ කලාපකොට බඳිමින් ආරක්ෂා කරන ආපො ධාතු ශූෂය නිරුද්ධව අතුරුදන්

වුවහොත් පෘථිවී තෙජො වායො මහා භූත ධාතූහුද බන්ධනයෙන් මිදී එකෙණෙහිම අතුරු දන්වන්නාහුය. මේ එකෙක කලාපස්ථපෘථිවී තෙජො වායො මහා භූතයන්ටතත් තත් කලාපස්ථ ආපො ධාතුවෙන් ලැබෙන උදව් උපකාරයි.

ලොකයෙහි පරමාණු පටන් සත්ව සන්තානයෙහි රාහු අසුරෙන්ද්‍රයා දක්වාත් බහිද්ධා සන්තානයෙහි මහමෙර සක්වල මහා පොළොව දක්වාත් රූප ධාතු පිඩුවෙමින් නොයෙක් අයුරින් කුඩුමහත් සටහන් බවට පැමිණෙන්නේ මේ ආපො ධාතු යූෂයේ උපකාරයෙනි. මේ ආපොධාතුව හැර රූපධාතු පිඩු කරමින් ඝනබද්ධත්වයට පැමිණ වියහැකි අන් එකම ධාතුව කුඩු නැත්තිය. යොදුන් එක්ලක්‍ෂ අටසැට දහසක් 168000 උස මහාමෙරු පර්වතයෙහි අබන්ධනක්‍රියා ආපො ධාතුව දුන් අන්තර්ධානවීනම් සම්පූර්ණ මහාමෙරු පර්වතය දුන් ක්‍ෂණයකින් අන්තර්ධාන වන්නේය. යොදුන් එක්ලක්‍ෂ සූසැට දහසක් 164000 උස චක්‍රවාල පර්වතයෙහි අබන්ධනක්‍රියා ආපො ධාතුව දුන් අන්තර්ධානවීනම් සම්පූර්ණ චක්‍රවාල පර්වතය දුන් ක්‍ෂණයකින් අන්තර්ධාන වන්නේය. යොදුන් දෙලක්‍ෂ සතලිස් දහසක් 240000 ඝන කඩ මහා බොල්පොළොවෙහි අබන්ධනක්‍රියා ආපො ධාතුව දුන් අන්තර්ධානවීනම් සම්පූර්ණ මහා බොල් පොළොව දුන් ක්‍ෂණයකින් අන්තර්ධානව එකම අහස් පියෙසෙක් වන්නේමය. කුමක් හෙයින? යත් ආරක්‍ෂක ආපො ධාතු යූෂය නිරුද්ධව අතුරුදන්වූ කල්හි මහා මේරු පර්වත චක්‍රවාල පර්වත ශෛල පෘථිවි භාවයෙන් එක ඝනව පිහිටි පරමාණු පෘථිවී තෙජො වායො මහාභූතයන් අන්‍යොන්‍යයන්ට උපස්තම්භවීම් අන්‍යොන්‍යයන් නිඃශ්‍රයකර ගැණීම් නැමති සාමාග්‍රිය එකෙණෙහිම ලිහීයන හෙයිනි.

නිර්වාණය හැර අන්‍ය සඞ්ඛතලක්‍ෂණයෙන් යුක්ත පරමාණු ධර්මවූකලි උපස්තම්භයක් නිඃශ්‍රයක් නොලැබ එක අසූරු සැණක් පමණ ජීවත් වන්නෝය කියා නැත්තේය. මහා මෙරු පර්වත චක්‍රවාල පර්වත මහා පෘථිවීන්හි පරමාණු ආපො ධාතු ලක්‍ෂණය බලන කල ස්තබ්ධ ක්‍රියා පෘථිවී ධාතුව සමග මිශ්‍ර වියනොදී ශුද්ධ අබන්ධන ක්‍රියා ආපො ධාතු ලක්‍ෂණයම වෙන්කර බැලියයුතු. වර්ණ ධාතුවෙන් සංස්ථානප්‍රඥප්තියෙන් හරස්ව මුවාකළහැක්කේය. ධර්ම ව්‍යවස්ථායක ඥාණය වර්ණයට සංස්ථාන ප්‍රඥප්තියට මුවාවී ගියහොත් උදයව්‍යය බලනකල නොවැටහී යන්ට පිළිවන. මෙසේ කියනලද පරිද්දෙන් පරමාණු ධාතු ශූනය පහඇගත් කල්හිම අනිත්‍ය

දුඃඛ අනාත්ම සඞ්ඛ්‍යාත ඒකාන්ත ත්‍රිලක්‍ෂණය ප්‍රත්‍යක්‍ෂවන්නේය. පෘථිවි ධාතු නිර්දෙශයෙහි කී පරිද්දෙන් මේ ආපො ධාතු නිර්දෙශයෙහිද පරමාණු ආපො ධාතුලක්‍ෂණය දක්නාක්‍ෂණය පහදා ගත් පුද්ගලයාට මුළු මහාමෙරු පර්වතාදියෙහි කිසි දූවි හරයක් දූවි සටහනක් නැතිව කැඩපතක දිය බඳුනක වැටෙන ඉර සඳ වලාකුල් සෙවනක ආකාරයෙන් ආබන්ධන ක්‍රියා ආපො ධාතු ලක්‍ෂණයම පෙනී වැටහී එනවා ඇත එසේ පෙනී වැටහී අකල දිව්‍යමනුෂ්‍යාදී සත්ව සන්තානයන්හි ආපොලක්‍ෂණය පෙනී වැටහීර්මම පහසුවන්නේය. එහෙත් සත්වසන්තානයෙහි ආපොලක්‍ෂණය වැටහී පෙනී ර්මම මෙහි අභිප්‍රාය කරනලද පෙනීමවේ. මහාමෙරු පර්වතාදියෙහි පටන් උදුරා දක්වන ලද්දේ සත්ව සන්තානයෙහි වැටහීම පහසුවීම පිණිසයි. ස්වකීය සන්තානයෙහි හිස්මුදුන පටන් දෙපතුලදක්වා දෙපතුල පටන් හිස්මුදුන දක්වා පැහැදිලිසේ විනිවිද පෙනී වැටහී අකල්හි පරසන්තානයෙහිද පෙනී වැටහී එනවා ඇත.

මේ ආබන්ධන ක්‍රියා ආපො ධාතුව ධර්ම චක්‍ෂුස පහදා ගනුවස් ධාතු එළියෙන් එළිය කර බලන ආකාරයි.

## පරමාණු තෙජො ධාතු ලක්‍ෂණ.

ශීතොෂ්ණ ක්‍රියාමය ඒකාන්ත පරමාණු තෙජොයි කියනලදී. හෙද සමාන කලාපිකවූ පෘථිවි ආපො වායො මහාභූතයන් මුහුකරවමින් ශක්තිමත් කරනු පිණිස තැවීමයි. ශීත උෂ්ණ තෙජො දෙක්හිම සමාන කලාපිකවූ මහා භූතයන් මුහුකරවා ශක්තිමත් කරවීමෙහි ස්වකීය ස්වකීය ශක්තියෙන් වෙන වෙනම බලසම්පන්න කරවීමෙහි පොහොසත්වූ තැවීම ඇත්තේය. මවු කුසින් කුඩුවට වැටුණු බිජු මවු කිකිළි විසින් නිතර වසමින් උණුසුම් ගන්වන ලදුවම පිළිවෙළින් මුහුකුරා ශක්තිමත්ව එහිතුළ තිබෙන ස්වරස පැටවූ බවට පැමිණ කොෂය බිඳ ගෙන නික්මිය හැකිවන්නේය. ඉදින් මවු කිකිළි විසින් වසා උණුසුම් නොගැන්වූ නම් ඒ බිජු මවු කුසදී වැදගත් උණුසුම අතුරුදන්වීමේදී කුණුවීයන්නාහුය. මේ උපමාවෙහි යම්සේ කිකිළිබිත්තර ස්වරස මවු කිකිළි විසින් වසා උණුසුම් ගන්වන ලදුවම මුහුකුරා ශක්තිමත්ව පැටවූ බවට පැමිණෙන්නාහුද එපරිද්දෙන් සන්ධිබලක්‍ෂණ පෘථිවික්‍රියාද තෙජොපරිවාසිතවම මුහුකුරා ශක්තිමත් වන්නාහුය. ආබන්ධනලක්‍ෂණ ආපොක්‍රියාද තෙජො පරිවාසිතවම මුහුකුරාශක්තිමත් වන්නාහුය. වීසන්තම්භනලක්‍ෂණ වායො ක්‍රියාද තෙජො පරිවාසිතවම

මුහුකුරා ශක්තිමත් වන්නාහුය. තේජොපරිවාසයෙන් තො
රවනම් ශක්තිමත් නොවන්නාහුමය. ලවණ සාගර සීද
න්තා සාගර කල්ප සන්ධාරක ජලද ශීත තේජො ධාතුවගනී
හුගේ වර්ධන විශෙෂයෝමය. ශීත තේජො ධාතුහුගේ අධි
පත්‍යය යටතේ වර්ධනය වෙමින් පවත්නාවස්තූහුය. මහාමෙ
රුපර්වත චක්‍රවාල පර්වත ශිලා පෘථිවි හුද ශීත තේජො ධාතු
හුගේ වර්ධනවිශෙෂයෝමය. පෘථිවී ආදී අන්‍යධාතූන්හා මිශ්‍ර
විය නොදී ශුද්ධ තේජො ධාතුවම බලනකල සිසිල් වස්තුවල
හුදු සිසිල් ක්‍රියා ලක්ෂණද උණුසුම් වස්තුවල හුදු උණුසුම්
ක්‍රියා ලක්ෂණද වෙන්කොටගෙන බැලිය යුතු. වර්ණ සංස්ථා
න ද්‍රව්‍ය ප්‍රඥප්තීන්හා මිශ්‍රවියනොදෙනු.

මේ ශීතොෂ්ණ ලක්ෂණ තේජො ධාතුවෙහි අණුරේණු පම
ණද දූවි සටහන් ආදියක් නැතිබව ප්‍රකටය. එසේ දූවි සට
හන් ආදියක් නැති හෙයින්ම මේ තේජො ධාතු ලක්ෂණය
ඥාණය පහදාගත්කල පැහැදි ජල කැඩපත් ආදියෙහි වැටෙ
න ඉරසද වලාකුල් සෙවනැලි මෙන් ශූන්‍යයෙහිම විශාලව
දූවි සටහන් ආදීන්ගේ වශයෙන් වනාහි කිසිවක් නැතිව
ප්‍රකටවී එනවා ඇත. ස්වකීය ශරීරයෙහි බලනකල ඥාණ
යෙන් අසුකරගත හැකි ප්‍රමාණය දැන අවයව වශයෙන් පිරි
සිඳ පිරිසිඳ බලනු. ස්වකීය ශරීරයෙහි වැටහීම පැහැදුණු
කල්හි අන්‍යශරීරයන්හි වැටහීමද පහසුවෙන් පහදාගත
හැකිවේ. මේ පරමාර්ථ ශීතොෂ්ණ ක්‍රියා තේජො ධාතුව ධර්ම
චක්ෂුස පහදා ගනුවස් ධාතු එලියෙන් එලිය කර බලන
ආකාරයි.

## පරමාර්ථ වායො ධාතුලක්ෂණ.

අග්නිජාලා තුළ අග්නිධාතූහුගේ ආනුභාවයෙන් අග්නිධාතු
වම දියුණු කරනු පිණිස පිඹ රුකුල් දෙන වායො වෙග
ඇතිවීම ධර්මතාවකි ඒ වායොවෙගයෙන් ගිනිදූල්ල උණු
සුම දුම දෙශාන්තරොත්පතනිවශයෙන් ගිනිඅල්ලා ගැනීම හා
ආලොකය යන ආදීන්ගේ වශයෙන් අග්නි ධාතුහුගේ දියුණුව
ඇතිවන්නේය. එපරිද්දෙන් ශීතොෂ්ණ ක්‍රියා සඞ්ඛ්‍යාත තෙ
ජොධාතුවතුළ විද්‍යමාන වෙගය වායො ධාතුවයයි කියනලදී.
ගින්නට ආහාරවියහැකි පිදුරු තණපත් ආදියකට හෙළන
ලද ස්වල්පමාත්‍රා ගිනිපුපුරක් නමුත් ඒ වායොධාතුව ප්‍රත්‍යය
කොටගෙන ඒ පිදුරුතණපත් ආදිය වහා පැතිර ගනිමින් දියු
ණුවන්නේය. ඉදින් ගින්නතුළ වායො ධාතුව දුර්වලව අග්නිය
දියුණුවීගත නොහේනම් විජිනි පතකින් සලානැතහොත්
බටයකින් පිඹ පිපින් සුළඟ ඊට එකතු කරනු ලැබේ. උෂ්ණ

තෙජො ක්‍රියාවෙහි උෂ්ණ වෙගයක්ද ශීත තෙජො ක්‍රියාවෙහි ශීත වෙගයක්ද ඇතිවීම ධර්මතායි. උෂ්ණ ක්‍රියාව අනිකෙකි ශීත ක්‍රියාව අනිකෙකි වෙගය අනිකෙකි. උෂ්ණ ශීත ක්‍රියා නම් පරමාර්ථ තෙජො ධාතුහුයි. වෙගය නම් පරමාර්ථ වායො ධාතුවයි. සමාන කලාපිකවූ පෘථිවි ආපො තෙජො මහා භූතයන්ගේ ශක්තිසීද කිවමනාවේ. ඒ වෙගය වැඩෙන පමණට සමාන කලාපිකවූ මහාභූත කලාපද වැඩෙන්නාහුය. වෙගය අතිශයින් උත්සන්න වීමෙන් අකුණු බවටද පැමිණියහැක්කේය. සුළං කොට්ට මෙට්ටාදියෙහි සුළඟමෙන් ඒ වෙගය රුකුල්දීම තල්ලුකිරීම ස්වභාවකොට ඇති හෙයින් පොත පතේ "**විෂ්ටම්භන ලක්ඛණා වායොධාතු**"යි කියන ලදී. මහාමෙරුපර්වත චක්‍රවාල පර්වත ශිලා පෘථිවින්හිශීතතෙජො ධාතුවට ඒ වායො වෙගයේ බලයෙන් වැඩෙමින් කල්පාන්තය දක්වා ක්ෂණයෙන් ක්ෂණයෙන්හි රූප කලාප උපදවමින් පරම්පරාවගටමින් දියුණුව ගෙනයා හැකිවී තිබේ. පැහැදිලිව පෙනෙනසේ බලනු. හෘදයවස්තුව නිඃශ්‍රයකොට පහළවන එක එක ජවනවාරයකින් සකලශරීරයෙහි චිත්තජරූප කලාප විසුරුවාහරින්නේත් ඒ ඒ ඍතුවෙන් පහළවන ඍතුජරූපකලාප විසුරුවාහරින්නේත් කුක්ෂි ගතවූ ආහාරසෙනහයෙන් පහළවන ආහාරජරූපකලාප විසුරුවාහරින්නේත් කලලඅවස්ථාවෙහි පටන් සත්ත්වයන්ගේ ස්කන්ධශරීරපිළිවෙළින් දියුණුකර හරින්නේත් අඞ්කුර අවස්ථාවෙහි පටන් වෘක්ෂලතා පිළිවෙළින් දියුණුකර හරින්නේත් යථොක්තවායො ධාතුහුගේ රුකුල්දීමෙනි මහමෙර සක්වල මහ පොළොව පටන් සවිඥානක අවිඥානක සියලු වස්තූන්හිම තල්ලුවෙමින් පවත්නා ආකාරය පෙනෙනසේ බලනු. සිය සිරුර හිස් මුදුන පටන් දෙපතුල දක්වා පැහැදිලිව පෙනෙනසේ බලනු. මේ වායො ධාතුවද කියනලද ධාතූන් මෙන් දූවිසටහන් ආදියෙන් තොරව කැඩපතක දිය බඳුනක වැටෙන සෙවනැල්ලක්සේ පෙනී යනවා ඇත. නිතර පෙනෙමින් තිබෙන වර්ණ සංස්ථාන ද්‍රව්‍ය ප්‍රඥප්තීන් හරස්වී මුවාකළ හැක. ඒකාන්තයෙන් නැති ඒ ප්‍රඥප්තීන් ඥාණයෙන් පිඹ හරිනු.

මේ විෂ්ටම්භන ක්‍රියා පරමාර්ථ වායො ධාතුව ධර්ම චක්ෂුස පහදා ගනු වස් ධාතු එළියෙන් එළියකර බලන ආකාරයි.

යථොක්තස්තබ්ධ, ආබන්ධන, ශීතොෂ්ණ, විෂ්ටම්භන යන පරමාර්ථ ක්‍රියා සතර ස්වකීය ස්වකීය ලක්ෂණ වශයෙන් ප්‍රකටයහ. ප්‍රතිෂ්ඨාස්ථාන වශයෙන් විගාහී ස්තබ්ධලක්ෂණපෘථිවි

ක්‍රියාව ප්‍රතිස්ථිතස්ථානයකොටගෙන එකක්මෙන් පිහිටන්නාහුය එකට ඉපද එකට සිට එකටබිඳී අතුරුදන්වන ධාතුහුයි. සතබ්ධලක්‍ෂණ පෘථිවිධාතුව අතුරුදන්වීනම් ඉතිරිධාතුතුනද ප්‍රතිස්ථිතස්ථානය නැතිවීයාමෙන් අතුරුදන් වන්නාහුය. ආබන්ධන ලක්‍ෂණ ආපොධාතුව අතුරුදන්වූකල්හිද බන්ධනයෙන් මිදී එකිනෙකට අනුබල නොලැබ සියල්ලක්ම අතුරුදන් වන්නේය. තවා තීක්ෂ්ණකරන තෙජොධාතුව අතුරුදන්වූ කල්හිද ඉතිරි ධාතුහු බලශූන්ව නටබුන්වන්නාහුය. ඒ එසේමය ශීතොෂ්ණ ලක්‍ෂණ තෙජො ධාතුව විස්තම්භන ලක්‍ෂණ වායො ධාතුවෙන් වැළඳගත් කල්හිම ඇති දැඩිවිය හැකිවේ. වායො ධාතුවෙන් නො වැළඳ ගන්නාලද්දී නම් එකෙණෙහිම බලශූංව නටබුන් වන්නීය. සතබ්ධලක්‍ෂණ පෘථිවි ධාතුවද මුහුකුරා දැඩිවීම පිණිස අනුබලදෙන වායො ධාතුවෙන් නොවැළඳගන්නාලද්දී නම් එකණෙහිම බලශූංව නටබුන්වන්නීය. ආබන්ධන ලක්‍ෂණ ආපොධාතුවද ස්වකීය ලක්‍ෂණය ඇති දැඩිවීම පිණිස අනුබලදෙන වායො ධාතුවෙන් නොවැළඳ ගන්නාලද්දී නම් එකණෙහිම බලශූංව නටබුන්වන්නීය මේ සතබ්ධ ආබන්ධනාදී චතුර්විධාකාර පරමාණු ක්‍රියාවන් එකිනෙක නිඃශ්‍රයකරගන්නා ආකාරයත් එකක් නෂ්ටවූවහොත් සියල්ලම නෂ්ටවීයන ආකාරයත්ය.

මේ චතුර්විධාකාර පරමාණු ක්‍රියාදෙවගිය සවිඥානක අවිඥානක සන්තානයන්හි උත්පත්ති වශයෙන් අචින්තනීය අතිවිශාල අතිවිචිත්‍ර ගති ඇත්තාහුය. එසේම ඔවුන්ගේ සෘද්ධි අනුභාව බලපරාක්‍රමද අචින්තනීයයහ.

මේ ධාතු චතුෂ්කය බුදුන්ගේ දෙශනා නයටඅනුව ප්‍රතිවෙධය පිණිස වෑයම් කරතහොත් ලොකොත්තර ආය්‍යීවිද්‍යාවද විද්‍යා බරසින්ගේ දෙශනානයට අනුව අවබොධය පිණිස වෑයම් කරතහොත් ලෞකික ගන්ධාරි විද්‍යාවද ලෞකිකමවූ මධ්‍යමනයට අනුව අවබොධය පිණිස වෑයම්කරතහොත් භෛෂජ්‍ය ධාතු යන්ත්‍රවිද්‍යාදියද ඉපදවිය හැක්කේය.

මේ මහාභූත ධාතුන්ගේ ප්‍රධාන මූලික නායක ධාතුවනම් තෙජො ධාතුවයි. චක්‍රවාල කල්පසන්ධාරක ජලස්කන්ධයන්ගේ පටන් සවිඥානක අවිඥානක සියලුම ද්‍රව්‍ය පිණ්ඩ තෙජො ධාතුහුගේ වර්ධනයෝමය. මේ තෙජො ධාතුහුගේ සෘද්ධි අනුභාව බලපරාක්‍රමාදි සියල්ලක් සර්වධර්මයන් සර්වාකාරයෙන් අවබොධකළාවූ බුදුන්ගේ ඥානයට මුත් සෙස්සන්ගේ ඥානයට විෂය නොවේමය.

මේ චතුර්මහා භූතිකො–යන ප්‍රථම මාතෘකා පදයේ විස්තරයි.

(ඡළපසාදම්මණ්ඩා) ෂට්විධ ප්‍රසාද නමැති ධාතුකැඩපතින් අතුළත පිටත සරසන ලද්දේය යන ඊනිය මාතෘකා පදයෙහි 'පසාද' යන්නෙන් අභිප්‍රාය කරනලද්දේ කර්මජ මහාභූතයන්ගේ ඔපයයි 'අච්ඡ, මණ්ඩ' ශබ්දවයෙන්ද ඒ ඔපයම වාච්‍යවන බවදතයුතු. එහෙයින් ඡළපසාදමණ්ඩා යන්නට ෂට්විධ ප්‍රසාද නමැති ධාතු කැඩපතිනැයි අර්ථියනලදී. ඒ ධාතු කැඩපත්ද සෘතුජ කර්මජ වශයෙන් දෙවැදෑරුම්යහ. එයින් කන්නාඩි කැඩපත් ආදියෙහි ධාතු ඔපය සෘතුජයි. අධ්‍යාත්ම සන්තාන ගත මහා භූත ධාතුන්ගේ ඔපය කර්මජයි. හෙද චක්ෂු ධාතු කැඩපතය, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය, මනඃ ධාතුකැඩපතය යන මොවුන්ගේ වශයෙන් සවැදෑරුම්වේ. එයින් චක්ෂුඃප්‍රසාද නමැති ධාතු කැඩපත අක්ෂිතාරකා මතුපිට පහළවන්නේය. ශ්‍රොත්‍ර ප්‍රසාද නමැති ධාතු කැඩපත ශ්‍රොත්‍රබිලයතුළද ඝ්‍රාණප්‍රසාද නමැති ධාතුකැඩපත නාසාබිළයතුළද ජිහ්වා ප්‍රසාද නමැති ධාතු කැඩපත දිවමැදද කායප්‍රසාද නමැති ධාතු කැඩපත සකල ශරීරයෙහි ඇතුළත පිටත පැතිරද මනඃ ප්‍රසාද නමැති ධාතුකැඩපත හෘදය කොෂභ්‍යන්තරයෙහිද පහළවන්නේය.

මේ ප්‍රසාද නමැති ධාතුකැඩපත් ෂට්වර්ගය හොඳින් වැටහුණු පුද්ගලයාට මේ ස්කන්ධකාය මොනවට මට සිලුටු විදුරු වැඩක්මෙන් පෙනී යනවා ඇත. මේ ප්‍රසාද ධාතු කැඩපත් ෂට්වර්ගය **අභිධර්මාර්ථ සංග්‍රහයෙහි** ද්වාරයයි කියනලදී.

ඒ ද්වාරද ආකාශද්වාර ප්‍රසාද ද්වාර වශයෙන් දෙවර්ගයක. පුණ්‍යවන්තයන්ගේ ගෘහයන්හි ඒ ද්වාරදෙවර්ගයම තිබේ. ගෘහජනයන්ගේ ඇතුල්වීමට පිටවීමට සහ සුළං ඇතුල් වීමටත් තබන ලද ආකාශ ද්වාර වර්ගයද ගෙට එළිය වැටීමට විදුරු අල්වා තබනලද ප්‍රසාද ද්වාරවර්ගයද යන දෙවර්ගයයි. එයින් විදුරු අල්වන ලද ප්‍රසාද ද්වාරයන්ගේ කෘත්‍යයනම්. ඒ විදුරු අභිමුඛයෙහි දූරසන්නව ඇතිතාක් ඉර සඳ නකත් තරු වලාකුල් පොළෝතල ජලතල අහස්තල ගස් ගල් කඳු වන පව් දාගැප් වෙහෙර විහාරාදී වස්තූන් සිය සටහනින් ඒ විදුරු පුවරුවල පිළිබිඹුකරගැනීමයි, ගෘහ වාසීන්ට ගෘහයෙහිමසිට ඒ ප්‍රසාද ද්වාර යන්හි පිළිබිඹු වන ඉර සඳ ඉරුරැස් සඳරැස් ආදී සියල්ලක් සම්පූර්ණ සටහනින් දක්කහැකිවන්නේය. ගෘහයෙන් පිටසිට ඒ ප්‍රසාද ද්වාරවලින් බලා ගෘහයතුළ තිබෙන ගෘහොපකරණද දක්කහැකි වන්නේය. ඒ ප්‍රසාද ද්වාරයන්හි පිළිබිඹුවන චන්ද්‍ර සූර්ය්‍ය ප්‍රදීපාදීන්ගේ ආලොකයවනාහි ඒ විදුරු

පූවරු සමග සභායත්ත්වයට පැමිණෙන්නේය. මෙසේ කියන ලද නයින් ආකාශ ද්වාර ප්‍රසාද ද්වාර දෙවගීයෙන් යුක්තකොට තනනලද ගෘහයක්මෙන් දිව්‍ය මනුෂ්‍ය හස්ති අශ්ව ගොමහිෂ ශූකර කුක්කුටාදී සත්ත්වයන්ගේ ස්කන්ධකාය යන්හිද ආකාශ ද්වාර ප්‍රසාදද්වාරයයි ද්වාරදෙවගීය බැගින් ඇත්තාහුය. එයින් මුඛද්වාර ශ්‍රිවාද්වාර නාසිකාද්වාර අක්ෂිද්වාරාදී නවද්වාරයෝද නවානූ දහසක් 99000. ලොමකූපද්වාරද ආකාශද්වාර නම්යහ. චක්ෂු ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය මනඃ සඞ්ඛ්‍යාත අධ්‍යාත්මික කර්මජ ධාතු ප්‍රසාද වනාහි විදුරු පූවරු දොරවල් හා සදෘශ හෙයින් ප්‍රසාදද්වාර නම්යහ.

පියසි භිත්ති දොර ජනෙල් ආදී සියල්ලක් වජ්‍රමයවූ මධ්‍යයෙහි දිස්තිමත් කමින් කිසිවකටත් දෙවෙනි නොවන වජ්‍ර ස්තම්භයක් ඇති ගෘහයක් ඇත්තේය. ඒ ගෘහයෙහි මතු ආකාශ තලයෙහි වලාහ පටල චන්ද්‍ර සූර්‍ය්‍ය නක්ෂත්‍ර තාරකාදීන්ගේ රූපහා ආකාශයෙහි පියාසර කරන පක්ෂීන්ගේ රූපත් විදුරු පියස්සෙන් ප්‍රවිෂ්ටව ගෘහ මධ්‍යයෙහි වජ්‍රස්තම්භයෙහි පිළිබිඹු වන්නාහුය. විදුරු පියස්සෙහි චන්ද්‍ර සූර්‍ය්‍යාදීන්ගේ රූප ඡායා එක එක බැගින්ද ගෘහ මධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහි එක එක බැගින්ද එක පැහැරම පහළ වන්නාහුය. පූර්වදිශාවෙන් අභිමුඛවූතාක් වස්තූහු පෙරදිග විදුරු භිත්තියෙහි සහ ගෘහ මධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහිද දක්ෂිණ දිශාවෙන් අභිමුඛවූතාක් වස්තූහු දකුණු දිග විදුරු භිත්තියෙහි සහ ගෘහමධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහිද පශ්චිම දිශාවෙන් අභිමුඛවූතාක් වස්තූහු බස්නාහිර භිත්තියෙහි සහ ගෘහමධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහිද උත්තරදිශාවෙන් අභිමුඛවූතාක් වස්තූහු උතුරු දිග භිත්තියෙහි සහ ගෘහමධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහිද උත්තර දිශාවෙන් අභිමුඛවූතාක් වස්තූහු උතුරු දිග භිත්තියෙහි සහ ගෘහමධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහිද හෙට්ඨිම දිශාවෙන් අභිමුඛවූතාක් වස්තූහු යට විදුරු භූමියෙහි සහ ගෘහ මධ්‍යයෙහි පිහිටි වජ්‍රස්තම්භයෙහිද එක පැහැර දෙක දෙක බැගින් පිළිබිඹු වන්නාහුය. මේ ගෘහයෙහි මෙන් මේ ස්කන්ධ කායෙහිද චක්ෂු ශ්‍රොත්‍ර ආදී කර්මජප්‍රසාදද්වාර ෂට් වර්ගය පිහිටා තිබේ. එයින් මනඃ ප්‍රසාද නමැති ධාතු කැඩපත හෘදය කොෂය තුළ පිහිටා තිබේ. "පභස්සර මිදං භික්ඛවෙ චිත්තං"යි අඞ්ගුත්තර නිකායෙහි වදාළ හෙයින් ඒ මනඃ ප්‍රසාද නැමැති ධාතු කැඩපත හාත්පස ලෙලදිදී බැබැළී

මෙන් යුක්ත ධාතුවකි. භික්ඛවෙ, මහණෙනි! ඉදං චිත්තං, මේ චිත්ත ධාතුව; පභස්සරං, හාත්පස ලෙලදිදී බැබලීමක් ඇත්තේය යනු පාළ්‍යර්ථයි.

සිත අහේතුකවුවද උපන්දා පටන් හමුවූතාක් විඳපූතාක් වස්තු අරමුණු අතුරෙන් යමක් සිහිකරනු කැමැතිව ඊට ඒසිත අභිමුඛ කෙළේ වීනම් එකෙණෙහිම ඒ අරමුණ ඒ සිතේ වැටහී පහළවීඑන්නේය. අහේතුක සිතට වඩා විහේතුක සිත ප්‍රසන්නතරය. විහේතුක සිතට වඩා ත්‍රිහේතුක සිත ප්‍රසන්නතරය. භූමිවශයෙන් මිනිසුන්ගේ ත්‍රිහේතුක සිතට වඩා භූමාටු දෙවියන්ගේ සිත ප්‍රසන්නතරය. භූමාටු දෙවියන්ගේ සිතට වඩා තාවතිංසා දෙවියන්ගේ සිත ඊටත් වඩා යාමදෙවියන්ගේ සිත ඊටත් වඩා තුසිත දෙවියන්ගේ සිත ප්‍රසන්නතරය. මේ නයින් අනුක්‍රමයෙන් භවාග්‍රය දක්වාමනඃ ප්‍රසාදය ප්‍රසන්නවීගොස් තිබෙන ආකාරය දතයුතු.

පුද්ගලයන්ගේ වශයෙන් සාමාන්‍ය පෘථග්ජනයන්ගේ සිතට වඩා ප්‍රකෘති ශ්‍රාවක බෝධිසත්ත්වයන්ගේ සිත ප්‍රසන්නතරය. ඊටත් වඩා මහාශ්‍රාවක බෝධිසත්ත්වයන්ගේ සිත ඊටත් වඩා අග්‍රශ්‍රාවක බෝධිසත්ත්වයන්ගේ සිත ඊටත් වඩා ප්‍රත්‍යෙක බෝධිසත්ත්වයන්ගේ සිත ඊටත් වඩා සර්වඥ බෝධිසත්ත්වයන්ගේ සිත ප්‍රසන්නතරය. සර්වඥතාඥානය ප්‍රතිවෙධ කළ බුදුවරයන්ගේ සිත වනාහි කොටිප්‍රාප්ත ප්‍රසන්නත්වයෙන්යුක්තයි. ඉන් ඉහළට ප්‍රසන්නවීමෙන් වැඩක් නැත්තේය. අනන්ත චක්‍රවාල කල්පසත්ත්ව සංස්කාර ප්‍රඥප්ති සහ නිර්වාණ යන සියලුම ධර්ම සියලු ආකාරයෙන් සර්වඥ මහා මනඃ ප්‍රසාදයෙහිම ආපාතගත වන්නාහුය. මෙසේවූ මනඃ ප්‍රසාදද්වාරය ගෘහ මධ්‍යයෙහි පිහිටි විදුරු ටැඹහා සදෘශයි.

චක්ෂු ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය සඞ්ඛ්‍යාත පඤ්ච ප්‍රසාදයෝ ගෘහයෙහි සතරදිග උඩ යට යන දසදිශාවෙහි පිහිටි විදුරු පුවරු හා සදෘශයහ. ඇසට පෙනෙන වර්ණ සටහන් ආදී වස්තු වර්ග චක්ෂුඃ ප්‍රසාද මනඃ ප්‍රසාද යන දෙදෙරෙහිද කනට ඇසෙන චිත්තජ ඍතුජ ශබ්ද වර්ග ශ්‍රොත්‍ර ප්‍රසාද මනඃ ප්‍රසාද යන දෙදෙරෙහිද නාසයට දැනෙන සුගන්ධ දුගන්ධ වර්ග ඝ්‍රාණ ප්‍රසාද මනඃ ප්‍රසාද යන දෙදෙරෙහිද දිවට දැනෙන රස වර්ග ජිහ්වා ප්‍රසාද මනඃ ප්‍රසාද යන දෙදෙරෙහිද ශරීරයට දැනෙන උණු සිසිල් තද මොලොක් වස්තු අරමුණු වර්ග කාය ප්‍රසාද මනඃ ප්‍රසාද යන දෙදෙරෙහිදවැටී විඥානයට ගොචර වන්නාහුය. අවශිෂ්ට නාමරූප ප්‍රඥප්ති වස්තු අරමුණු වර්ග සියල්ලක් ශුද්ධ මනඃ ප්‍රසාදද්වාරයෙහිම වැටී විඥානයට ගොචර වන්නේය.

ඇසදල්වා සඳමඬලදෙස බැලූකල චක්ෂුඃ ප්‍රසාද ධාතු කැඩපතෙහි එක සඳමඬලකුත් හෘදය කොෂභ්‍යන්තර මනඃ ප්‍රසාද ධාතු කැඩපතෙහි එක සඳමඬලකුත් මෙසේ සඳමඬල් සටහන් දෙකක් පෙරපසුනොව එකවිටම ඒ දෙතන්හි පහළ වෙයි ගැටෙයි පියාසරකර අවුත් ශාඛාවෙහි වසන්නාවූ පක්ෂියාත් ඌහුගේ ජායාවත් පෙරපසුනොව එකවිටම ශාඛාවෙහි ඝට්ටනයට පැමිණෙන්නාක්මෙනි නොහොත් ආදාසතලයක මුහුණ බලනකල බලන තැනැත්තාත් මුඛ නිමිත්තත් පෙරපසුනොව එකවිටම සිනාසීම් ආදී ක්‍රියාපවත්වන්නාක් මෙනි.

නැගෙනහිර දිගින් උදාවන ඉරමඬලේ සටහන ගෘහයෙහි නැගෙනහිර භිත්තියේ විදුරුදොරින් ගෘහම්‍යධ්‍යයෙහි පිහිටි විදුරු ටැඹදක්වා විනිවිදගොස් විදුරු ටැඹෙහි කාන්තිමත්ව බබලනකල නැගෙනහිර දෙසනොබලා ඒ විදුරුටැඹදෙස බලා ඉරමඬල් සටහන දැකියහැක්කාක්මෙන් ඒ සඳමඬල් සටහන චක්ෂුඃප්‍රසාද නමැති කම්ජ විදුරු දොරින් හෘදය කොෂාභ්‍යන්තරයෙහි පිහිටි මනඃ ප්‍රසාද නමැති කම්ජ විදුරු ටැඹ දක්වා විනිවිදගොස් මනඃ ප්‍රසාද නමැති කම්ජ විදුරු ටැඹෙහි කාන්තිමත්ව බබලන්ට පටන්ගනී. අතුරුදන්වීමෙහි වනාහි චක්ෂුඃප්‍රසාදයෙහි සඳමඬල් සටහන අතුරුදන් වීමට පැමිණෙන නමුත්මනඃ ප්‍රසාදයෙහි පිළිබිඹුවූ සඳමඬල් සටහන අතුරුදන්වීමට නොපැමිණේ මේ වෙනස පෙනෙනසේ බැලියයුතු. පැහැදිලිව දැකගතහොත් ප්‍රසාද ධාතු ෂට්වර්ගීය සම්පූර්ණ ධාතුමාත්‍රයක් බව අනායාසයෙන් පෙනී යනවා ඇත. සඳ සටහන් සෙවන චක්ෂුඃ ප්‍රසාද මනඃ ප්‍රසාදවයෙහි ගැටීමද හෙනපහරක්සේ වෙගවත්ය.

මේ නයින් සූර්‍ය්‍යමණ්ඩලය දෙසබැලූකල්හි චක්ෂුඃප්‍රසාදයෙහි සූර්‍ය්‍යමණ්ඩල සටහනකුත් මනඃප්‍රසාදයෙහි සූර්‍ය්‍යමණ්ඩල සටහනකුත් මෙසේ සූර්‍ය්‍යමණ්ඩල සටහන් දෙකක් පෙරපසුනොව එකවිටම පහළවෙයි. ගැටෙයි. වෘක්ෂයක්දෙස බැලූකල්හි චක්ෂුඃප්‍රසාදයෙහි වෘක්ෂසටහනකුත් මනඃප්‍රසාදයෙහි වෘක්ෂසටහනකුත් මෙසේ වෘක්ෂසටහන් දෙකක් පෙරපසුනොව එකවිටම පහළවෙයි ගැටෙයි. මනුෂ්‍යයෙකුදෙස බැලූකල්හි චක්ෂුඃ ප්‍රසාදයෙහි මනුෂ්‍ය සටහනකුත් මනඃ ප්‍රසාදයෙහි මනුෂ්‍ය සටහනකුත් මෙසේ මනුෂ්‍යසටහන් දෙකක් පෙරපසුනොව එකවිටම පහළවෙයි ගැටෙයි.

මෙහිද ගැටීම යටකීනයින් වෙගවත්බව දතයුතු වලාහක පටල එකිනෙක ගැටීමෙහි විදුලි එළිය වැටෙන්නාක්

මෙන්ද වාතසූලි එකිනෙක ගැටීමෙහි උල්කා පහළවන්නාක්මෙන්ද ඝන වස්තු එකිනෙක ගැටීමෙහි හඬනයින්නාක්මෙන්ද ගිනිකටු ගිනිගල් එකිනෙක ගැටීමෙහි ගිනිමල් ගිනිපුපුරු පහළවන්නාක් මෙන්ද සඳමඩල සටහන් ආදී සටහන් සෙවනැලි චක්ෂුඃප්‍රසාදයෙහි ගැටීමේ වෙගවත්කමින් චක්ෂුඃ ප්‍රසාදයෙහි විඤ්ඤාණසිත් පහළවන්නාහුය. ඒ විඤ්ඤාණසිත් චක්ෂුඃවාරයෙහි පහළවන හෙයින් චක්ෂුර්විඥානයයි කියනු ලැබෙත් ඝට්ටන වෙගය සංසිඳිමේදී ඒ විඥානසිත්ද නිරුඬව සංසිඳියන්නාහුය. සඳ සටහන් සෙවන මනඃප්‍රසාදයෙහි ගැටීමෙන් වැලනොකැඩී වීථිසිත් පහළවන්නාහුය. ඝණ්ටාවකට වරක් පහරකල්හි ඒ පහරේ වෙගයෙන් ශබ්දකලාපරාවය බොහෝ වේලාවක් නොසිඳ පවත්නාක් මෙනි. ඒ ඒ ප්‍රහාරවෙග සංසිඳිමේදී ඒ ඒ ශබ්දකලාපරාවයන් සන්සිඳියන්නාක්මෙන් සඳ සටහන් සෙවනැල්ලගේ ඝට්ටන වෙගය සංසිඳිමේදී ඒ ඝට්ටනවෙගයෙන් ජනිත වීථි චිත්ත පරම්පරාදනිරුඬව සංසිඳියන්නාහුය. ඇසට පෙනෙනනාක් සියලු වස්තූන්හිම මේ මෙසේම බව දතයුතු. මේ චක්ෂුඃප්‍රසාද 1 රූපාරම්මණ 1 චක්ෂුර්විඥාන 1 යන ධාතුත්‍රිකයෙහි එක පැහැරම ප්‍රඥාචක්ෂුසින් උත්පාදනිරොධ ලක්ෂණයන් සමග ධාතු ස්වභාවමතුකර බලන ආකාරයි.

මෙහි ජල වාත හෙරි ඝණ්ටා ශබ්ද සමග මනුෂ්‍ය ගොමහිෂ කාක සුනඛාදි සත්ත්වයන්ගේ ශබ්දය ශ්‍රොත්‍රප්‍රසාද නමැති ධාතු විදුරු දෙරෙහිද හෘදය කොෂභ්‍යන්තරයෙහි පිහිටි මනඃප්‍රසාද නමැති ධාතු විදුරු වැඹෙහිද යන දෙතන්හි පෙරපසුනොව එකවිටම පහළ වෙයි ගැටෙයි. ඒ මෙසේ ශබ්දාදී ශබ්ද සටහන් ශ්‍රොත්‍රප්‍රසාදයෙහි ගැටුණුකල විඤ්ඤාණ සිත් පහළ වෙත්. ඒ විඤ්ඤාණ සිත් ශ්‍රොත්‍ර ප්‍රසාදයෙහි පහළවන හෙයින් ශ්‍රොත්‍ර විඥානයයි කියනු ලැබෙත්. ඝට්ටන වෙගය සංසිඳිමේදී ඒ විඤ්ඤාණ සිත්ද නිරුඬව සංසිඳෙන්නාහුය, ඒ ශබ්ද සටහන් මනඃප්‍රසාදයෙහි ඝට්ටනවෙගයෙන් පරම්පරාව වශයෙන් වීථි සිත් පහළවන්නාහුය. ඝට්ටනවෙගය සංසිඳිමේදී පරම්පරා වශයෙන් පහළවන වීථිසිත්ද යට දක්වූ ඝණ්ටාරාවය මෙන් නිරුඬව සංසිඳියන්නාහුය. කනට ශබ්ද ඇසෙන සියලු අවස්ථාවන්හිම මේ මෙසේම බව දතයුතු. මේ ශ්‍රොත්‍ර ප්‍රසාද 1 ශබ්දාරම්මණ 1 ශ්‍රොත්‍රවිඥාන 1 යන ධාතු ත්‍රිකයෙහි එක පැහැරම ප්‍රඥාචක්ෂුසින් උත්පාද නිරොධ ලක්ෂණයන් සමග ධාතු ස්වභාව මතුකර බලන ආකාරයි.

නාසිකාවතුල ඝ්‍රාණප්‍රසාද 1, සුගඳ දුගඳ නමැති ගන්ධාර මමණ 1, ඝ්‍රාණ ප්‍රසාදයෙහි පහළවන ඝ්‍රාණවිඥාන 1 යන ධාතුත්‍රයෙහි සහ ජිහ්වා මධ්‍යයෙහි ජිහ්වා ප්‍රසාද 1, ලොණ ම්බිලාදී රසාරම්මණ 1, ජිහ්වා ප්‍රසාදයෙහි පහළවන ජිහ්වා විඥාන 1 යන ධාතු ත්‍රයෙහිද ප්‍රඥාචක්ෂුසින් එකපැහැර උත්පා ද නිරොධ ලක්ෂණයන් සමග ධාතු ස්වභාව මතුකර බලන ආකාරය චක්ෂුශ්‍රොත්‍ර ධාතුවයෙහි කී නයින් දතයුතු.

කායප්‍රසාද නැමැති ධාතුකැඩපත වනාහි හිස්මුදුන පටන් දෙපතුල දක්වා කය ඇතුළත පිටත ලේ මස් පැතිරසිටි තාක් සියලු තන්හිම පැතිර යමින් පහළවේ. තියුණු ඉඳිකටු මුණතකින් ඇන බැලූකල රෙදුම් දැනෙන සියලු කායප්‍ර දෙශයන්හි කායප්‍රසාද ධාතු කැඩපත පහළවන බව දත යුතු. තදමොලොක්වූ පෘථිවි වශහා උණුසිහිල්වූ තෙජොවශ හා සුබල දුබලවූ වායො වශින් කායප්‍රසාද ධාතු කැඩපතෙහි ඝට්ටණයවන්නාහුය. පතුල ගින්නෙන් උණුසුම් කොට උණුසුමද ජලයෙන් තෙමා සීතලද දැනෙන කල එක උණුසුම් අරමුණු සිහිල් අරමුණු සටහනක් පතුළ පැතිර සිටි කායප්‍රසාද ධාතු කැඩපතෙහිද එකැඋණුසුම් සිහිල් අරමුණු සටහනක් හෘදය කොෂභ්‍යනතර මනඃ ප්‍රසාද ධාතු කැඩ පතෙහිද එකපැහරම පහළවෙයි ගැටෙයි. ඒ ගැටීමද හෙන පහරක්සේ බලවතර වේ. එහෙයින් ඝට්ටණවෙගයෙන් මුළු පතුල සපුරා කායවිඤ්ඤාණ සිත් සහ හෘදය කොෂභ්‍යනතර මනඃ ප්‍රසාද ධාතු විදුරු ටැඹෙහි ගැටීමෙන් උණු සිහිල් අර මුණු සටහන් දැන හැඳිනගන්නා විථි සිත්ද කියනලද නයින් පරම්පරාව නොසිඳී බොහෝ වේලාවක් මුළුල්ලෙහි පහළවන්නාහුය. ඒ උණු සිහිල් අරමුණු සටහන් ගැටීමේ වෙගය සංසිඳීමේදී විඤ්ඤාණසිත් සහ වීථිසිත්ද නිරුද්ධව සංසිඳෙන්නාහුය.

මේනයින් ඇතුළත පිටත සෙසු කයෙහි උණු සිහිල් අරමුණු සෙවනැලි ගැටුණුකල්හිත් සැලීම් රෙදුම් හිරි කොර කැක් කුම් රුජා දැවිලි ආදිය ඇතිවූ කල්හිත් කායවිඤ්ඤාණ සිත් විථිසිත් පහළවන අන්දම දතයුතු.

මේ කියනලද්දේ කායප්‍රසාද 1, ඵොට්ඨබ්බාරම්මණ 1, කාය විඤ්ඤාණ 1 යන ධාතුත්‍රයෙහි ප්‍රඥාචක්ෂුසින් උත්පාද නිරොධ ලක්ෂණයන් සමග ධාතුස්වභාව එකපැහැර මතුකර බලන ආකාරයි.

උල්පත්බිමකින් දිය උනන්නාක් මෙන් හෘදයකොෂභ්‍යාන්තරයෙහි නිතර උපදිමින් පවතින භවාඞ්ගචිත්තය මනඃ ප්‍රසාදයයි කියනලදී. ඒ භවාඞ්ග චිත්තයයි කියනලද මනඃ ප්‍රසාදය අතීත භවයෙහි හමුවූ දෙයක්ම අරමුණුකරන හෙයිනුත් ඒ අරමුණු කිරීම අප්‍රකට හෙයිනුත් මෙනම් දෙයක් අරමුණු කෙළෙම්යි පුද්ගල සන්තානයෙහි ඒ වෙනුවෙන් දැනීමක් ඇතිනොවේ. රාත්‍රියමුළුල්ලෙහි නිද්‍රාවට පැමිණි පුද්ගලයාට ස්වප්නදර්ශනය හැර භවාඞ්ග චිත්තයෙන් දැනීමක කියා අමුත්තක් ඇති නොවේමය. ඒ භවාඞ්ග මනඃප්‍රසාදය නදීස්‍රොතසක් මෙන් නොසිඳීපවත්නා කල දිනපතාම ඒ පුද්ගලයා නිද්‍රාවනමැති එක්තරා සුළු මරණයකින් මිය යන්නෙක්ද වන්නේය. යම් විටක චන්ද්‍ර සූර්‍ය්‍යාදීආලම්බනයක් චක්‍ෂුඃප්‍රසාදාදී පඤ්චප්‍රසාද ද්වාරයන් අතුරෙන් යම්කිසි ද්වාරයකින් ප්‍රවිෂ්ටව යථොක්ත භවාඞ්ග සඞ්ඛ්‍යාත මනඃ ප්‍රසාදයෙහි ඝට්ටණයවේද එවිට ඒ භවාඞ්ග මනඃ ප්‍රසාදය දණ්ඩකින් පහරලත් සර්පයකු ගැඩවිලිපණුවකුමෙන් ඒ මේ අත ඇඹරී සිඳීයයි. එවිට එයින් උල්කා තරු කඩා වැටෙන්නාක්මෙන් ඒ ගැටුණු අරමුණෙහි එල්බගෙන වීථිසිත් පහළවන්ට පටන් ගන්නාහුය. ඒ ඝට්ටණ වෙගය සංසිඳීමේදී උල්කාතරු අතුරුදන් වන්නාක්මෙන් ඒ පහළවූ වීථිසිත්ද අනුක්‍රමයෙන් නිරුද්ධවෙමින් අතුරුදන් වන්නාහුය. යම්කලක දර්ශන, ශ්‍රවණ, ආඝ්‍රාණ, ආස්වාද, ස්පර්ශයන්ගෙන් තොරව ෂඩාලම්බන හුදකලාව මනඃ ප්‍රසාදයෙහිම පහළවන්නාහුද ගැටෙන්නාහුද එකල්හිත් ඒ භවාඞ්ග මනඃ ප්‍රසාදය කියනලද නයින් ඒ මේ අත ඇඹරී සිඳීගොස් ආවර්ජන සිත් ජවන් සිත් පහළව ඒ වස්තු ආරම්මණ දැන හැඳිනගන්නාහුය. පහළවූනාක් උල්කා තරු බිඳී අතුරුදන්වන්නාක් මෙන් ඒ ඝට්ටණවෙගය සංසිඳීමේදී ඒ ආවර්ජන සිත් ජවන් සිත්ද බිඳී අතුරුදන් වන්නාහුය. මේ භවාඞ්ග චිත්තයයි කියනලද මනඃ ප්‍රසාද 1, ධර්මාලම්බන 1, මනොවිඥාන 1 යන ධාතුත්‍රයෙහි ප්‍රඥාචක්‍ෂුසින් උත්පාද නිරොධ ලක්‍ෂණයන් සමග ධාතුස්වභාව එකපැහැර මතුකර බලන ආකාරයි.

**මේ ජප්පසාද මණ්ඩා යන මිතීය මාතෘකා පදයේ විස්තරයි.**

---

"උතුනංඋදයො" මේකාය දශවිධ සෘතු ධාතුවගතීන්ගේ වර්තනයක යනු තුන්වන මාතෘකා පදඑයි. එහි විස්තර මෙසේ දතයුතු. (අරති පවත්තතීතිඋතු) අරතියි සේයි; පවත්තති,

නිතර වර්‍ධනයවෙමින්) පවති; ඉති, එහෙයින්; උතු සෘතුනම්. මේ පොත්වල එන විග්‍රහ වාක්‍යයි. (උදෙති පසවති උදෙනාති පසවනාති එතෙන ඔකාස සත්ත සඞ්ඛාර ලොකාවාති උතු) උදෙතියි සේයි; පසවති, නිතර වර්ධනයවෙමින් පවති; වා නොහොත්; එතෙන, මේ කරණකොටගෙන; ඔකාස සත්ත සඞ්ඛාර ලොකා, අවකාශ සත්ත්ව සංස්කාර යන තෙවැදෑරුම් ලොකයෝ; උදෙනාතියි සේයි; පසවනාති, අනමතාග්‍ර සංසාරය මුළුඳ, වර්ධනය වෙමින් පවතිත්; ඉති, එහෙයින්; උතු, සෘතුන ම්. මේ අප වැටහීම පරිදි කියනලද විග්‍රහවාක්‍යයි; මෙහි සෘතුවයයි අභිප්‍රාය කරණලද්දේ යටකියනලද තෙජෝ ධාතුවයි. අනමතාග්‍ර සංසාරය මුළුඳ කල්ප පරම්පරාව සිඳිය නොදී නිර්මිත කරමින් පිහිටුවා ගෙන එන කත්‍රීෘ මේ තෙජෝ ධාතු වයි, අනන්ත චක්‍රවාල නිර්මිත කරමින් පිහිටුවා ගෙන එන කත්‍රීෘද මේ තෙජෝ ධාතුවමයි. එකෙකි සක්වලක ඒ සක් වල බරසිටි යොදුන් නවලක්‍ෂ සැටදහසක් 960000 ඝන වාපොළොව එහි මතු පිහිටි යොදුන් සාරලක්‍ෂ අසූදහසක් 480000 ඝන ජලපොළොව එහිමතු පිහිටි යොදුන් එක්ලක්‍ෂ විසිදහස 120000 බැගින් ඝනවූ ගල් පොළෝ පස් පොළෝ දෙක එයින් මතු පැනනැගී මෙර සක්වල සත්කුළු හිමවත් පව් සත් මහවිල් සතර මහත් සාගර සපත සීදන්ත සාගර සතර මහත් දිවයින් පන්සියයක් කොදෙව් පෘථිවිතල ජල තල කඳු වන අපායභූමි මනුෂ්‍යභූමි දිව්‍යභූමි අකනිට්ඨ බඹ තලයදක්වා පිළිවෙළින් පිහිටි බඹතල යන සියලුම අවකා ශලොක ද්‍රව්‍යයෝද තෙජෝ ධාතූහුගේ නිමවිලිමය තෙජෝ ධාතූහුගේ කෘත්‍යයෝමය.සපන්නුයෙසීාද්ගමනසූත්‍ර අග්ගඤ්ඤ සූත්‍රයන්හිද එහි අටුවා කථා විශුද්ධිමාර්ගාදියෙහිද විස්තර වශයෙන් කියනලද කල්පය විනාශවන පිහිටන පිළිවෙළ බැලූවහොත් තෙජෝ ධාතු බලය කෙතරම් විශාලදැයි අව බොධ වෙනවා ඇත.

තෙජෝ සංවත්‍ත ආපො සංවත්‍ත වායො සංවත්‍ත සඞ්ඛ්‍යාත ලො කවිනාශක හෙතූන් අතුරෙන් තෙජෝ සංවත්‍තයද උෂ්ණ ධාතු ගතිවිශෙෂයක්මය. ආපො සංවත්‍තයෙහි ජලය ආපො සංවත්‍තයයි අභිප්‍රෙත නොවේ හුදෙක් ඒ ආපොසහජාත ශීතධාතුගති වි ශෙෂයම ආපො සංවත්‍තයයි අභිප්‍රායකරනලදී. එහෙයින්ශීත ධාතුගති විශෙෂයෙන් වන ලොකවිනාශය ආපොසංවත්‍තයයි කියනලදී.වායො සංවත්‍තයෙහිද ඒ වායො සංවත්‍තය නිර්මිත

කොට ඇති කරන කත්‍රෘ උෂ්ණ ධාතුව ගණියමය. එහෙයින් කල්පය විනාශකරමින් නැති කරන්නේත් නිර්මිතකරමින් ඇතිකරන්නේත් තෙජොධාතුහුමයයි දතයුතු.

## මේ තෙජොධාතුහු විසින් අවකාශලොකය නිර්මිතකරන ආකාරයි.

සත්ත්වලොකයෙහිද අතිශයින් සූක්ෂමවූ ඇසට නොපෙනෙන තරම්ක්ෂුද්‍රවූස්කන්ධ කායයන්ගේ පටන් අකනිෂ්ඨක බ්‍රහ්ම ස්කන්ධ කායයන්දක්වා රූපයන් උපදනා පිළිවෙළ බලා මේ තෙජො ධාතුව ගණියගේ ශක්තිය අවබොධ කටයුතු. කෙසේද?යත් හොත් රූපීසත්ත්වයන්ට ප්‍රතිසන්ධි ක්ෂණයෙහි පළමු කොට ඇතිවන රූපකලාප පූර්ව කර්මයෙන් උපදවනු ලැබෙත්. ප්‍රතිසන්ධිහුගේ ස්ථිති ක්ෂණයෙහි පටන් රූප ඉපදවීම් නැගුටුවීම් වර්ධනය කිරීම් කුඩුමහත් කායාවයව ඉදිකිරීම් වනාහි තෙජොධාතුවගණිහුගේ කෘත්‍යයෝයි. කර්මජ චිත්තජ ආහාරජ රූප වනාහි ඒ ධාතුවගණියෙන් නිමවනලද කායාවයවයෝ යම් ආකාරයකින් පිහිටත්ද ඒ අනුව ඒ ආකාරයෙන් පහළවන්නාහුය විලෙහි ජලගැල්ම වැඩිවී යනතාක් පියුම් වනය පඳුරුලා වැඩෙන්නාක් මෙනි.

තිරශ්චීන දිව්‍ය මනුෂ්‍යාදී රූපීසත්ත්වයන්ගේ ආයුඃ කල්ප අඩුවැඩිවීමද මේ ධාතුවගණියගේ බලයෙන්ම වන සිද්ධියකි. ධාතුවගණියගේ සංසිඳීම පිළිවෙළින් අධිකවී යාමෙන්සහ ධාතුවගණියට ස්ථානවූ කරජකායයන්ගේ මෘදුකම පිළිවෙළින් අධිකවී යාමෙන් ආයුඃකල්ප පිළිවෙළින් වැඩීමද ධාතුවගණියගේ නොසංසුංකම පිළිවෙළින් අධිකවී යාමෙන්සහ කරජකායයන්ගේ ඖදාරික භාවය පිළිවෙළින් අධිකවීයාමෙන් ආයුඃකල්ප පිළිවෙළින් අඩුවීයාමද සිදුවී තිබෙනබව දතයුතු.

ගර්භසෙය්‍යක සත්ත්වයන්තුළ ප්‍රතිසන්ධි කාලයෙහි මාතෘ පිතෘන්ගේ නිස්සන්ද වස්තූන්හි මිශ්‍රන සම්බන්ධයෙන් ඇතිවන'සෘතු'යි කියනලද ධාතුගින්න වනාහි මාතෘ පිතෘපාර්ශ්වානු ගතවේ. ගේ වනාහි වෘක්ෂලතාවන්තුළ බීජනියාමරූපය මෙන් සත්ත්වයන්තුළ ජාති නියාම රූපයයි දතයුතු. ඒ ජාතිනියාම රූපයේ බලයෙන් පුත්‍ර දුහිතෘන්ගේ වර්ණසංස්ථානාදීආකාරගති සියල්ලක් මවුපියන්ට බඳුවම ඇතිවන බව දතයුතු.

නාග මනුෂ්‍ය කින්නර මනුෂ්‍යාදීන්ගේ වශයෙන් විජාතික සංසර්ගයෙහි වනාහි කරජරූප ඔජාව බලවත්වූ පාර්ශ්වයකට ජාතිරූපය ඇදගන්නේයයි කිවහැකි.

## මේ තෙජෝධාතුහු විසින් සත්ත්වලෝකය නිර්මිත කරන ආකාරයි.

වෘක්ෂලතාවූ සංස්කාර ලොකද්‍රව්‍යයෝ වනාහි හුදකලාව තෙජෙ ධාතුහුගේම වශීනයෝයි. නන්වැදෑරුම්වූ මූල් අල අකුරු දලු කොළ කඳන් අතු රිකිල් මල් පලරසයන් සමග සියලුම වෘක්ෂලතාවෝ කල්පාන්තය දක්වා ධාත්වග්නියෙන් පරම්පරාව සිදිය නොදී නිර්මිතකරගෙන යනු ලැබෙත්. ඒ ධාත්වග්නියෙන් නිර්මිත කරනලද වෘක්ෂලතා කොළ ගෙඩි මල් පලහා සමකොට ඇදීමෙහි කැපීමෙහි සමර්ථ කාර්මිකයන්ට ලෝවැස්සෝ ප්‍රශංසාකෙරෙත්. සත්ත්වයන්තුළ ජාතිනියාම බලය විද්‍යමානවාක්මෙන් සංස්කාරයන් තුළද බීජනියාම බලය විද්‍යමාන වේ. ඉර සඳ නකත් තරු ග්‍රහතරු ආදී ලොකොපකරණ වර්ග රන් රිදී මුතු මැනික් ආදී රත්න වර්ග යකඩ තඹ පිත්තල රසදිය ආදී ධාතු වර්ග යනමේ සියල් ලෝද ධාතු ගින්නේ වශීනයෝමය.

## මේ තෙජෝ ධාතුහු විසින් සංස්කාරලෝකය නිර්මිත කරන ආකාරයි.

මෙ සෙයින් “උදෙන්ති පසවන්ති එතෙන ඔකාස සන්තාන ධාර ලොකාවාති උතු” යන නිර්වචනය පරිද්දෙන් ලොකත්‍රයාගේ පහළවීමටත් දියුණුවීමටත් කරුණුවීමෙන් රූපය සම්බන්ධවූ ලොකත්‍රය නිමවා නැඟුටුවන හෙයින් ධාතුගින්න සෘතුයයි කියන ලදී. ඒ ධාතු ගින්න අධ්‍යාත්මික බහිර්ධාවශයෙන් දෙවැදෑරුම්වේ. අධ්‍යාත්මික ධාතුගින්නද කර්මජ චිත්තජ සෘතුජ ආහාරජ වශයෙන් සිවුවැදෑරුම්වේ. අවීචිනෙරයික සත්ත්ව ශරීර සංස්ථානයන්ගේ පටන් අකනිෂ්ඨක බ්‍රහ්මශරීර සංස්ථාන දක්වා මේ දෑතුර ශරීරසංස්ථානයන්හි සූක්ෂ්මඖදාරිකභාවයෙන් ඒ තෙජෝධාතුහුගේ අනන්තතාව අචින්ත්‍යනීයතාව දතයුතු.

බහිද්ධා ධාතුගින්න වනාහි ශීතොෂ්ණ වශයෙන් සංක්ෂෙපයෙන් ද්විප්‍රභෙදවේ. ග්‍රීෂ්ම වර්ෂා හෙමන්ත සෘතුන්ගේ වශයෙන් ත්‍රිප්‍රභෙදවේ. ශිශිර වසන්තාදී සෘතුෂට්කයක්කොට ව්‍යවහාර කරනුලබන්නේත් ධාතු ගිනි ෂට්වර්ගයක්මය. මෙෂාදී

රාසිදෙළොසකොට ව්‍යවහාර කරනු ලබන්නේත් ධාතුගිනි දෙළොස් වර්ගයක්මය. නවාංශක එකසිය අටක්කොට ව්‍යවහාර කරනු ලබන්නේත් රවිග්‍රහ ධාතු ගින්න සමග නාක්ෂත්‍ර ග්‍රහ ගිනි මිශ්‍රවීමෙන් සෑදෙන ධාතු ගිනි විශෙෂ එකසිය අට වර්ගයක්මය. රවි චන්ද්‍ර කුජ බුධ ගුරු ශුක්‍ර ශනි රාහු කෙතුයි ග්‍රහයන් නවදෙනකු කොට ව්‍යවහාර කරනුලබන්නේත් ධාතු ගිනි නව වර්ගයක්මය. සංක්ෂෙපයෙන් ජ්‍යොති, වෛද්‍ය, ධාතු, නක්ෂත්‍ර, නිමිත්ත ශාස්ත්‍රාදින්හි එනතාක් සියලු ලෞකික ව්‍යවහාරභෙදයෙන් උගන්වනු ලබන්නේ ධාතුගින්නේ ආකාරභෙදයෝමය. නානාජාතිභෙදයෙන් නානාසූක්ෂ්මෞදාරිකභෙදයෙන් ඒ බහිර්ධා ධාතුගින්නගේ අනන්තභෙදත්වය දතයුතු.

මාතෘකා පදයෙහි කී දශවිධ ධාතුගිනිනම් අධ්‍යාත්මික ධාතුගිනි සතර ශීතඋෂ්ණ දෙකින් වැඩිකළ කල්හි අෂ්ටප්‍රභෙදවේ. බහිර්ධා ධාතුගින්න ශීතඋෂ්ණ භෙදයෙන් විවිධවේ. ඒ දෙකොටස පිඩුකිරීමෙන් ලැබෙන ධාතුගිනි දශයයි. සවිඥානක අවිඥානක වශයෙන් ඇතිතාක් සියලුම රූපවනාහි ධාතුගිනිගුලිමය ධාතුගිනිකැබලිමය. යථොක්ත ශීතොෂ්ණ ක්‍රියා ලක්ෂණ ධාතුගින්නත් නිතර දූල්වීමකි එහෙයින් සවිඥානක අවිඥානක සියලුම රූප ඒ ධාතුගින්නෙන් නිතර දූල්වීනගිමින් වර්ධනය වන ගිනිගුලි ගිනිදූල් රාසක්මය යනුභාවයි. ස්වකීය ශරීරයෙහි මොලගුලි ඇස්ගුලි පටන් දෙපතුළ දක්වා සියලු ශරීරාවයවන්හිම ධාතුලක්ෂණ මතුකර බැලියයුතු. ඒ ඒ ශරීරාවයවයන්හි නලිය නලියා නගින බසින අන්දමින් වැටහෙන ආකාරයක් ඇත. ඒ වැටහීමනම් මූළුශරීරයෙහි පැතිර සිටි ධාතුගින්න ශරීරය පුරව පුරවා අලුත් අලුත් රූපකලාප ඉපදවීමයි. ඉපදවූතාක් පරණ පරණ රූප කලාපද ක්ෂණයෙක් ක්ෂණයෙක්හි දවා අතුරුදහන් කරයි. මෙසේ පරණ පරණ රූපකලාප අතුරුදන්ව අලුත් අලුත් රූපකලාප පහලවී රෑමෙන් ඒ නලියනාකාරය ඇතිවීතිබේ.

අභිනව අභිනව ඉපදීම් සමග පරණ පරණ අතුරුදන්වීම් මිශ්‍රවූ ස්ථානයන්හි වනාහි සිතට සැලෙන්නාක්මෙන් පෙනෙසි වැටහෙයි. නැඟිටීමක්,පාදුභාරයක්, වැටීමක්,යෑමක්,රෑමක් මෙන් පෙනෙසි වැටහෙයි. ධාතුලක්ෂණ අවයව වශයෙන් බෙදී පෙනෙන ඥාණය ඇතිවූකල එබඳු පෙනීම් වැටහීම් දුරුකළ හැකිවේ. ඥාණයද දුර්වලකාලයෙහි ඒ වැටහීමෙන්

නැතිකරදැමිය හැක්කේය. ස්වකීය ස්කන්ධකායෙහි චූර්ණය ඇතුල්කොට ශුද්ධධාතු ස්වභාවම බලමැයි බැලුවත ඒ වැටහීම අවුත් මුවාකලහැකි සමූහ සංස්ථාන සන්තති ප්‍රඥප්තින් විසින්ද හරස්ව මුවා කලහැකි සමූහ සංස්ථාන ප්‍රඥප්තිනම් ද්‍රව්‍ය සංස්ථානයි. චූර්ණය ද්‍රව්‍යයෙන් මුවාවී ගියොත් ඒකාන්ත පරමාර්ථයට බැසනොගනී. නිර්වාණයහැර අන්‍ය පරමාර්ථධර්ම යන්කෙරෙහි ඇසිපියවරක් හෙලන පමණ ජීවත් වියහැකි එකම ධර්මයක්ද ඇත්තේ නැත. සියලු සඞ්ඛත ධර්මයෝම ක්ෂණයෙක් ක්ෂණයෙක්හි ඇතිව නැතිවීයාම ස්වභාවකොට ඇත්තෝය. එසේවූවද පරණ පරණ අතුරු දන්වීම් සමග අභිනව අභිනව ඉපදීම් මිශ්‍රවීමෙන් ඒ පරණ පරණ අතුරු දන්වීම් සමග අලුත් අලුත් ඉපදීම් එක්කොට ගෙන එකක්යයි ලොකයා විසින් වටහා ගෙන එන ප්‍රඥප්තිය සන්තති ප්‍රඥප්ති නම්වේ. මේ සන්තති ප්‍රඥප්තියෙන් චූර්ණය මුවාකල කල්හි එක ධර්මයක්ම එහෙමවීය. මෙහෙමවීය. මෙහි පැමිණියේය. එහි ගියේය. සැලීය. ඉදිරීය. නැගිටීය. යන ආදී වශයෙන් පෙනෙයි වැටහෙයි එහෙයින් ඒ සමූහ සංස්ථාන සන්තති ප්‍රඥප්තීන් ඒකාන්ත පරමාර්ථ ස්වභාවත් වෙන්වී පෙනෙනසේ බෙදා බැලිය යුතු. මේ කියන ලද්දේ නලිය නලියා නගින බසින ආකාරයෙන් වැටහෙන ස්ථානයන්හි ප්‍රඥප්ති හරස්ව චූර්ණය මුවාකරන ආකාරයි.

බුද්ධ ධර්මයෙහි ඍතුනාමයෙන් ව්‍යවහාරවන මේ ධාතුගින්නේ බලපරාක්‍රමය තේජෝ ධාතු නිර්දේශයෙහිද තරමක් දුර කියෙමු. එහිකීආකාරයන් සහ මේ ඍතුනිර්දේශයෙහි සැකෙවින් කීආකාරයන් අනුව පෙනිගිය නුවනැත්තාට ඍතුයි කියනලද මේ ධාතු ගින්නේ අතිවිශාල විචිත්‍රතාවත් කියනලද ලොකත්‍රයට මේ ධාතුගින්නම මූලිකයා බවත් ලොකත්‍රය ධාතුගින්නේ වර්ධනය බවත් ධාතුලක්ෂණයෙන්ම පෙනීයනවා ඇත.

## මේ උතුනං උදයො යන තෘතීය මාතෘකා පදයේ විස්තරයි.

---

“ආහාරෙහිඋපත්ථම්භිතො” මේ කය දශවිධ ධාතුසෙනාභයකින් උපස්තම්භිතය යන සතරවන මාතෘකාපදයේ විස්තරකෙසේ දයත්? හොත්.

ඔජනාමයෙන් සහ ආහාරනාමයෙන් පාල්‍යට්ඨකථාදියෙහි ප්‍රකාශයට පැමිණි ධාතු සෙනාභයක් ඇත. ඒ ධාතු සෙනාභයම “උදයානන්තරං රූපංජනෙතීති ඔජා–ඔජට්ඨමකංරූපං

ආහරතීති ආහාරෙ'' යනු නිරුක්ති හෙයින් ඔජනම් වෙයි. ආහාරනම්වෙයි. උදයානන්තරං, සමත්‍ය උත්පත්තිසමනන්තරයෙහි; රූපංජනෙතීති, රූපඋපදවානුයි; ඔජා, ඔජානම් වේ. ඔජට්ඨමකංරූපංආහරතීති, ඔජාව අටවෙනිකොටඇති අෂ්ටකරූප කලාප එලවානුයි; ආහාරෙ, ආහාරනම්වේ. මේ විග්‍රහාපයි. අධ්‍යාත්මිකබාහ්‍යවශයෙන් ඒ ධාතුස්නෙහය ද්විප්‍රභෙදවේ. අධ්‍යාත්මික ධාතුගිනි අටක් 8 බාහ්‍ය ධාතු ගිනි දෙකක් 2 දැයි මෙසේ ධාතු ගිනි දශයක්ව 10 ඊට ගිතවූ ධාතුස්නෙහද දශ 10 වැදැරුම්වේ. ආහාරජරූප ඉපදවීමත් කාමාවචර සත්ත්වයන්ගේ චතුසමුට්ඨානිකරූප කායට උපස්ථම්භවීමත් ඒ ධාතුස්නෙහයාගේ කෘත්‍යයි. ශරීරයේ "මේදතෙල් චූරුණුතෙල්" දෙවගීය දියුණු කිරීම ආහාරජරූප ඉපදවීම නම්වේ. කාමාවචර සත්ත්වයන්ගේ රූප කය ධාතුස්නෙහයාගේ උපස්ථම්භයෙන් තොරවූ ඇසිපියවරක් පමණ කුඩු ධරසිටියනොහාගේ එසේ ධර සිටිය නොහිම ලොකයෙහි සත්ත්වයන්ගේ ජීවිත වෘත්තිය අන්‍යසියලුම කෘත්‍යයන්ට වඩා විශාල කෘත්‍යය බව පෙනෙන බුද්ධිමතුන්ට අතැඹුලක් සේ පෙනී යනවා ඇත. දිය ගොඩ හැසිරෙන සියලු සත්ත්වයන් විසින්ම තම තමන්ගේ ජීවනකාලයතුල දිවා රෑ මුළුල්ලෙහි ගන්නාඋත්සාහ මහත්සි රාශිය සර්වප්‍රකාරයෙන් පෙනෙන බුද්ධිමතුන්ට දිවි පැවැත්වීම් කෘත්‍යය කෙතරම් විශාලද කියා පෙනීයනවා ඇත. දිවිපැවැත්වීම් කෘත්‍යයාගේ විශාලතාව දක්නාම ආහාරකෘත්‍යය කෙතරම් විශාලද කියා පෙනීයනවාඇත ආහාරකෘත්‍යයාගේ විශාලතාව දක්නාම ධාතුස්නෙහයාගේ උපස්ථම්භන කෘත්‍යය කෙතරම් විශාලද කියා පෙනීයනවා ඇත. ධාතු ස්නෙහ උපස්ථම්භනයාගේ විශාලතාව දක්නාම කාමාවචර සත්ත්වයන්ගේ රූප කයට බහිධා ධාතුස්නෙහ උපස්ථම්භනයෙන් තොරව ඇසිපියවරක් අසූරුසැණක් පමණකුඩු ධරසිටිය නොහෙන ආකාරය අවබොධවේමය. මීට නිදර්ශනයක්නම් සත්ත්වයන්ගේ රූපකයෙහි ස්තබ්ධමෘදුලක්ෂණ පෘථිවිධාතු, ආබන්ධන පග්ඝරණලක්ෂණ ආපොධාතු, ශීතොෂ්ණලක්ෂණ තෙජො ධාතු, විස්තම්භනසමීරණ ලක්ෂණවායොධාතු සඞ්ඛ්‍යාත චතුර්විධ ධාතුරාශිය කැඩපත් ජලතලාදියෙහි වැටෙන ඉර සඳ වලාකුල් මිනිස් සෙවනැලිසටහන්හා සදෘශබව යටකී පරිද්දෙන් ප්‍රථමකොට සිත තබා ගතයුතු. වර්ෂාකාලයෙහි ආකාශයෙහි දේදුන්නකියා ආලොකසටහනක් ඇතිවේ. හේවනාගී සූර්‍ය්‍යයා නැගෙනහිර දෙසවීනම් බස්නාහිර දෙසවලාහ පටලයෙහිද සූර්‍ය්‍යයා බස්

නාභිර දෙස වීනම් නැගෙනහිර දෙස වලාහ පටලයෙහිද දෘශ්‍යමානවේ. සූර්‍ය්‍යයාගෙන්හටගන්නා බැවින් සූර්‍ය්‍යයා මුවාවීගියකල්හිද ඒ දේදුනු සටහන අතුරුදන් වෙයි. වලාහ පටල නිඃශ්‍රයලැබ හටගන්නා බැවින් වලාහපටලය අතුරුදන්වී ගියකල්හිද ඒදේදුනු සටහන අතුරුදන්වෙයි. සූර්‍ය්‍යයාඒ දේදුනු සටහනට නිෂ්පාදකභාවයෙන් උපකාරවෙයි. වලාහ පටලය ඒ දේදුනු සටහනට උපස්තම්භකභාවයෙන් උපකාර වෙයි. යම් යම් තැනක හිරුරැස් අතුරුදන්වීනම් ඒ ඒ තැන දේදුනු සටහන කඩ කඩව අතුරුදන්වෙයි. අව්රැස්සම්පූර්ණයෙන් අතුරුදන්වීනම් දේදුනු සටහන සම්පූර්ණයෙන්අතුරුදන්වෙයි. වලාහපටලයද යම් යම් තැන්වල අතුරුදන්වීනම් ඒ ඒ තැන්වල දේදුනුසටහන කඩ කඩව අතුරුදන් වෙයි. වලාහපටලය තුනීවූ යනතැන්වල දේදුනුසටහනද තුනී වීයයි. අව්රැස් විද්‍යමානවූවද උපස්තම්භකවලාහපටලය නැතිවීනම් ක්‍ෂණයකින් දේදුනුසටහන අතුරුදන් වෙයි. මේ උපමාවෙහි පූර්වකර්මය සූර්‍ය්‍යමණ්ඩලයහා සදෘශයි. සකලශරීරස්ථ කර්මජධාතුගින්න සමග නත් ප්‍රතිබද්ධ චිත්තජ ඍතුජ ආහාරජ ධාතුගිනි තුන්වර්ගය සූර්‍ය්‍යමණ්ඩලයෙන් නික්මෙන රශ්මියහා සදෘශයි. සකල ශරීරස්ථධාතුස්නේහය මුළු අහස්කුස පැතිර සිටි වලාහ පටලය හා සදෘශයි. ශරීරස්ථ මහාභූතධාතුචතුෂ්කය දේදුනු සටහනහා සදෘශයි.

ධාතුස්නේහ රාශිය වලාහපටලය හා "සදෘශය" යන්නෙන් අභිප්‍රාය කරනලද්දේ උපස්තම්භනයාගේ සදෘශත්වයයි. පූර්වකර්මය සහ කර්මජධාතු ගින්නත් ක්‍ෂයවූකල ධාතුස්නේහය විද්‍යමානවූවද ඝනබද්ධකයවූ මහාභූත ධාතු පුඤ්ජය බිඳවැටේමය. කර්මයම විද්‍යමානවූවද ආනාපානයන් නොලැබ බහිද්ධා ධාතුස්නේහය සම්පූර්ණයෙන් වැලකුනහොත් අධ්‍යාත්මික ධාතුස්නේහයද බලබිඳ එකෙණෙහිම ඝනබද්ධකයවූ මහාභූත ධාතුපුඤ්ජය බිඳවැටේමය. මේනයින් දේදුනු සටහන්හි කී සියල්ලක් සමග අනාත්මය දක්වා සසඳා ගතයුතු.

පූර්වකර්මය සහ චතුර්විධ ධාතුවර්ගය සතරමහාභූතධාතු විස්තරයෙහි කී කැඩපත් ජලතල සෙවනැලි උපමාවල ආ ඉර සඳමඬල් මිනිස් සටහන් වලාකුල් සෙවනැලිහා සදෘශයි. ධාතුස්නේහය කැඩපත් ජලතලයන්හා සදෘශයි. ඒ කැඩපත් ජලතලයන්හි පිළිබිඹුවූ ඉර සඳ මඬල් මිනිස් සටහන් වලාකුල් සෙවනැලි හා ඝනබද්ධකයවූ මහාභූත ධාතුපුඤ්ජය සදෘශයි. මෙහිද උපස්තම්භනයාගේ සදෘශත්වයම ගතයුතු.

මෙකී උපමාවලින් සතරමහාභූතයන්ගේ සහ ෂට්ප්‍රසාද ධාතූන්ගේ සමූහයවූ ස්කන්ධකාය බහිඩා ධාතු සෙනහොපස්ත මහයෙන්ම බරු සිටින බවත් ධාතුසෙනහොපස්තම්භයෙන් තොරවීනම් ක්‍ෂණයකින් අතුරුදන්වන බවත් දක්වනලදී.

දූත් උපස්තම්භනාකාරය කියනු ලැබේ. ලොකයෙහි තෙල්වර්ගවනාහි ගින්නට හිතවූ වස්තූහුය. ඇතිතාක් තෙල් වර්ග ගින්නෙන් වැළඳගන්නාලදුවම දියුණුවන්නාහූය, බරු සිටින්නාහූය. පොළොවෙන් හටගන්නා භූමිතෙල් සහ අබතෙල් පොල්තෙල් තලතෙල් සත්ත්වයන්ගෙන් හටගන් නා එළගිතෙල් මේදතෙල වූරුණුතෙල් ආදී සියලුම තෙල් වර්ග අග්නිධාතුව දියුණුකරන්නාහූය. අග්නිධාතුවද තෙලින් වැළඳගත් කල්හිම දියුණුවන්නේය. මේ කියනලද්දේ ප්‍රකට තෙල්වර්ගයි. ඕජාසඞ්ඛ්‍යාත රූපතෛලයවනාහි සියලුම රූප කලාපයන්හි විද්‍යමානයි. සියලුවස්තුවර්ගයන්හිද රූප තෛලය විද්‍යමානයි. දව දඬු තණ පරණැල් රෙදි දූලූන් ආදී ඒ ඒ වස්තුවලට ගිනි අල්වාගත්කල්හි ඒ ඒ වස්තුගත රූප තෛල යම අග්නියට ආහාරවන්නේය. අග්නිය රූප තෛලසොහය ට අනුගතවම දියුණුවීමෙන් ඒ ධාතු සෙනහය සමග තදාධාර රූපයන් දවා භෂ්මකරන්නේය. නුවණැස් යොමා බලනු.

දූල්ල මිනිසෙක් පමණ උස්ව නගින පරිද්දෙන් භූමිතෙල් වත්කොට දල්වනලද මහත් ප්‍රදීපයක් (පහනක්) විනම් එහි ජ්වලාවේ ආයුෂය තෙලේ පිහිටියේ වෙයි. ප්‍රදීපයෙහි තෙල්පිරී පවත්නාතාක් දූල්ලබලවත්වෙයි. තෙල් අඩුවී ගිය කල්හි දූල්ල දුර්වලවෙයි. තෙල් සම්පූර්ණයෙන් ක්‍ෂයවූකල්හි දූල්ල අතුරුදන්වෙයි. මේ උපමාවෙහි ස්කන්ධකායවූ පෘථිවි ආපො වායො ධාතූන් සමග ෂට්විධ ප්‍රසාද ධාතුරාශිය ප්‍රදීපය හා සදෘශයි. සකල ශරීරය පැතිර පවත්නා අධ්‍යාත්මික ධාතු සෙනහ ඒ ප්‍රදීපයෙහි පළමු තුබුණුතෙල් හා සදෘශයි. සකල ශරීරය පැතිර පවත්නා අධ්‍යාත්මික ධාතුගින්න දූල්වීනගින දූල්ලහා සදෘශයි. දිනපතා කන බොනලද ආහාරපාන වර්ග යන්හි තිබෙන ධාතුසෙනහ ප්‍රදීපයට දිනපතා වත් කරන ලද තෙල්හා සදෘශයි.

යට දේදුනු උපමාවෙන් ධාතුසෙනහ උපස්තම්භනයාගේ අතිවිශාලතාවද මේ ප්‍රදීප උපමාවෙන් ධාතුසෙනහයෙන් රූපකලාප උපදවන ආකාරය සමග රූප කායට උපස්තම්භ වන ආකාරයද දක්වනලදී. ඒ එසේමය. කුක්‍ෂියට ඇතුල් කරනුලබනතාක් ආහාරපානවර්ග අෂ්ටක රූපකලාප රාශිහු මය. කලාපයක් කලාපයක්පාසා, සතරමහාභූත ධාතූන්ට

රුකුල්දෙන ධාතුසමූහ විද්‍යමානවේ. එහෙයින් ආහාර නැළියක්වීනම් ඔජසඞ්ඛ්‍යාත ධාතුසමූහද එහි නැළියක් විද්‍යමානයයි කිවහැක්කේය. කනු මුල් දිරා බිදවැටෙන්ට ආසන්නවූ ගෘහයට කනුගසා රුකුල් දෙන්නාක්මෙන් කනබොනතාක් ආහාරපානවර්ගයන්හි පිහිටි ධාතුසමූහද ආමාශයට (ආහාරබොක්කට) පැමිණිතැන් පටන් සකල ශරීරස්ථ අධ්‍යාත්මික රූපයන්ට පරම්පරාව නොසිඳ පැවත්මට රුකුල් දෙන්නාහුය. රුකුල් කනු ඇලගැසුනහොත් ගෘහය ඇලගැසෙන්නාක්මෙන් රුකුල් කනු ඇදවැටුනහොත් සම්පූර්ණ ගෘහය ඇදවැටෙන්නාක් මෙන් කුක්ෂිගත අමු ආහාරවර්ග සත්පැයක් (7) පමණ අලුත් පිට රුකුල් දෙමින් සිට එතැන් පටන් අනුක්‍රමයෙන් දිරාබසින්ට පටන්ගත්කල සකල ශරීරස්ථ අධ්‍යාත්මික සූක්ෂම රූපධාතු සූක්ෂම රූපකලාප ද පිළිවෙළින් බිඳී අතුරුදන්ව සම්පූර්ණ ස්කන්ධකයද ඇලගැසෙන්නේය. ආමාශය අමුආහාරයෙන් සම්පූර්ණයෙන් හිස්වී ගියහොත් ශරීරයතුල සූක්ෂම රූප සූක්ෂම ධාතු සූක්ෂම කලාපද සම්පූර්ණයෙන් අතුරුදන්ව මෘතශරීරයයි කියනලද ඖදාරික ඍතුජ රූපකුඩුවම ශේෂවන්නේය. එහෙයින් සත්ත්වයන් විසින් ආමාශය සම්පූර්ණයෙන් හිස්වන්නට මත්තෙන් දවසකට වරක් හෝ දෙවරක් තුන්වරක් ආහාර ඇතුල් කිරීම නොකඩව කරගෙන යතුලැබේ.

සාමාන්‍ය මනුෂ්‍යයෝ බඩගිනිවී කායබල අඩුවීයයි දනිත්මුත් ආමාශයෙහි ආහාර අඩුවීයාමෙන් ශරීරයෙහි රූපධාතු රූපකලාප, ධාතුකලාප,ධාතු කැබලි,ජීවිතරූප,ජීවිතකලාප, ජීවිතකැබලි පිළිවෙළින් බිඳී අතුරුදන්වීයයි නොදනිත්. යම්සේ දේදුනු උපමාවෙහි ප්‍රතිෂ්ඨාස්ථාන වලාහපටලය බිඳී අතුරුදන්වූකල්හි දේදුනු සටහන බිඳී අතුරුදන්වේද එපරිද්දෙන් ස්කන්ධකයෙහි රූපකලාප රූපධාතුන්ට ප්‍රතිෂ්ඨාස්ථානවූ ආමාශයෙහි ආහාරසමූහ බිඳී අතුරුදන්වූකල්හි සකල ශරීරස්ථ ස්තබ්ධාකාර පෘථිවිධාතුහුද බිඳීඅතුරුදන්වන්නාහුය. ආබන්ධනාකාර ආපොධාතුහුද බිඳී අතුරුදන්වන්නාහුය. ශීතොෂ්ණාකාර තෙජොධාතුහුද බිඳීඅතුරුදන්වන්නාහුය. විස්තම්භනාකාර වායොධාතුහුද බිඳීඅතුරුදන්වන්නාහුය. චක්ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිව්හා, කාය, මනඃ, සඞ්ඛ්‍යාත ප්‍රසාදධාතුහුද ශීර්ෂ හෘදය කුක්ෂි ගර්භයන්හි සූක්ෂමරූප සූක්ෂමධාතු සූක්ෂමකලාපද තුනාවි උකුල් කලවා දනහිස් අතුල් පතුල්වල සූක්ෂමධාතු සූක්ෂමරූප සූක්ෂමකලාපද පෙණ බුබුළුමෙන් චිටි චිටි යන අනුකරණ නොසිස්ව බිඳී අතුරු

දන් වන්නාහුය. එසේ බිඳී අතුරුදන්වන බව ක්ෂණයමෙහෙයා බලතහොත් ප්‍රත්‍යක්ෂවම පෙනී යනවා ඇත. බඩගිනිවී ශක්තිය නැතයයි කියනු ලබන්නේ ශරීරාභ්‍යන්තරයෙහි ශක්තිරූප ශක්තිධාතු ශක්තිකලාප හිමකැවිමෙන් බිඳී අතුරුදන්වෙමින් බැස යාමටයි. එකාබඩගතියගේ අනුක්‍රමයෙන් ගිලිහීයාමනම් අනුක්‍රමයෙන් ආපොධාතුව නිරුඩවෙමින් අතුරුදන්වී යාමයි. ඉතිරි ධාතුන්ගේ නිරොධයද මේනයින් විමසා දතයුතු. මෙසේ රූප ධාතු බිඳී අතුරුදන්වෙමින් බැස යන ආකාරය දතයුතු.

එසේ බැසයාමේදී බැස්ම අධිකවීමට මත්තෙන් ආහාර වර්ග අනුභවකෙරෙත්. අනුභවකොට ඒ ආහාර වර්ග ආමාශයට පැමිණීම සමගම කනුමුල් දිරා ඇදවැටීමට ආසන්නවූ ගෘහය ක්ෂණයකින් රුකුල් කනු ගසනුලැබ නැගසිටින්නාක් මෙන් සතරමහාභූතධාතුඉපද පිරීයාමෙන් ස්කන්ධකාය නැග සිටින්නේය. ක්ෂණයකින් ශක්තිරූප බලරූප ජීවිතරූප ඉපද පිරීයන්නේය. නුවන මෙහෙයා බලත හොත් ප්‍රත්‍යක්ෂවැම පෙනෙන ස්ථානයකි. ශරීරය ඇතුළත පිටත විනිවිද පෙනෙන පරිද්දෙන් බැලූකල තදින් වර්ෂාකොට සතර දිගින් ගලා අවුත් ඇල දොල විල් අමුණු ආදිය ක්ෂණයකින් ජලයෙන් පිරීයන්නාක්මෙන් අභ්‍යන්තර සන්තානයවූ සියලූ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්හි රූපකලාපයන් ශීඝ්‍රව පිරීයන ආකාරය පෙනී යනවා ඇත.

### මේ ධාතුසෙනභයාගේ උපස්තම්භනා කාරණයයි.

ආමාශයයි කියනලද අතුන(බඩවැල)දළ නුහුලින් තුනියට වියනලද වස්ත්‍රයක්හා සදෘශයි. ඒ ආමාශයට යටින් ජඨරාග්නිකටාරමයයි කියනලද ආහාර පැසවන ධාතුවගනි කටාරම පිහිටා තිබේ. මල බඩයක් හෝ බඩේ තදගතියක් ඇතිවූ කල පෙකනියට ආසන්නව උඩින් අතතැබූකල උඩපනින්නාක්මෙන් දැනෙන නහර ස්කන්ධයක් ඇත. ඒ ධාතුවගනි කටාරමැයිදතයුතු එහි ආහාර පැසවන කර්මජ ධාතුගින්න පිහිටා තිබේ. සියලූ ශරීරය උණුසුම් ගන්වා රක්ෂාකරන ප්‍රකෘති කර්මජධාතු ගින්නද ඒ ජඨරාග්නියගේම වර්ධනයකි. ආමාශයට බැසගත් තාක් අමු ආහාර වර්ග කියනලද ධාතු ගිනි කටාරමෙන් නගින ජඨරාග්නියෙන්ම පැසවනු ලබන්නාහුය. වෙඬරු පිණීස එළකිරි මීකිරි ආදී කිරිවර්ග පැසවන්නාක් මෙනි.

ඒ පාචකාග්නියෙන් පැසවනලද ආමාශයටපැමිණි ආහාර වර්ග ඖදාරිකසප, සූක්ෂ්මසප, ඖදාරිකයූෂ, සූක්ෂ්මයූෂයයි සතරකොටසක්ව බෙදී ඔජාමඳ ඖදාරිකසපයූෂ දෙකොටස පහලට බැසගන්නේය. ඔජාධික ස්නේහයූෂකොටස උඩට නැගගන්නේය. මෙසේ ආමාශයට බැසගත් ආහාර වර්ග සූක්ෂ්මෞදාරිකවශයෙන් බෙදීම පිණිස පැසවීම පාචකාග්නිපාකයයි කියනු ලැබේ. ඖදාරික සපකොටස පක්වාශයට බැස මලබවටත් ඖදාරික යූෂ කොටස වස්ති කොශයට බැස මූත්‍රබවටත් පැමිණෙන්නේය. අනුභව කරනලද ආහාර වර්ගයන්හි පිහිටි සියලුම ස්නේහධාතූහු පාචකාග්නි උෂ්මාග්නි වෙගයෙන් උතුරා සත්දහසක් පමණ රස නහරානුසාරයෙන් පැතිරගොස් සකල ශරීරස්ථ තෙජොධාතුවහා එකතුවන්නාහුය. ප්‍රකෘති ගින්නහා එක්ව තෙල්වර්ග උණුවී වර්ධනය වන්නාක්මෙන් ශරීරස්ථ තෙජොධාතුවහා එක්වන ධාතුස්නේහ වර්ගද උණුවී සකල ශරීරයෙහි පැතිර යමින් රූපකලාපවර්ධනය කරන්නේය. විශෙෂයෙන් මේදතෙල් වුරුණුතෙල් දෙවර්ගය වර්ධනය කරන්නේය. ප්‍රකෘතිගින්න තෛලසංයොගයට පැමිණ වර්ධනය වන්නාක්මෙන් ශරීරස්ථ ධාතුගින්නද ධාතුස්නේහ සංයොගයට පැමිණ වර්ධනය වන්නේය. යම්සේ තෛලාධිකවූ වස්තු වර්ග ගින්නෙන් පැසවා තෙල් හිඳ ගැනීමෙදී ගින්න දුර්වල නම් තෙල්මදව සපඅධිකවෙත්ද එපරිද්දෙන් පාචකාග්නියයි කියනලද ජඨරාග්නිය දුර්වලනම් කනබොනලද ආහාර පානවර්ග බොහෝසේ මලමූත්‍ර වාත ශ්ලෙෂ්ම භාවයටම පැමිණෙන්නාහුය. වෛද්‍යශාස්ත්‍රයෙහිරස නාමයෙන් ව්‍යවහාරවන ධාතු ස්නේහභාවයට පැමිණෙන්නේ ඉතා ස්වල්පයකි. පාචකාග්නියදරුණුවූ කල්හිද ධාතුස්නේහ බොහෝසේ දැගොස් ශරීර පොෂණය පිණිස ශෙෂවන්නේ ඉතා ස්වල්පයකි. පාචකාග්නි කටාරම වාතයෙන්හෝ ශ්ලෙෂ්මයෙන් වසාගත්කල්හිද අග්නිය දුර්වලවීමෙන් ආහාර නොදිරා නොයෙක් රොගාබාධ ඇතිවිය හැක. අනුභව කරනලද ආහාර පාන වර්ගයන්හි ඔජාව මඳවීමෙන් පාචකගින්නත් උෂ්මාගින්නත් විෂමව මනුෂ්‍යයන්ට රොගඋපද්‍රව අධිකවීම මරණය ශීඝ්‍රව පැමිණියහැකි බව සහ ලොහ රස දිය ආදී සාර ධාතුස්නේහ වර්ග ඖදාරිකගති අමුගති පහකොට අධ්‍යාත්මික කර්මජාදි සූක්ෂ්ම ධාතුන්හා සංමිශ්‍රනයට යොග්‍යවූ පරිද්දෙන් ප්‍රතිසංස්කරණයට පමුණුවා සාදාගන්නාලද රසායන භෛෂජ්‍යස්නේහ වර්ග අනුභව කරතහොත් ඒ පාචකාග්නි උෂ්මාග්නි දෙවර්ගය සමභාවයට පැමිණ රොග උපද්‍රවයන්ගෙන් මිදී සියක්අවුරුදු පරමායුෂය අවුරුදු දෙසියයකට තුන්

සියයකට සාරසියයකට පන්සියයකට දහසකටද අධිකකොට ප්‍රතිසංස්කරණයට පමුණුවාගතහැකිබවද යට විතිය ප්‍රධානියඞ්ගවිස්තරයෙහි කීයෙමු.

### මේ ආහාරට්ඨිතිකො යන චතුර්ථ මාතෘකා පදයේ විස්තරයයි.

---

(ජාතිධම්මො) මේ කය ක්ෂණයෙක් ක්ෂණයෙක්හි ඉපදීම ස්වභාවකොට ඇත්තේය යන පස්වන මාතෘකාපදයේ විස්තරය කෙසේද? යත්හොත්. යට කැඩපත් දේදුනු උපමාවන්හි කීනයින් ධාත්වග්නි ධාතුස්නේහයන්ගේ ප්‍රතිසංස්කරණයෙන් සතරමහාභූත ධාතූන් නිතර ඉපද නැතිවී යන ආකාරය දිවූපුද්ගලයාට මේ සිරුරෙහි අසූරු සැණක් ඇසිපියවරක් පමණද අලුතෙන් අලුතෙන් මහාභූතයන් නූපදින තැනක්නැති බවද පරණ පරණ මහාභූතයන් නිරුද්ධ නොවන තැනක් නැතිබවද පෙනීයේමය. උදුනේ ගින්නෙන් කකියන දියසැලියක ඇතිවීම් නැතිවීම් ක්‍රියාද්වර්ගයෙන් මිශ්‍රවූ දියබුබුළුරැසමෙන් සකල ශරීරයෙහි ධාත්වග්නි ධාතුස්නේහයන්ගේ බලයෙන් ඇතිවෙමින් නැතිවෙමින් පවත්නා උදයව්‍යය ක්‍රියාද්වර්ගය කදිමට පෙනීයේමය.

කර්ම, චිත්ත, ඍතු, ආහාර සඞ්ඛ්‍යාත චතුර්විධ ප්‍රත්‍යයන් විසින් සකල ශරීරයෙහි ඝනබිම්බාකාර ලක්ෂණ පෘථිවීධාතු නිරන්තරයෙන් ප්‍රාදුර්භූත කරනුලැබෙත්. ඒ පෘථිවීධාතුපරමාණු පමණද දූවි සටහනක් නැති හුදුතද ක්‍රියා මාත්‍රයෝය ඒ ඝනබිම්බ ක්‍රියා ලක්ෂණ පෘථිවීධාතුද ධාත්වග්නි වේගයෙන් ක්ෂණයෙකින්ද අතුරුදන්වන්නාහුය. අසූරු සැණක් පමණද ධරාසිටිය නොහෙන්නාහුය. පෘථිවි ධාතුව නිරුද්ධවී යනකල්හි ඒ පෘථිවි ධාතු නිඃශ්‍රයකොට ඇති ආබන්ධනාකාර ආපො, ශීතොෂ්ණාකාර තෙජො, විස්තම්භනාකාර වායො මහාභූත ධාතූහුද ඒ සමගම අතුරුදන්වන්නාහුය. පෘථිවි ධාතුව නිඃශ්‍රයකොටගෙන පහළවන චක්ෂුශ්‍රොත්‍රාදී ෂඩ්විධ ප්‍රසාද ධාතූහුද නිරුද්ධවන්නාහුය. මුළුසිරුරම විනිවිද පෙනෙනසේ බලනු.

අතුරුදන්වූතාක් ස්ථානද අලුතෙන් අලුතෙන් ඉපදෙන ධාතූන්ගෙන් පිරීයන්නේය. මෙසෙයින් එක්අසූරුසැණක් තුළම අභිනව අභිනව උත්පාද නිරොධයන්ගේ වශයෙන් මේ ශරීරය සියවරකට දහස්වරකටද වඩා පෙරළී අලුත් වන ආකාරයම පෙනෙනසේ, බැලියයුතු ඒ උත්පාද නිරොධ

ඇසට නොව යටකී පරිද්දෙන් මතුකර බැලූකල්හි ඤාණයටම පෙනී යන ස්වභාවයෝයි. සෙලවෙනාකාරයෙන් නලියනාකාරයෙන් පෙනෙන වැටහෙන සියල්ලම් පරණ පරණ රූප බිඳෙමින් අලුත් අලුත් රූප පහළවීම්ය. ඇසට නම් වර්ණ සටහන පමණක් සැලෙන්නාක්මෙන් තල්ලූවෙන්නාක්මෙන් පෙනෙයි. ඒ පෙණීමම සත්‍යයයි ගතහොත් ඤාණය ඒකාන්ත පරමාණු ස්වභාවට වැදනොගනී සිහි එළවනු.

කර්මාදි චතුර්විධ ප්‍රත්‍යයන් විසින් පහළකරනතාක් ඝනබද්ධ ක්‍රියා ආබන්ධන ක්‍රියා පරමාණුධාතු සහජාත ධාතුවර්ගති වේගයෙන් ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි අතුරුදන්වන්නාහුයයි කීතන්හි ප්‍රකෘති ගින්න යම්වස්තුවකට අල්වාගතහොත් ඒ වස්තුව දවා අතුරුදන් කිරීම ඒ ගින්නේ ධර්මතාවයි. එපරිද්දෙන් පරමාණු ධාතුගින්නේද තමන්හා එකට පහළවී එන ඝනබද්ධ ආබන්ධන විෂ්ටම්භන ලක්‍ෂණ මහාභූතයන්ද ප්‍රසාද රූපයන්ද දවා අතුරුදන්කිරීම ධර්මතාවයි. තණපරණලින් බෝවූ ගින්න ඒ තණපරණල් ක්‍ෂණයකින් දවා අතුරුදන්කරයි. තෙලින් බෝවූ ගින්න ක්‍ෂණයකින් ඒ තෙල් දවා අතුරුදන්කරයි. භූමිතෙලින් බෝවූ ගින්න ක්‍ෂණයකින් ඒ භූමිතෙල් දවා අතුරුදන්කරයි. ඒ ඒ තෙල්වර්ගවලින් බෝවූ ගිනිවර්ග ඒ ඒ තෙල්වර්ග ක්‍ෂණයකින් දවා අතුරුදන් කෙරෙත්.

මේ නයින් සත්ත්වයන්ගේ ස්කන්ධකයෙහි නිරන්තරයෙන් නැගඑන ධාතු ගින්නද තමන් හා එකට පහළවන ධාතූන් ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි දවා අතුරුදන් කෙරේමය. විශේෂයෙන් ධාතුස්නේහ දවා අතුරුදන් කරයි. එහෙයින් පහළවනතාක් පරමාණු පෘථිවිආදි ධාතුහු අසූරු සැණක් ඇසිපියවරක් පමණ ජීවත්වසිටිය නොහෙන්නෝය. අසූරුසැණක් ඇසිපියවරක් තුළ සියවරකට දහස්වරකටද වඩා ස්කන්ධකය සම්පූර්ණයෙන්ද අතුරුදන්වෙයි. එසේ අතුරුදන්වූවද අතුරුදන්ව හිස්වූ ස්ථාන අලුතෙන් අලුතෙන් රූපනිර්මිත කරමින් පූරවන්නාවූ ප්‍රත්‍යය ඉතා අධික හෙයින් ළදරු කාලයෙහි ක්‍ෂණයෙන් ක්‍ෂණය දියුණුව ශීඝ්‍රවී තිබේ. සකල ස්කන්ධකයෙහිම ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි බිඳෙමින් අතුරුදන්වන ආකාරය පෙනෙන පරිද්දෙන් බලනු. අතුරුදන්වන ආකාරය දිටුපුද්ගලයාට ශරීරය සම්පූර්ණ කෙරෙමින් පහළවන අභිනව අභිනව ජාතිලක්‍ෂණයද පෙනීයේමය. භූමිතෙල් නැළියකට අල්වාගත් ගින්න ඒ භූමිතෙල් නැළිය

කෙලවර දක්වා දවා අතුරුදන් කරයි. භූමිතෙල් අඩුවිය නොදී වත්කරන්නට පිළිවන්නාක් භූමිතෙලේ අඩුවකුත් නොපෙනේ. ගින්නේ අඩුවකුත් නොපෙනේ. එසේ අඩුවක් නොපෙනුනේවීනමුත් ක්‍ෂණයක් පාසා තෙල් ගිනි දෙවගියම ක්‍ෂයවෙයි. ඉදින් ක්‍ෂයනොවේනම් අලුතෙන් අලුතෙන් භූමිතෙල් වත්කරන්නට උවමනාවක්නැත. රාත්‍රිය මුළුල්ලෙහි නැවත නැවත වත්කිරීමෙන් භූමිතෙල් නැළිපනහක් ක්‍ෂයවීනම් ගින්නෙන්ද, භූමිතෙල් නැළි පනහක් ක්‍ෂයවූ බව ප්‍රත්‍යක්‍ෂවේ. පරීක්‍ෂාවෙන් බලතහොත් ඒ ඒ තෙල් කොටස් සහ ඊටදැල්වී ගත් ගත් අග්නිකලාපත් ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි ක්‍ෂයවී යන ආකාරය පෙනී යනවා ඇත. තෙල්සහ ගිනිදැල්ල අඩුවී යන ආකාරයත් රැයකට භූමිතෙල් මෙපමණ ගණනක් ක්‍ෂයවන්නේය කියාත් දතහැකිවේ. මේනයින් එකවරක් අනුභව කරනලද ආහාරයෙන් ස්කන්ධකාය මෙපමණ පැ ගණනක් ධරාසිටින්නේය. ආහාර අඩුවීගියහොත් ස්කන්ධකාය අඩුවීයන්නේය. ආහාර සිඳී ගියහොත් ස්කන්ධකාය ධරා නොසිටින්නේය.

මෙසේ ස්කන්ධයන්ගේ අතුරුදන්වීයාම ඉතා ශීඝ්‍ර හෙයින්ම අභිනව අභිනව ස්කන්ධ ඝට්ටනය අභිනව අභිනව ජීවිත ඝට්ටනය ශීඝ්‍රවී තිබේ අභිනව අභිනව ස්කන්ධ ඝට්ටනය අභිනව අභිනව ජීවිත ඝට්ටනය ශීඝ්‍ර හෙයින්ම ලෝකයෙහි දිවි පැවැත්වීම අතිශයින් විශාලවූ අතිශයින් අවහිරවූ අත්හැරිය නොහැකිවූ බලා සිටිය නොහැකිවූ ප්‍රධානම කෘත්‍යයවීතිබේ. මේලක්දිව අවුරුදුපතා උපදවන ධාන්‍ය යව තිරිඟු උඳු මුං මෑ ආදී ආහාර වර්ග කොපමණද අවුරුද්දක් මාසයක් දවසක් ඇතුළත කාදමනලද ආහාරවර්ග කොපමණද පිටරටින්ගෙනෙන ධාන්‍ය වර්ග කොපමණද කියා මෙනෙහිකර බලතහොත් අභිනව අභිනව ස්කන්ධ ඝට්ටනයෙහි අභිනව අභිනව ජීවිත ඝට්ටනයෙහි විශාලතාව පෙනීයේමය. දිනපතා අභිනව අභිනව ස්කන්ධ ඝට්ටනයෙහි අභිනව අභිනව ජීවිත ඝට්ටනයෙහි විශාලතාව පෙනෙතහොත් දවසකට කොපමණ ස්කන්ධරාශියක් කොපමණ ජීවිතරාශියක් අතුරුදන් වන්නේද කෙබඳු ශීඝ්‍රත්වයකින් අතුරුදන් වන්නේද කියාත් පෙනීයේමය.

දිය ගොඩ දෙක්හි හැසිරෙන සියලු සත්ත්වයන් විසින් දිවාරෑ නොකඩව දිවි පැවැත්වීමට අහරබුදීම් වස්තු සැපසීම් සඳහා කරන කියන ගොවිතැන් රැකිරක්‍ෂා වෙළහෙළඳාම් යාම්ඊම් දීම්ගැනීම් කිම්බිණීම් ඇඬීම් වැළපීම් ඇනුම් බැණුම් රණ්ඩු ඩබර කලකොලහල නඩුහබ වාදවිවාදාදී ඒ ඒ ක්‍රියා

වන්ගේ මූලකවරේදැයි සොයා බලන්නවුන්ට පරණ පරණ ජීවිත ස්කන්ධ ක්ෂයවීමක්පාසා අලුත් අලුත් ජීවිත ස්කන්ධ ඝටටණයයි පෙනීයනවා ඇත. එසේ පෙනීගිය පුද්ගලයාට පරණ පරණ ස්කන්ධාන්තර්ධානයාගේ ශීඝ්‍රතාවද ඒ ස්කන්ධයන්ගේ නිඃසාරතාවද මොනවට වැටහෙනවා ඇත. ස්කන්ධකායෙහි කුඩු මහත්වූ ධාතූන්ගේ අන්තර්ධානය ශීඝ්‍ර හෙයින්ම ලොකයෙහි ජීවිතා රක්ෂාව පිණිස යෙදියයුතු ව්‍යාපාරයන්ගේද කෙළවරක් නැති අන්දම වැටහෙනවා ඇත. මේ ප්‍රකෘති ජාති ලක්ෂණයයි.

ස්කන්ධකාය කෙරෙහි බැඳී පවත්නා අධිකතෘෂ්ණාවනිසා අවුරුදු සියගණන් දහස්ගණන මුළුල්ලෙහි ජීවත්වනු කැමැත්තෙන් පරම්පරාව සිඳියනොදී ස්කන්ධ ඝටටණය පිණිස අභිනව අභිනව ජාති පහළ කිරීමයයි කියනලද ජීවිකා වෘත්තිය ගැන සලකා බැලීමෙන් ස්කන්ධ කායෙහි අලුතෙන් අලුතෙන් පහළ වෙමින් පවත්නා ප්‍රකෘතිජාති ලක්ෂණය පෙනෙන පුද්ගලයාට විකෘති ජාතිලක්ෂණයද පෙනීයේමය. විකෘති ජාති ලක්ෂණයයි කියන්නේ ස්කන්ධකායෙහි නානා ප්‍රකාරරොග, නානාප්‍රකාර ආබාධ, නානාප්‍රකාර දණ්ඩන, නානා ප්‍රකාර උපද්‍රව ඇතිවීමටයි. ක්ෂණයකින් මුළු ස්කන්ධකායෙහි සිසාරා යමින් ඒකාබද්ධවී යමින් පරම්පරාව ගැටියමින් පහළ වීම ස්වභාවකොට ඇති ප්‍රකෘති ජාති ලක්ෂණය නිතරම පවත්නා හෙයින් ස්කන්ධයන්ගේ ඉෂ්ටස්වභාවෙන් අනිෂ්ට ස්වභාවට අනිෂ්ට ස්වභාවෙන් ඉෂ්ටස්වභාවට පෙරළීම ශීඝ්‍රවී තිබේ. එසේ පෙරළීම ශීඝ්‍රවී තිබෙන හෙයින්ම ඉෂ්ටා නිෂ්ටස්ව ස්වභාව ධර්මයන්ගේ සහ සුඛදුඃඛස්වභාව ධර්මයන්ගේ පෙරළීමද ශීඝ්‍රවීතිබේ. සත්ත්වයාගේ ස්කන්ධකායෙහි ඉෂ්ටානිෂ්ට සුඛදුඃඛ ස්වභාවධර්මයන් පහළ නොවන ස්ථානයක් පහළ නොවන වේලාවක් නැත්තේමය. හට ගැනීම ඇතිවීම යනු ජාතිහුගේ පර්‍යායනාමයෝයි ඒ එසේමය. ලොකයෙහි ඇස්ලෙඩවීය, කන්ලෙඩවීය, ඇස්ලෙඩහටගත, කන්ලෙඩහටගත යන ආදී වශයෙන් ව්‍යවහාරකරනුලබන්නේ මේ ජාතිධර්මයයි. ඉෂ්ටානිෂ්ට සුඛ දුඃඛ ජාති ධර්මයන් පහළකරන හෙතුහුද අධ්‍යාත්ම බහිද්ධා සන්තානවයෙහි අනන්තයහ. අප්‍රමාණයහ. ස්කන්ධකාය සපුරා පහළවන සන්බද්ධ ලක්ෂණපෘථිවිධාතුව කාෂ්ඨමුඛසර්පයයි වදාරාතිබේ. යම්කිසි පුද්ගලයකුගේ පාදග්‍රහයෙහි සර්පයකු දෂ්ටකළහොත් ඒ පුද්ගලයාගේ ශීර්ෂයදක්වා ක්ෂණයකින් විෂවිහිදයන්නේය. එසේ විහිදයාමෙන් මූර්ඡාවී සිහිසන්

නැතිවූ කල ඒ පුද්ගලයාගේ මුළුශරීරයම පෙරළී වෙනස් වූයේවෙයි. ප්‍රකෘතිරූප රැස සම්පූර්ණයෙන් අතුරුදන්වූයේ වෙයි. මුළුසිරුරෙහිම පරමාණු පමණද ප්‍රකෘතිරූපයක් ශේෂ නොවෙයි ගිනිදැල් ගිනිඅඟුරු රැසක් හා සමාන අලුත් රූපයෙන්ම මුළුසිරුර පිරීයයි. රාත්තල් පනහක(50) පමණ බර වෙඩිබේත් අසුරසාදනලද වෙඩිබෝම්බයක සේව නූලට අබටැක් පමණ ගිනිපුපුරක් වැටුණුකෙණෙහිම ඒ රාත්තල් පනහක (50) පමණ බර වෙඩිබේත් රැස සම්පූර්ණයෙන් එකමගිනිජාලාවක් ගිනිඅඟුරු රැසක්වන්නාක්මෙනි.

සර්පයා දෂ්ටකළ පුද්ගලයාගේ මුළුසිරුරෙහි පරණ පරණ රූප අතුරුදන්වෙමින් අලුත් අලුත් රූප පහළවන අයුරු කෙසේද? යත්හොත්. මුලදී පතුල් සටහන් වී තුබුණු ප්‍රකෘති රූපරාශිය සුඛදායී ඉෂ්ටරූපරාශියක්බව ප්‍රත්‍යක්ෂය. සර්පයා දෂ්ටකොට විෂවිහිදයාමෙන් පසු ඇතිවූ දැවුම් රිදුම් ඇනුම් පෙරළුම් කෙවුම් කැක්කුම් ආදිදුඃඛදායී අනිෂ්ට රූප රාශිය වනාහි සර්පයා දෂ්ටකළායින් පසු පහළවූ බව ප්‍රත්‍යක්ෂය. යමෙක් විචාළවිට උත්තරදෙන්නෙත් ඒ වේලාවෙහි පහළවී ආ අනිෂ්ටජාතිධර්මයෝය කියායි. එසේ උත්තර දෙතත් අභිනව ජාති අභිනව රූප අභිනව ධාතු අභිනව කලාප කියා පිරිසිඳ දැනීමක් නැත්තේය. සිරුරතුළ දැන්රිදෙයි දැන්කකියයි දැන්ශීතලකරයි දැන් දැවිලිකරයි දැන්නගියි දැන්බසියි යන ආදි වශයෙන් ව්‍යවහාර කරනු ලබන්නේ අභිනව අභිනව රූප අභිනව අභිනව ධාතු අභිනව අභිනව කලාප අභිනව අභිනව පරමාණුජාති ධර්මයි. යම් වේලාවක මුළුකයෙහි හෝ කායෙක දේශයෙක්හි උණුසුම්වී ආබව දැනුණේනම් ඒ ඒ වේලාවෙහි පහළවී ආ අභිනවජාති ධර්මයි යම් ස්ථානයක ඒ අභිනවජාතිධර්ම පහළවීනම් ඒ ස්ථානයෙහි පුරාණයන්ගේ අතුරුදන්වීමද ඒකාන්තයෙන් විද්‍යමානයි. මුළුසිරුරේම අභිනව ජාතිධර්මපහළවීනම් මුළුසිරුරේම පුරාණයන්ගේ අතුරුදන්වීමද ඒකාන්තයෙන් විද්‍යමානයි. පරිවර්තනය ඉතා ශීඝ්‍ර හෙයින් ඒ පුරාණාභිනවයන්ගේ නිරෝධොත්පාද අප්‍රකටවී තිබේ.

ඒ ඒ අවස්ථාවන්හි දැන් ශීතලයි දැන් උෂ්ණයි දැන් රිදේ දැන් කකියයි දැන් දැවිලිකරයි දැන් නගියි දැන් බසියි කියා දැනගනු ලබන්නේ ඒ ඒ කායාඞ්ගයන්හි හෝ කායෙක දේශයන්හි පරණ පරණ රූප නිරුද්ධවපහළවන අභිනව අභින රූප අභිනව අභිනව ධාතු අභිනව අභිනව කලාප අභිනව

අභිනව ජාති ධර්මයන්බව ප්‍රකටමය. උෂ්ණ රෝගීන්ගේ ශරීරයෙහි උෂ්ණ නගින බසින වේලාවල ශරීරය සම්පූර්ණයෙන් පරිවර්තනයවෙයි. ආහාර අපථ්‍යවීමෙන් පරිවර්තනය, ස්නානය අපථ්‍යවීමෙන් පරිවර්තනය, වැස්සට තෙමීමෙන් පරිවර්තනය යන ආදීන්ගේ වශයෙන් විරුද්ධ ප්‍රත්‍යයන්ගේ සමාගමයෙන් වන ස්කන්ධ පරිවර්තනයන්ගේ අනන්තයක් නැත්තේමය.

**මේ කියනලද්දේ විකෘති ජාති ලක්ෂණයයි.**

---

මේ විකෘති ජාතිය විද්‍යමාන හෙයින්ම සිත්වූ පරිදි නොහිඳියහැකිව නොයාහැකිව නොඇඹහැකිව නොකළහැකිව නොපිරියහැකිව බියඑලවන්නාවූ පීඩාකරන්නාවූ ඇතුල්සතන්හි අනතුරු කරන්නාවූ පිටසතන්හි අනතුරු කරන්නාවූ අනේකවිධ අවකාශ වෙනුවෙන් බියවන්ටත් තැතිගන්ටත් ශෝක කරන්ටත් ග්‍රාමබන්ධනයෙන් බැඳී වාසයකරන්ටත් ගෘහබන්ධනයෙන් ප්‍රාකාර බන්ධනයෙන් බැඳී වාසයකරන්ටත් සිදුවී තිබේ. මේ ආදී අනේක සහස්‍ර සම්බාධයන් පෙනීගිය පුද්ගලයාට ස්කන්ධයන්ගේ විකෘති ජාතියකෙතරම් භයානකද කෙතරම් විශාලද කියා වැටගේමය.

ගිනි උෂ්ණයක් වැදුණුකල ඇතුළත පිටත එකපහරම හුණුවන සුලු මිනිස් ප්‍රමාණ ලාකඩ කැබැල්ලක හෝ ඉටි කැබැල්ලක ස්තබ්ධාකාරය පිළිවෙළින් අතුරුදන්ව බසින්නාක්මෙන් මෘදු ආකාරය පිළිවෙළින් ඉපද නගින්නාක්මෙන් මුළුශරීරයෙහිම රූප නිරොධොත්පාද පෙනෙනසේ බැලියයුතු. ස්තබ්ධාකාරය පිළිවෙළින් අතුරුදන්ව බැසීම නම් පෘථිවි ධාතුව පිළි වෙළින් නිරුද්ධවීයාමයි සූත්‍රාභිධර්ම දෙක්හිම නිරොධ, භඞ්ග, ක්ෂය, ව්‍යය, අස්ත, මරණ, අනිත්‍ය යන නම්වලින් වදාරනලද අනිත්‍යයද මේ නිරොධය මැයි. විදර්ශනායානිකයන් විසින් දක්කයුතු අනිත්‍යයද මේ නිරොධ භඞ්ග ආදිනම්වලින් වදාළ නිරොධයමැයි. එහෙයින් මේ නිරොධය දක්නාඥානයම අනිත්‍ය විදර්ශවන්නීයයි දතයුතු.

කාෂ්ටමුඛ සර්පයයි වදාළ පෘථිවිධාතුහුගේ උදය ව්‍යය ප්‍රත්‍යක්ෂව පෙනීගිය පුද්ගලයාට පූතිමුඛ අග්නිමුඛ ශස්ත්‍රමුඛ සර්පයයි වදාළ ආපො තෙජො වායො මහාභූතධාතූන්ගේ අලුත් අලුත් පහළවීම් සහ පරණ පරණ නිරුද්ධවීම් අනායාසයෙන්ම පෙනී යනවා ඇත.

ස්තබ්ධ මෘදු ලක්ෂණ පෘථිවී ක්‍රියාවන්ගේ පිළිවෙළින් අතුරුදන්ව බැසයාම, බිඳීම, ගෙවීම, අස්තවීම, මියයෑම පෘථිවී ධාතුහුගේ අනිත්‍යලක්ෂණයනම්වේ. ආබන්ධන පග්ඝරණ ලක්ෂණ ආපොක්‍රියාවන්ගේ පිළිවෙළින් අතුරුදන්ව බැසයාම බිඳීම, ගෙවීම, අස්තවීම, මියයෑම, ආපොධාතුහුගේ අනිත්‍යලක්ෂණය නම්වේ.

ශීතොෂ්ණත්වලක්ෂණතෙජො ක්‍රියාවන්ගේ පිළිවෙළින් අතුරුදන්ව බැසයාම, බිඳීම, ගෙවීම, අස්තවීම, මියයෑම, තෙජොධාතුහුගේ අනිත්‍යලක්ෂණය නම්වේ.

විස්තම්භන සමීරණ ලක්ෂණ වායොක්‍රියාවන්ගේ පිළිවෙළින් අතුරුදන්ව බැසයාම, බිඳීම, ගෙවීම, අස්තවීම, මියයෑම, වායොධාතුහුගේ අනිත්‍යලක්ෂණය නම්වේ.

මෙසේ අනිත්‍යලක්ෂණය දිටුපුද්ගලයාගේම විදශීනාඥානය හොඳින් පිරිසිදුවන්නේය.

ලොකයෙහි මියයන කාලය පැමිණ මියයාම දිරණ කාලය පැමිණ දිරායාම බිඳෙනකාලය පැමිණ බිඳීයාම ගෙවෙන කාලය පැමිණ ගෙවීයාම අනිත්‍යයයි දැකීම විදශීනාවක්ම නොවේ. වැදිකෙවුල් කොච්චි දෙමළ හම්බ මරක්කලාදීන්ටද පෙනෙන අනිත්‍යයකි.

සතර මහාභූත ධාතූන්ගේ අනිත්‍ය ලක්ෂණය දිටුපුද්ගලයාට ෂට්විධප්‍රසාදධාතූන්ගේ සහ දශවිධ සෘතු ධාතුත්වයනීන්ගේ සහ දශවිධ ධාතුසොහයන්ගේ අනිත්‍ය ලක්ෂණයත් නිරායාසයෙන්ම පෙනී යනවා ඇත.

**මේ ජාතිධම්මා යන පඨමම මාතෘකාපදයෙහි විස්තරයි.**

---

(ජරාධම්මා) මේ කාය ක්ෂණයෙන් ක්ෂණයෙක්හි දිරීම ස්වභාවකොට ඇත්තේය යන සවෙනි මාතෘකාපදයෙහි විස්තරය කිසේ? යත්හොත් ජාතිනිර්දේශයෙහි විස්තරවූ පරිද්දෙන් ස්කන්ධකයෙහි අසූරු සැණක් ගසන ඇස් පියවරක් හෙළන පමණද ජීවත්වියහැකි පරමාණු පමණ ධර්මයක් නැතිබව දිටු පුද්ගලයාට මේජරාලක්ෂණයත් පහසුවෙන් පෙනී යනවා ඇත.

ලොකයෙහි අතුරුදන්වීම් සියල්ලක් පූර්වභාගයෙහි දිරීමක්නැතිව සිදුවියහැකි නොවේ. සියලුසතුන්ගේම අලුත් පෙත්ගති කැකුළුනාඹුල්ගති දිරායාමෙන්ම අතුරුදන්වීම

ධර්මතාවයි. පරමාණු නාමරූප ධර්මයන්ගේද ඒ අතුරුදන්වීම ජරාපූර්වාංගමවම සිද්ධවනබවදතයුතු. ජරාව යටද විස්තරවිය.

**මේ ජරාධම්මොයන සවෙනිමාතෘකාපදයෙහි විස්තරයි.**

---

(මරණධම්මො) මේ කය ක්ෂණයෙක් ක්ෂණයෙක්හි මියයාම ස්වභාව කොට ඇත්තේය යන සත්වන මාතෘකා පදයෙහි විස්තර කිසේ? යත්හොත් ජාතිනිර්දේශයෙහි නිරෝධ, භඞ්ග, ක්ෂය, ව්‍යය, අස්ත, මරණ, අනිත්‍ය යන නම් වලින් දක්වනලද අතුරුදන්වීමම පරමාණු ධර්මයන්ගේ මරණයයි කියනලදී. අසූරු සැණක් ගසන ඇස්පියවරක් හෙළන පමණද ජීවත්විය හැකි කමක් නැති හෙයින් ධාතුවගතියෙන් මරණ ගතියෙන් දුවි දුවී ක්ෂණයෙක් ක්ෂණයෙක්හිපරමාණු ධර්මයන්ගේ අතුරුදන්වීම මරණයනම්සිසේයි.

ඒ මරණගතියෙන් අසූරුසැණක් ඇස්පියවරක් ඇතුළත සියවරකටත්වඩා මුළු ස්කන්ධකායද දවා අතුරුදන්කරණුලැබේ. දියෙහිහටගත් නෙළුම් මලක්ගොඩගෙන රත්වූ බිමක දැමූකල්හි නෙළුම්මල 1. සන්තතිජරාවට සහ 2. ක්ෂණිකජරාවට සහ 3. ක්ෂණිකමරණයටත් පැමිණීමෙන් ම්ලානිකව වියළී නටබුන් බවට පැමිණෙයි.

ජලෝපස්ථම්භය නොලැබීමෙනුත් අව්, බිම්, දිය, උණුහුම් යන දඩුවම් සතරින් පෙළීමෙනුත් ඒ නෙළුම්මලේ සන්තතිජරාවප්‍රත්‍යක්ෂවෙයි. ඇසට පෙනී යන පිරිහී බැසීම ම්ලානිකව පරවීම සන්තති ජරානම්. අන්තිම අතුරුදන්වීමද ප්‍රත්‍යක්ෂමය. සන්තති ජරාව ප්‍රත්‍යක්ෂවූකල්හි ඥානචක්ෂුසට ක්ෂණිකජරා මරණයන්ගේද දක්ෂිනාවකාශ ප්‍රත්‍යක්ෂව ප්‍රකට වන්නාහුය. ක්ෂණිකජරා මරණ ප්‍රකෘති චක්ෂුසින් දක්කයුතු ධර්මයෝ නොවෙත්. කෙසේනම් ඥානචක්ෂුසට ක්ෂණිකජරාමරණයන්ගේ දක්ෂිනාවකාශ ප්‍රත්‍යක්ෂව ප්‍රකටවන්නාහුද? යත්. දියෙන්ගොඩගත් තැන් පටන් ඒ නෙළුම්මලේ ප්‍රාණවද්භාවයයි කියනලද පෘථිවීධාතුව ක්ෂණයෙක් ක්ෂණයෙක්හි ම්ලානිකව මෘදු භාවයට පෙරළෙයි. අනුක්‍රමයෙන් ප්‍රාණවද්භාවය අවස්ථාවෙන් අවස්ථාව නටබුන් වෙමින් අභිනව ම්ලානික මෘදුජාති ලක්ෂණය අවස්ථාවෙන් අවස්ථාවටප්‍රකටවෙයි. ප්‍රාණවත්වූ ආපෝ, ශීතලවත්වූ තේජෝ, විෂ්ටම්භනවත්වූ වායෝධාතූහුද අනුක්‍රමයෙන් නිරුද්ධවඅතුරුදන්වන්නාහුය.

වර්ණ ගන්ධ රස ඕජා ධාතූහුද නිරුද්ධව අතුරුදන්වන්නාහුය. ඥාණයෙන් බැලූකල 'චිරි චිරි' යන අනුකරණයෙන් පිනි කැටමෙන් ඒ අතුරුදන්වීම වැටහෙනවා ඇත.

එසේ පූර්ණාභිනවයන්ගේ අනුක්‍රමයෙන් බිඳී බැස්මත් ඉපද නැඟීමත් කෙතරම් ශීඝ්‍රදැයි කියා පෑමට අවකාශයක් උපමාවක්ද නැත්තේය. පෘථග්ජන ඥානයෙන් හමුකරගත හැකි තැනක්ද නොවේ. හමුකරගත හැකි පමණකින් ව්‍යවස්ථාකොට බැලිය යුතු ස්ථානයකි.

එසේ ස්කන්ධයන්ගේ නිරෝධොත්පාද ශීඝ්‍රහෙයින්ම ඥාණයෙන් හමුකරගත නොහැකිතාක් සියලූමදේ ලෝවැස්සෝ පෙරපසු දෙකෙළවර නැති ඒවායයි ගන්නාහුය. ශීඝ්‍රාකාරය ඥාණය යැවියහැකිතාක් යවා බැලියයුතු ඉඳින් ක්ෂණයෙක් ක්ෂණයෙක්හි බිඳී අතුරුදන්වීමක් ඉපද නැඟීමක් නැත්නම් ක්ෂණයෙන් ක්ෂණය මලානිකව පරවියහැකිනොවේ. නුවණ තියුණුකර බලනු. නෙලුම්මල් උපමාවෙහි කී පරිද්දෙන් සත්ත්වයන්ගේ ස්කන්ධකායයන්හිද ක්ෂණයක්පාසා ස්කන්ධකායට ස්පර්ශවන නන්වැදෑරුම් පෙරළීම්ද අනන්තයහ. ඇසට පෙනෙන නන්වැදෑරුම් පෙරළීම්ද, අනන්තයහ. ඥාණයට වැටහෙන නන්වැදෑරුම් පෙරළීම්ද, අනන්තයහ. ස්කන්ධකායට ස්පර්ශවන නන්වැදෑරුම් පෙරළීම් නම් හිසතුළ දූන් කකියයි. ඇසතුළ දූන් කැවෙයි. මුහුනේ නැහැයේ කනේ කපොලයේ තොලේ මුඛයෙහි දිවේ උගුරේ ළයේ දූන් රුජාකරයි කුසතුළ දූන් රිදෙයි–කියා දැනෙන අභිනව ස්වභාවයෝයි. ඒ අභිනව ස්වභාව ධර්මයන්ගේ ජාති ජරාමරණ ලක්ෂණ නුවණැස් යොමුකොට බලන්නවුන්ට ව්‍යවස්ථාවී පෙනීයනවා ඇත. ලුහුඬින් කියතහොත් ස්කන්ධශරීරයෙහි ඇතුළතවේවා පිටතවේවා උකුණු, මකුණු, මැසි, මදුරු, පත්වෑ, ගෝනුසු, ගල්, මුල්, කැට, කැබිලිති, දඬු, මුගුරු, දිය, ගිනි, ආදීන් අතුරෙන් ස්කන්ධධර්මයන්ගේ පෙරළීමට තරම් යමක් ස්පර්ශවීනම් නොපෙරළෙන ක්ෂණය කියා එකම ක්ෂණයක්ද නැත්තේය. අනිෂ්ට ජාති පහළනොවන ක්ෂණය කියා එකම ක්ෂණයක්ද නැත්තේය. නොබිඳෙන ක්ෂණය කියා එකම ක්ෂණයක්ද නැත්තේය. නොපිරිහෙන ක්ෂණය කියා එකම ක්ෂණයක්ද නැත්තේය. ස්පර්ශයෙහි ප්‍රමාණයට ස්පර්ශවූ ක්ෂණයෙහිම ඉපදීම දිරීම මැරීම ලක්ෂණකොටඇති සංස්කාරරාශියක්වූ හෙයින්ම "ජාතිධම්මා ජරාධම්මා මරණධම්මා"යි වදාරනලදී.

**මේ මරණ ධම්මා යන සත්වෙනි මාතෘකාපදයෙහි විස්තරයි.**

(අනිච්චා) ස්කන්ධධර්මසමූහය අසූරු සැණක් ඇස්පිය වරක් හෙළන පමණද ස්ථිරව බරා සිටිය නොහෙන හෙයින් අනිත්‍යයි. යන අටවෙනි මාතෘකා පදයෙහි ස්කන්ධයන්ගේ අසූරු සැණක් ඇස්පිය වරක් හෙළන පමණ බරාසිටිය නොහෙන අන්දමයටද විස්තරවිය. සත්ත්වයන්ගේ ශරීර අසූරු සැණක් ඇස්පිය වරක් පමණ ස්ථිරව බරාසිටිය හැකි ස්කන්ධවී නම් ඒ අසූරු සැණක් ඇස්පියවරක් පමණ කාලය ප්‍රත්‍යක්ෂ ප්‍රකට කාලයක් බැවින් ස්කන්ධකයෙහි හෙනපහරක් වැදුණත් ඇසූරු සැණක් ඇස්පියවරක් පමණ කාලයතුළවත් නොබිඳී නොපෙරළී බරාසිටිය යුතුවේ. එනකුඳුවූවත් බලවත් ශිතොෂ්ණාදී ප්‍රත්‍යයකින් ස්පර්ශකරනලද්දේ වීනම් ඒ ස්පර්ශකළ ක්ෂණයෙහිම බිඳී පෙරළීයන්නේය. බිඳෙන පෙරළෙන සියල්ලක් පුරාණයන්ගේ අතුරුදන්වීම සහ අභිනවයන්ගේ පහළවීමයි. නුවණැස් යොමා බලන්නවුන්ට දිය ගොඩදෙක්හි හැසිරෙන සියලුම සත්වයන්ට ස්වකීය ජීවනකාලයතුළ රෑ දවල් නොකඩව අනන්ත වෙහෙස මහත්සිදරන්ට සිදුවී තිබෙන්නේ මේ ස්කන්ධයන්ගේ අනිත්‍යය නිසාමයයි පෙනීයනවා ඇත. අනිත්‍යය නිසාම අනන්ත දුකට භාජනවන බව පෙනීයනවා ඇත. අනිත්‍යය අතිශයින් භයානක ධර්මයක් බව පෙනී යනවා ඇත. ඉඳින් ස්කන්ධකය නිත්‍යවී නම් එකී වෙහෙස මහත්සි ස්වල්පයකුදු දරන්ට සිදුනොවන්නේමය. දන්දීම් සිල්රැකීම් ආදී පින්කම් කරන්නාහුය ඒ කරන්නේත් මේ අනිත්‍යය නිසාමයි. අනිත්‍යය නිසා විඳින සංස්කාර දුඃඛ රාශියක්මය. ස්කන්ධකය නිත්‍යවීනම් අනාගත සංසාරයබලා වෙහෙසීමටකාරණයක් නැත්තේය. අනිත්‍යලක්ෂණයයි කියන්නේ ක්ෂණිකමරණ ක්ෂණිකභඞ්ගයන්ටයි. ස්කන්ධකය ඒ අනිත්‍යලක්ෂණයයි කියනලද ක්ෂණිකමරණ ක්ෂණිකභඞ්ගයෙන් බිඳීයන හෙයින් කියනලද නයින් ප්‍රත්‍යුත්පන්න ස්කන්ධයාත්‍රාව පිණිස පවත්වනලද පරිශ්‍රමයන්ගේ අන්තයක්ද නැත්තේය. අනාගත ස්කන්ධයාත්‍රාව පිණිස පවත්වනලද පරිශ්‍රමයන්ගේ අන්තයක්ද නැත්තේය අනිත්‍යලක්ෂණය යටදැක්වූ ජීවිත ස්කන්ධ ඝට්ටන ජීවිත පොෂණ අභිනව ජාති ඝට්ටනයන් සමඟද එකතුකර බලා තේරුම් ගතයුතු.

**මෙතෙකින් 'අනිච්චා' යන නවවෙනි**
**මාතෘකා පදයෙහි විස්තරයවූ ස්කන්ධ ධාතුයාගේ**
**අනිත්‍ය ලක්ෂණය කියා නිමවිය.**

---

"දුක්ඛා" මේ කය සුඛයෙන් අමිශ්‍ර ශුද්ධදුඃඛ රාශියක යන් නවවෙනි මාතෘකා පදයෙහි දුඃඛයතෙම දුඃඛ දුඃඛය, සංස්කාර දුඃඛය, විපරිණාම දුඃඛයයි තෙවැදෑරුම්වේ. මේකයෙහි අටානූ 98 චක්ෂුරොගාදි අභ්‍යන්තර උපද්‍රවයන්ගේ ස්පර්ශයෙන් ඇතිවන දැවුම්, රෙදුම්, කැක්කුම්, හිරි, කොර, මර, සහ ගිනි දිය, කඩු, දුනු, ආවුධ, සොර, සතුරු, නයිපොළොන් ආදි බාහිර උපද්‍රවයන්ගේ ස්පර්ශයෙන් ඇතිවන දුඃඛ සහ ආපායික සත්ත්වයන් විසින් විඳිනු ලබන කායික දුඃඛාදියත් දුඃඛ දුඃඛනම්වේ. තිරශ්චීන සත්ත්වයෝපවා මේ දුඃඛ දුඃඛය දුක් බැව් දන්නාහුය. දුඃඛ දුඃඛයට කරුණක්පෙණුනු කල්හි භයවන්නාහුය. තැතිගන්නාහුය. සැගවෙන්නාහුය. හැකිනම් සටන් පිණිසද ඉදිරිපත් වන්නාහුය. කුෂ්ඨරොගීන්ට කුක්කුටමාංසාදි අපථ්‍ය ආහාරයන් කෙරහි භය ඇතිවෙයි. ඒ භය අපථ්‍ය ආහාරයකෙරෙහි නොව ස්වකීය කායවූ රොගය කෙරෙහි ඇතිවන භයකි. කුෂ්ඨරොගය නැති පුද්ගලයන්ට නම් ඒ කුක්කුට මාංසාදිය කෙරෙහි භයවන්නට කරුණක් නැත්තේය. එහෙයින් මේ කය පැසවාගිය මහත් ගඩක් වැනිවේ. බාහ්‍යාභ්‍යන්තර උපද්‍රව නමැති අපථ්‍යාහාර ස්පර්ශයක් ලද්දහොත් ස්කන්ධකයෙහි කොතනක වුවත් කොයි වේලාවකවුවත් දුඃඛ දුක පහළවේමය. ලොකයෙහි භය සන්ත්‍රාසයන්ගේ මූලසොයා බැලූවත් ස්කන්ධකයම මූලබව පෙනී යනවා ඇත. ස්කන්ධකය නමැති දුඃඛ දුඃඛය නිසා සත්ත්වයන්ට ඇතිවී තිබෙන සම්බාධයන්ගේ අන්තයක් නැති බවද පෙනී යනවාඇත.

**මේ සංක්ෂෙපයෙන් දුඃඛදුඃඛයෙහි ලක්ෂණයි.**

---

සංස්කාර දුඃඛයය කියනු ලබන්නේ නූපන් වස්තුව උපදවනු පිණිසත් නොලැබූ වස්තුව ලබාගනු පිණිසත් නොපැමිණි වස්තුව පමුණුවා ගණු පිණිසත් පළමුකොට වෙහෙස මහන්සි ගෙන විඳින දුඃඛරාශියයි. විපරිණාම දුඃඛයයි කියනු ලබන්නේ පළමුකොට එසේ වෙහෙස මහන්සි ගෙන සංස්කාර දුක්විඳීමෙන් ඉපදී ලැබී පැමිණී ආ වස්තුව නොබිඳී, නොපිරිහී, නොඅඩුවී. නොබැස, නොපෙරළී, නොමියා, නොබියව, නොදඬුවම්විඳ, නොසතුරුව වියවුල්ව රක්ෂාකරනු පිණිස් ගන්නාවෙහෙස මහන්සි රාශියයි. එසේ නොබිඳී නොපිරිහී රක්ෂාවීම පිණිස වෙහෙස මහන්සි ගත්තේවී නමුත් බිඳී පිරිහීයාමට සැහෙන ප්‍රත්‍යයන් එළඹ බිඳී පිරිහී ගියකල්හි

ඇතිවන කායික චෛතසික දුඃඛරාශියක් ඇද්ද එවනාහිවිපරිණාම දුඃඛයෙහි සඞ්ග්‍රහවේ. දිනපතා අනුභව කරනු ලබන ආහාරය කියනලද දුඃඛත්‍රයෙන් යුක්තවේ. ඒ ආහාරය ආහාරයෙන් වෙන්විය නොහැකි ආහාරය අත්හැරිය නොහැකි පුද්ගලයාට දුඃඛත්‍රයකින් නිතරපීඩාකරයි. කෙසේද? යතහොත්. ඒ ආහාරය ඉපදවීම පිණිස පූර්ව පූර්වවර්‍ෂයන්හි බීජධාන්‍යය ලබාගැනීමට වැයම් කළතැන් පටන් පශ්චිම පශ්චිම වර්‍ෂයන්හි ආහාර පිසීම දක්වා මේ අතර ඇතිවූතාක්උත්සාහ ව්‍යාපාර ඒ ආහාරයාගේ සංස්කාර දුඃඛයෝනම්වෙත්. ආහාරය අත්නොහැරිය හැකි පුද්ගලතෙම ආහාරය අත්නොහැරිය හැකිතාක් මුළුල්ලෙහි ඒ සංස්කාරයන්ගෙන් බැඳී ගෙනිවාසය කරන්නෙක්මය ආහාරය අත්හැරිය කල්හිම ඔහට ඒ සංස්කාර බන්ධනයෙන් මිදිය හැකි වන්නේය. කුමක් හෙයින යත්? ආහාරය වනාහි ඒසාමහත් සංස්කාර රාශියක් ප්‍රථමකොට සංස්කරණය කරන්නෙකුටම ඇතිවියයුතු එකාන්ත සංස්කාර බම්රාශියක් හෙයිනි. මෙසේ ආහාරය අත්හැරිය නොහැකි පුද්ගලයාට ඒ ආහාරය සංස්කාර දුකින් නිතර පීඩාකරන අන්දම දතයුතු. මේ කියනලද්දේ සන්තති සංස්කාර දුඃඛයයි. ක්‍ෂණික සංස්කාරදුකවනාහි හෙතුප්‍රත්‍යයාදි සූවිසි පට්ඨාන ප්‍රත්‍යයන්ගේ වශයෙන් දතයුතු.

ආහාරය අත්හැරිය නොහැකි පුද්ගලයාට ඒ ආහාරය විපරිණාම දුඃඛයෙන් කෙසේ පීඩාකොරේද?යතහොත්. පූර්ව පූර්ව වර්‍ෂයන්හි බීජ ධාන්‍ය ප්‍රතිසංස්කරණයෙහි පටන් එයින්ඇතිකළ ආහාරය අනුභවකොට මලමූත්‍ර කෘත්‍යය පිණිස උත්සාහ ව්‍යාපාරයෙදීම දක්වා මේ දැතුර පළමුකොට ඒ ඒ කෘත්‍යයන්නට බුන්කළ හැකි ප්‍රත්‍යයන් පරීක්‍ෂාකර බලා ඔවුන්ගෙන් ආරක්‍ෂාවීම පිණිස යොදනලද උත්සාහ ව්‍යාපාර ඒ ආහාරයාගේ විපරිණාම දුඃඛයෝයි. මෙසේ ආහාරය අත්නොහැරියහැකි පුද්ගලයා ඒ ආහාරගේ විපරිණාමයෙන් නිතර බැඳී ගෙනී යන අන්දම දතයුතු. ආහාරය අත්හැරිය කල්හිම ඒ විපරිණාම බන්ධනයෙන් මිදිය හැකි වන්නේය. කුමක් හෙයිනයත්. ඒ ආහාරය ඇතිකිරීමට උපකරණවූ සියලූ ක්‍රියාවන්ම නටබුන් වීමට සැහෙන ප්‍රත්‍යය එළඹ ආකල්හි නටබුන්වීයාම බම්තා හෙයිනි. මෙසේ ආහාරය අත්හැරිය නොහැකි පුද්ගලයාට ඒ ආහාරය විපරිණාම දුඃඛයෙන් නිතර පීඩාකරන අන්දම දතයුතු.

ඒ ආහාරය අනුභවකරනු පිණිස සංස්කරණ අවස්ථාවන්හි සහ විපරිණාම අවස්ථාවන්හි ඇතිවූතාක්කාය චිත්ත පරිශ්‍රම

වනාහි ඒ ආහාරයාගේ දුඃඛ දුඃඛයෝයි මෙසේ ඒ ආහාරය ඒ පුද්ගලයාට දුඃඛ දුඃඛයෙන්ද නිතර පීඩාකරන අන්දම දත යුතු. ඒ ආහාරය ආහාරභාවයට පැමිණීමට ප්‍රථම නටබුන්වීම වසැහෙන ප්‍රත්‍යය එළඹ නටබුන්වී ගියකල ඇතිවන පරිශ්‍රම වනාහි ආහාර බවට පැමිණීමට ප්‍රථම ඇතිවන විපරිණාම දුඃඛයෝයි. ඒ ආහාරය අනුභවකොට දිරවාගත නොහී මරණයට පවා පැමිණෙන තරම් දරුණු ආකාරයෙන් ඇතිවිය හැකි විපරිණාම දුඃඛයෝද නානා රොගාබාධ පැමිණීමෙන් ඇතිවියහැකි විපරිණාම දුඃඛයෝද ආහාරදිරා මලමූත්‍රා කෘත්‍ය අවස්ථාවෙහි ඇතිවියහැකි විපරිණාම දුඃඛයෝද පූර්ව භාගයෙහි කටයුතු සියල්ලක් සම්පාදනයවී ආහාරබවට පැමිණියාසින් පසු විඳින්නට සිදුවන ඒ ආහාරයාගේම විපරිණාම දුඃඛයෝයි. ලෝකයෙහි කියාගෙන එන අන්දමේ හැටියට නම් අනුභවකොට පරගලගතව වර්ණ, සංස්ථාන ගන්ධ, රසවශයෙන් ආහාරයාගේ පෙරළීමම විපරිණාමයයි ගතයුතුවේ.

**මේ කියනලද්දේ සන්තති විපරිණාම දුඃඛලක්ෂණය.**

ක්ෂණික වශයෙන් වනාහි ස්වකීය ස්වකීය උත්පාද ලක්ෂණයෙන් සන්තානයෙහි පහළ වන්නාවූ පෘථිවි ආපො ආදි පරමාණු ධර්ම අසුරු සැණක් පමණද අභිනවාකාරයෙන් සිටිය නොහී ජරාගින්නට අසුවද ක්ෂණයකින් දිරායන්නාහුය. මරණ ගින්නට අසුවද ක්ෂණයකින් අතුරුදන් වන්නාහුය. එසේ ජරාමරණාග්නින්ට අසුව ක්ෂණයකින දිරායාම ක්ෂණයකින් අතුරුදන්වීයාම ක්ෂණික විපරිණාමයයි කියනු ලැබේ. ඒ ක්ෂණික විපරිණාමයට නිතර අසුවදිරමින් නටබුන්වෙමින් පවත්නා පෘථිවි ආපො ආදි පරමාණු ධර්ම ජරාමරණාග්නින්ගේ ශුෂ්ක උපාදාන(දර)මාත්‍රයක් බැවින් ආශ්වාදනීයයෝ නොවෙත්මය. හුදෙක් ක්ෂණයෙන් ක්ෂණය ජරා මරණ ගින්නට අසුවදිරමින් නටබුන් වෙමින් පවත්නා අනාස්වාදනීය විපරිණාම දුඃඛරාශියක්මය නුවණැස් යොමුකොට බලනහොත් පිටත සමින් වසාසිටි කුඩා මහත්වූ ස්කන්ධකායයන් අපරාධ කයන් වධයට පමුණුවන රජුගේ අග්නි අවාට හා සදෘශබවද ඒ ස්කන්ධකායයන්හි අලුතෙන් අලුතෙන් උපදින පෘථිවි ආපො ආදී නාමරූප ධර්මයන් අපරාධ ක්‍රියා හෙතුකොටගෙන අග්නි අවාටයට දමනලද අපරාධකයන්හා සදෘශබවද ක්ෂණයෙන් ක්ෂණය අතුරු සිදුරු නැතිව දැල්වී නගිනජරාමරණාග්නින් ක්ෂණයෙන් ක්ෂණය ඒ අග්නි අවාට පුරවාලමින් නැගඑන්නාවූ අතිරෞද්‍ර ගිනිජාලාවන්හා සදෘශබවද ස්කන්ධකායයන්

පූරවාලමින් ක්‍ෂණයෙන් ක්‍ෂණය අතුරුසිදුරු නැතිව නාමරූප ධර්මයන් පහළකරන්නාවූ “කර්ම, චිත්ත, ඍතු, ආහාර” යන චතුර්විධ ප්‍රත්‍යයන් නිතර අප රාධකයන් අග්නි ආවාටයට ඇදදමන්නාවූ නිලධාරීන් සතර දෙනෙකුහා සදෘශ බවද පෙනියනවා ඇත. පාලියෙහි වනාහි කුශලාකුශල කර්මසඞ්ඛ්‍යාත මනොසඤ්චෙතනාහාරය ළඟට පැමිණි පැමිණි අපරාධකයන් අග්නි ආවාටයට ඇදදමන්නාවූ බලසම්පන්න පුරුෂයන් දෙදෙනකුහා සදෘශයයි අවුත් තිබේ. ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි දල්වී නගින ජරාමරණාග්නිවයෙන් ස්කන්ධශරීර පූරවාලමින් ක්‍ෂණයෙන් ක්‍ෂණය පහළ කරනලද අභිනව අභිනව නාමරූප ධර්මයන් අතුරුදන් කිරීම වනාහි අග්නි ආවාටයට ඇදදමනු ලැබූනාක් අපරාධකයන් අග්නි ජ්වාලාවන් විසින් අලු පමණ කුඩු ඉතිරි නොකොට ක්‍ෂණයෙන් ක්‍ෂණය දවා අතුරුදන් කිරීමහා සදෘශයි.

### මේ කියනලද්දේ ක්‍ෂණික විපරිණාම දුඃඛ ලක්‍ෂණයයි.

සන්තති විපරිණාම ලක්‍ෂණය කිසේද යත?හොත් සත්ත්වයන්ගේ ස්කන්ධකායයන්හි ප්‍රතිසන්ධිග්‍රහණයෙහි පටන් අසූරු සැණක් පමණද නොනැවති නිතර අභිනව අභිනව නාම අභිනව අභිනව රූප පහළවීම පිණිස පූර්වභවයෙහි දාන ශීලාදී සුචරිත කර්ම රැස්කරන අදහසින් දානවස්තු ප්‍රත්‍යවස්තු සපයා වෙහෙසීම් දත්දීම් පෙහෙවස් විසීම් සහ මේ භවයෙහිත් චුතිකර්මජ රූප නිරෝධය අවුරුදුසියයකින් පැමිණේනම් ඒතාක් ස්කන්ධකාය දිගාකරගැනීමට ගන්නා උත්සාහ ව්‍යාපාර දිනපතා අලුතෙන් අලුතෙන් හටගන්නා සුලුවූ ස්කන්ධකායයන්ගේම සංස්කාර දුඃඛයෝයි. දිය ගොඩදෙක්හි හැසිරෙන සත්ත්වයන්ගේ දිනපතා දිවිපැවත්වීමේ බැරෑරුම්කම් අවහිරකම් කෙබඳුදැයි පෙනෙතහොත් ස්කන්ධයන්ගේ සංස්කාරදුඃඛයෙහි බැරෑරුම්කම් අවහිරකම්ද පෙනීයනවා ඇත. මේ භවයෙහි එක දාන කර්මයක් වෙනුවෙන් වස්තුව සැපයීම පිණිස දානය පිළියෙළ කිරීම පිණිස ගන්නා දුක් වෙහෙස මහත්සි ප්‍රත්‍යක්‍ෂවපෙණුනිනම් ලැබී තිබෙන ස්කන්ධකාය පිණිස පූර්ව පූර්ව භවයන්හි විඳිනලද සංස්කාර දුඃඛරාශියද ප්‍රත්‍යක්‍ෂවපෙණීයේමය. ප්‍රතිසන්ධිග්‍රහණයෙහි පටන් අන්තිම චුතිය දක්වා අතර අවුරුදු සියයක් දහසක් ලක්‍ෂයක් කෝටියක් අසඞ්ඛ්‍යයක් ඇතුළත අනන්ත වර්ෂ, මාස, පක්‍ෂ, දින, ඝටිකා, ක්‍ෂණ, ලය, මුහූර්ත, ඇතිවෙත්. ස්කන්ධකාය නටබුන්වීමට අවකාශයක් ඇතිවූවහොත් නොනටබුන්විය

හැකික්ෂණයකියා එකම ක්ෂණයක්ද නැත්තේය. මරණයට අවකාශයක් ඇතිවූවහොත් නොමැරෙණ ක්ෂණයකියා එකම ක්ෂණයක්ද නැත්තේය. නටබුන්වීම මියයෑම ස්වභාවකොට ඇති ස්කන්ධයන්වූ හෙයින් ලෝදපිරීපවත්නා නටබුන්වීමට මරණයට ප්‍රත්‍යය වියහැකි අනන්ත අවකාශයන් ගැන සලකා බැලූකල ඇතිවන උත්සාහව්‍යාපාර භය සන්ත්‍රාසද ස්කන්ධකායයාගේම විපරිණාම දුඃඛයෝයි. එයින් මිදෙනු කැමතිව උත්සාහව්‍යාපාර යොදත්මුත් ඒ කිසිවකටත් උපකාරු නොවී නානාවිධ කැඩුම්, බිඳුම්, පෙරළුම්, රෙදුම්, කැස්තුම්, හිරි, කොර, මර, උණසන්නිපාතාදි අනන්ත විපරිණාම දුඃඛයෝ ඇතිවන්නාහුමය. සම්පතක්හෝ විපතක් පැමිණෙන බවදැනත් බැහැරලියනොහී යාම් ඊම් ආදිය කිරීමෙන් විඳින්නට සිදුවන දුක් ලොභයට වෙෂයට වසගවීමෙන් මානයට වසගවීමෙන් විඳින්නට සිදුවනදුක් මිථ්‍යාදෘෂ්ටියට වසගව ශීතඍතුවෙහි දියට බැසීම් උෂ්ණඍතුවෙහි ගිනිතැපීම් වශයෙන් විඳින්නට සිදුවන දුක් පයඹාපති උද්ග්‍රහණ ප්‍රතිපත්ති පූරණයන්හිදී විඳින්නට සිදුවනදුක් යන ආදිදුක්ද මේ ස්කන්ධකායයාගේම විපරිණාම දුඃඛයෝයි. ක්ෂණික විපරිණාම දුඃඛය යටදවිස්තරකෙළෙමු සංක්ෂෙපයෙන් තම තමන්ට කැමැති ජාතියක් පහළකර ගැනීම පිණිස පැයකට මත්තෙන් දවසකට මසකටමත්තෙන් වර්ෂයකට භවයකට මත්තෙන් පූර්ව පූර්ව පැ, දින, මාස, වර්ෂ, භව, කල්පයන්හි රැස්කරන ලද උත්සාහ දාන ශීල භාවනා සුචරිත දුශ්චරිත මහණවෙස් තවුස්වෙස් ගැනීම් සම්‍යග් ජීවිකා මිථ්‍යා ජීවිකා ආදි කර්ම ඒ තම තමන්විසින් කැමැතිවන ලද ජාතිහුගේම සංස්කාර දුඃඛයෝයි. "සබ්බසඞ්ඛාරාදුක්ඛා" යි වදාරන ලද්දේත් මේ සංස්කාර දුඃඛයමැයි. පූර්වභාගයෙහි සංස්කාර දුක්විඳකර්මරැස්කළ හෙයින්ම අපරභාගයෙහි වකවානුව පැමිණ ඒ ඒ ජාති පහළවී ආකල්හි චිරකාලයක් පවත්වා ගැනීම පිණිස කරනලද ව්‍යායාම් රාශියද සංස්කාරදුඃඛමැයි. ලැබීතිබෙන ඉෂ්ටජාති පරම්පරා බිඳහෙළියහැකි ප්‍රත්‍යයන් සහ අනිෂ්ට ජාති පරම්පරා ඇතිකළහැකි ප්‍රත්‍යයන් පරීක්ෂාකරබලා කල්මත්තෙන් ඒ වෙනුවෙන් උත්සාහ කිරීමේදී ඇතිවියහැකි දුඃඛරාශියද මතු පැමිණිය හැකි විපරිණාමයට භයින් කරනලද උත්සාහයන් බැවින් ස්කන්ධකායයාගේම විපරිණාම දුඃඛයෝයි.

**මේ 'දුක්ඛා' යන නවවෙනි මාතෘකා පදයාගේ විස්තරයි.**

(අනත්තා) මේ කය අභ්‍යන්තරයකොට ගතයුතු හරයක් ඇත්තේ නොවේ යන දශවෙනි මාතෘකාපදයෙහි අනත්ත ශබ්ද

යෙන් වාච්‍යවන්නේ කාය, සරීර, දෙහ, තනු, බිම්බ, ගත්ත, බොන්දි ශබ්ද වලින් වාච්‍යය වන රූපකාය රූපසමූහවූ ආත්මය නොවේ. හුදෙක් "අත්ත සමොපෙමො නත්‍ථි" තමන්ට තමන්හැර අන්‍යප්‍රෙමවන්තයෙක් නැත්තේය. තමන්ගේ පුත්‍රයා අනුන්ගේපුත්‍රයා තමන්ගේ භාය්‍යාව අනුන්ගේ භාය්‍යාව යන ආදීන්හි ඇතුළත පිටත කොටගැනීමෙහි ඇතුළතයයි සලකනු ලබන අර්‍ථයම වාච්‍යවේ. මමයයි කියාගන්නේත් ඒ ඇතුළතයයි සලකනු ලබන ආත්මයමයි. එහෙයින්මමය ආත්මය යනු සමාන ව්‍යවහාරයෝයයි සැල කියයුතු.

යට විස්තර කරනලද නවවිධ මාතෘකා පදයන්ගේ විස්තරය පරිදි අර්‍ථය විත්තාමය බුද්ධියට පෙනීගියකල්හි මමයයි කියා ගන්නාලද 'ආත්මසාර=සත්ත්වසාර' නැතිවී අනාත්ම විද්‍යාමාර්ගය පැහැදිලිවේමය. මහාභූතධාතු සතර 4 ප්‍රසාදධාතුසය 6 විඥාන ධාතුසය 6 යන ශොඩශවිධ ධාතූන්ගේ ධාතුලක්‍ෂණ පෙණුනුකල්හි මමයයි ගන්නා ආත්ම දෘෂ්ටිය පහවෙයි. ඒ ධාතූන්ගේම අනිත්‍යලක්‍ෂණය සහ දුඃඛලක්‍ෂණය පෙණුනු කල්හි මාගේ ධනය මාගේ ප්‍රියාව යනාදීන් ගන්නා ආත්මීය දෘෂ්ටිය පහවෙයි. එසේ පහවී ගිය පුද්ගලයාගේ ආය්‍ය විද්‍යාමාර්ගය කෙළතැන් පැමිණියේනම්වේ. එකල්හි ඒ පුද්ගල තෙම යොගී භාවයෙන්මිදී "තෙවිජ්ජ" භාවයට පැමිණියෙක්ද වන්නේය.

**මේ 'අනත්තා' යන දසවන මාතෘකා පදයෙහි විස්තරයි.**

එත්තාවතාච.

1. කොළම්බ නගරෙ ඉධෙ විසුද්ධාරාමනාමකෙ,
   වසතා මහතො භික්ඛු ගණස්ස ධම්මවාචිනා.

2. **සිරිධම්මාභිධා**නෙන ථෙරෙන හිතකාරිනා,
   නිට්ඨිතා සා සමාරද්ධා **විජ්ජාමග්ගස්සදීපනී.**

3. අනිච්චා අධුවා ඛන්ධා අතිඉත්තරකාලිකා,
   විජ්ජුප්පාදංව ආකාසෙ උප්පජ්ජන්ති වයන්තිච.

4. භුත්වා අනන්තරංඑව විජ්ජුප්පාද නිරුජ්ඣරෙ,
   ඛන්ධාරූපාදයො එතෙ තථා අසාර භාවතො.

5. ඛයධම්මා වයධම්මා සඞ්ඛතා පරිණාමකා,
   **පටිච්ච සමුප්පන්නා ච නසාරෙ කොචි කත්ථචි.**

6. නානා කායික ක්‍රියානං නානා ඉරියා පථානච,
නානා චිත්තාතුභාරානං ඣිජ්ජන්තිපරිවත්තනා.

7. අනිච්චාතෙ ඛයට්ඨෙන දුක්ඛාහොන්ති භයට්ඨතො,
අනත්තා අසාරකට්ඨෙන තථා අවසවත්තනා.

8. එවං විජ්ජං ජනයන්ති හන්ත්වා විජ්ජන්ධකාරකං,
සුඛං විපස්සනා ගබ්භං සීඝංපූරෙතුයොගිනං.

## විද්‍යාමාර්ගී දීපනිය නිමි.

# සංක්‍ෂෙප රූපසඞ්ග්‍රහ වර්ණනාව.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

“රූප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති” යනු සර්වඥයන්වහන්සේ විසින් සංයුත්තනිකායෙහි වදාළ රූපශබ්දයාගේ විග්‍රහ වාක්‍යයයි.

අර්ථ:–භික්ඛවෙ, මහණෙනි! (යංධම්මජාතං), යම් පෘථිවි ආපස්ආදි ස්වභාව ධර්මයෙක්; ඛො, එකාන්තයෙන්; රූප්පති, (ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි බිදී) අතුරුදන්වේද; ඉති,(තස්මා), එසේ (ක්‍ෂණයෙක් ක්‍ෂණයෙක්හි බිදී අතුරුදන්වන) හෙයින්; (තං ධම්ම ජාතං), ඒ (පෘථිවි ආපස්ආදි) ස්වභාව ධර්මයතෙම; රූපන්ති, රූපයයි; වුච්චති, කියනු ලැබේ.

යථෝක්ත විග්‍රහවාක්‍යයෙන් යට වා පොළොව පටන් උඩ අකනිටා බඹලොව දක්වා මේ අතර අනන්තලෝකධාතූන්හි පරමාණු, අණු, තජ්ජාරි, රථරේණු, ලික්ඛා, ඌකා, ධාන්‍ය මාසාදීන්ගේ වශයෙන් නන්වැදෑරුම් රූප සමූහන් රූප පිඩු බවට පැමිණෙමින් පවතින සතාබ්ධඅබන්ධනාදි රූප ධර්ම සියල්ලක් නිතර බිඳෙමින් අතුරුදන්වන සුලූහෙයින් සාමාන්‍යයෙන් රූපයයි වර්ණනාකර වදාරනලදී.

විශේෂලක්‍ෂණවශයෙන් වනාහි:–

1. පෘථිවිය, ආපොය, තෙජය, වායොයයි මහා භූත රූප සතරෙක 4.
2. චක්‍ෂුය, ශ්‍රොත්‍රය, ඝ්‍රාණය, ජිව්හාය, කායයයි ප්‍රසාද රූප පසෙක 5.
3. රූපය, ශබ්දය, ගන්ධය, රසය, ඵොට්ඨබ්බයයි ආලම්බන රූපසතෙක 7.

(මෙහි පෘථිවි, තෙජෝ, වායො මහාභූතත්‍රය ඵොට්ඨබ්බාලම්බනයකොට ගත් හෙයින් ඒ වෙනුවෙන් රූප වැඩිවීමක් නැති බව දතයුතු.)

4. ස්ත්‍රීභාවය, පුරුෂභාවයයි භාවරූප දෙකෙක 2.
5. ජීවිත රූප එකෙක 1.
6. හෘදය වස්තු රූප එකෙක 1.
7. ආහාර රූප එකෙක 1 යන අටලොස 18. ඉපදීමයයි කියනලද ජාතිලක්ෂණයෙන් යුක්තවූහෙයින් කර්මයෙන් උපදනාරූප, චිත්තයෙන් උපදනා රූප, සෘතුවෙන් උපදනාරූප, ආහාරයෙන් උපදනා රූපයයි ස්වකීය ස්වකීය ජනකප්‍රත්‍යයන්ගෙන් වෙනස්කොට කියහැකිවේ. එහෙයින්ම ඒ රූප අටලොස 18 නිෂ්පන්නරූපනම්වූහ.

8. පරිච්ඡෙද රූප එකෙක 1.

9. කායවිඥප්තිය, වාග්විඥප්ති යයි විඥප්ති රූප දෙකෙක 2.

10. ලඝුතාය, මෘදුතාය, කම්මඤ්ඤතායයි විකාරරූප තුනෙක 3.

11. උපචයය, සන්තතිය, ජරතාය, අනිච්චතායයි ලක්ෂණ රූප සතරෙක 4. යන දශය 10. ඒ අටලොස් නිෂ්පන්න රූපයන්ගේම අවස්ථාමාත්‍රව කර්මාදිප්‍රත්‍යයන්ගෙන් හටනොගන්නා හෙයින් අනිෂ්පන්න රූපනම්වූහ.

මෙසෙයින් අටලොස් නිෂ්පන්න රූපයන්ගේද දශ අනිෂ්පන්න රූපයන්ගේද වශයෙන් රූපය විශෙෂයෙන් අටවිසි වැදෑරුම්යයි දතයුතු.

---

## 1. පෘථිවි රූපය.

ලොකයෙහි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සන්තානයන්හි මහජනයාට ප්‍රකටවී තිබෙන ස්තබ්ධ මෘදු ආකාරක්‍රියාමාත්‍රය පෘථිවි රූප නම්වේ. ඒ පෘථිවි රූපය ස්තබ්ධවූ හෝ මෘදුවූ ක්‍රියා මාත්‍රයමූත් පරමාණු පමණද ද්‍රව්‍යයක් නොවේ. සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවයක්ද නොවේ. දැනීමක් ඇඳිනීමක් ඇතිව කෙසගක් පමණද පුද්ගලයකුට වසඟවන සුලුද නොවේ.

පුද්ගලයාතුල මෘදු ලක්ෂණයට පමුණුවා ගනු කැමැත්ත තිබියදීත් ස්තබ්ධ ලක්ෂණයට හිතවූ ප්‍රත්‍යය සාමාග්‍රියක් එලඹ සිටිය හොත් පෘථිවි රූපය ස්තබ්ධභාවයටම පෙරළෙන සුලුය. පුද්ගලයාගේ ස්තබ්ධ භාවයට පමුණුවාගනු කැමැත්ත තිබියදීත් මෘදුභාවයට හිතවූ ප්‍රත්‍යය සාමාග්‍රියක් එලඹ සිටියහොත් පෘථිවිරූපය මෘදුභාවයටම පෙරළෙන සුලුය එහෙයින් මේ පෘථිවි රූපය ධර්මනාමයෙන්ද ධාතු නාමයෙන් ද වදාරනලදී.

ලෞකික මහාජනයාට පෘථිවී රූපය සම්බන්ධව ස්තබ්ධ මෘදුලක්ෂණයන් ගැනදැනීමක් ඇතත් ඒ වෙනම ධාතුමාත්‍රයක කියා පිරිසිඳ දැනීමක් නැත්තේය. එහෙයින් ලෞකික මහාජනයාතුළ ස්වකීය ස්කන්ධකයෙහි ස්තබ්ධවූද මෘදුවූද පෘථිවී ධාතුව කෙරෙහි මමය මාගේයයි ආත්ම ආත්මීය දෘෂ්ටි ග්‍රාහය ඇතිවී තිබේ. ආපො, තෙජෝආදි රූපද මේ පෘථිවී රූපයම නිඃශ්‍රයකොට ගෙන පහළ වන රූපයන් බව දතයුතු

පෘථිවීරූප දහස් ගණන් ලක්ෂ ගණන් එකතුවී පරමාණු, අණු, තජ්ජාරි, රථරේණු ආදි සංස්ථාන ප්‍රඥප්ති භාවයට පැමිණ සන්තානානුබද්ධව ඇතිව නැතිවෙමින් පවත්නා බවද ස්වල්ප පෘථිවීධාතු මාත්‍රයක්වීනම් සටහන් බවට පැමිණ ගත නොහී ක්ෂණයකින්ම අතුරුදහන් වියහැකි බවද දතයුතු.

---

## ආපො රූපය.

ලොකයෙහි සවිඥානක අවිඥානක සංස්ථානව පෙනී යන රූප පිඩුවල මහාජනයාට ප්‍රකටවී තිබෙන ආබන්ධන පග්ඝරණාකාරක්‍රියාමාත්‍රය ආපොරූප නම්වේ. ඒ ආපොරූපයද ආබන්ධන ලක්ෂණ හෝ පග්ඝරණ ලක්ෂණවූ ක්‍රියා මාත්‍රයමුත් පරමාණු පමණද ද්‍රව්‍යයක් නොවේ. සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවයෙක්ද නොවේ. දැනීමක් ඇඳිනීමක් ඇතිව කෙසගක් පමණද පුද්ගලයකුට වසගවන සුළුද නොවේ.

පෘථිවී තෙජො ආදි සෙසු රූප එකට බැඳී පරමාණු, අණු, තජ්ජාරි, රථ රේණුන්ගේ පටන් පෘථිවි පර්වත ආදි විශාල වස්තූන්දක්වා නොයෙක් ආකාරයෙන්කුඩුමහත් සටහන්ව පෙනීයන්නේ මේ ආපො රූපයාගේ ආබන්ධන කෘත්‍යයේ බලයෙනි. ලොකයෙහි ආපොරූපය සම්පූර්ණයෙන් නිරුද්ධවූවහොත් පරමාණු පමණද රූප සටහනක් රූපපිඩක් ඇතිවිය හැකි නොවේ.

---

## තෙජො රූපය.

ලොකයෙහි සවිඥානක අවිඥානක සන්තානයන්හි මහජනයාට ප්‍රකටවී තිබෙන සිහිල් උණුසුම් ආකාරක්‍රියා මාත්‍රය තෙජොරූප නම්වේ. ඒ තෙජො රූපයද සිහිල් ලක්ෂණ උණුසුම් ලක්ෂණ ක්‍රියා මාත්‍රයමුත් පරමාණු පමණද ද්‍රව්‍යයක් නොවේ. සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවයෙක්ද නොවේ. දැනීමක් ඇඳිනීමක් ඇතිව කෙසගක් පමණද පුද්ගලයකුට වසගවන සුළුද නොවේ.

කිකිළිබිත්තරයෙහි ස්වරස (මදය) මවු කිකිළි විසින් ස්වකීය ශරීර උෂ්ණයෙන් උණුසුම් ගන්වමින් රක්ක කල්හිම මුහුකුරා අත්තාවූ කකුල් ආදි අඟපසඟ සෑදී පැටවා බවට පැමිණෙන්නේය. ඉදින් මවු කිකිළි විසින් උණුසුම් ගන්වා නොරකින ලද්දේවීනම් ඒ ස්වරස කුණුවීයන්නේය. එපරිද්දෙන් පෘථිවී ආපෝ ආදී රූපද තේජෝ රූපයෙන් උණුසුම් ගන්වා රක්ක කල්හිම සනබ්ධ ආබන්ධනාදී ඒ ඒ ලක්ෂණයෙන් මුහුකුරා ශක්ති සම්පන්නාව ප්‍රතිග්‍රහණ උපබෘහනාදී ස්වකීය ස්වකීය කෘත්‍යසම්පාදනයෙහි සමර්ථවන්නාහුය. පෘථිවී රූපය ප්‍රතිග්‍රහණ කෘත්‍යයෙහි සනබ්ධ ලක්ෂණයෙන් මුහුකුරා ශක්තිසම්පන්නාවන්නේත් ආපෝ රූපය උපබෘහන කෘත්‍යයෙහි ආබන්ධන ලක්ෂණයෙන් මුහුකුරා ශක්ති සම්පන්නා වන්නේත් වායෝ රූපය සමුදීරණ කෘත්‍යයෙහි විෂ්ටම්භන ලක්ෂණයෙන් මුහුකුරා ශක්තිසම්පන්නා වන්නේත් මේ තේජෝ රූපයාගේ උණුසුම්ගන්වා ආරක්ෂා කිරීමේබලයෙන්මය. එහෙයින් මේ තේජෝ රූපයඅන්‍ය රූපයන්ගේ මාතෘ රූපයද වෙයි. පිතෘ රූපයද ගුරුවර රූපයද රාජරූපයද වෙයි.

තේජෝ රූපය කෙසේනම් අන්‍යරූපයන්ගේ මාතෘ රූපය වන්නේද? යත්. ලොකයෙහි පුත්‍ර දුහිතෘන් මවුගෙන් හට ගෙන මවුගේ පෝෂණයෙන් දියුණුවන්නාක්මෙන් පෘථිවී ආපෝආදී රූපද තේජෝ රූපයෙන් හටගෙන තේජෝ රූපයාගේ පෝෂණයෙන්ම දියුණුවන්නාහුය. මේ කියන ලද්දේ තේජෝ රූපය අන්‍යරූපයන්ගේ මාතෘ රූපය වන අන්දමයි.

තේජෝ රූපය කෙසේනම් අන්‍ය රූපයන්ගේ පිතෘ රූපය වන්නේද යත්?. පුත්‍ර දුහිතෘන් පියාගෙන් ලබනලද සඞ්ග්‍රහ ඇතිව දියුණුවන්නාක්මෙන් පෘථිවී ආපෝ ආදී රූපද තේජෝ රූපයෙන් උණු සිසිල් ගැන්වීම් ආදියෙන් ලබනලද සඞ්ග්‍රහ ඇතිවම දියුණුවන්නාහුය. මේ කියන ලද්දේ තේජෝ රූපය අන්‍යරූපයන්ගේ පිතෘ රූපය වන අන්දමයි.

තේජෝ රූපය කෙසේ නම් අන්‍ය රූපයන්ගේ ගුරුවර රූපය වන්නේද?යත් ගුරුවරයා නොහික්මුණු ශිෂ්‍යයන් හික්මුණු ශිෂ්‍යයන්කොට නූගත් ශිෂ්‍යයන් උගත් ශිෂ්‍යයන් කොට නොදැමුණු ශිෂ්‍යයන් දැමුණු ශිෂ්‍යයන්කොට හික්මවන්නාක්මෙන් තේජෝරූපයද අකර්මණ්‍ය රූපයන් කර්මණ්‍ය රූපයන්කොට නොදැමුණු රූපයන් දැමුණුරූපයන්කොට නොමට නොසිලිටු රූපයන් මට සිලුටු රූපයන්කොට නොමුහුකළ රූපයන් මුහුකළ රූපයන්කොට නොදැඩි රූපයන්

දැඩි රූපයන්කොට නොතියුණු රූපයන් තියුණු රූපයන් කොට හික්මවන්නේය. මේ කියනලද්දේ තෙජො රූපය අන්‍ය රූපයන්ගේ ගුරුවර රූපය වන අඳැමයි.

තෙජො රූපය කෙසේනම් අන්‍ය රූපයන්ගේ රාජරූපය වන්නේද? යත්. රජහු රටුන්ට සඞ්ග්‍රහකළ යුතු අවස්ථාව පැමිණි විට වස්ත්‍ර දීම් තනතුරු දීම් ආදියෙන් සඞ්ග්‍රහද දඬුවම් පැමිණවිය යුතු අවස්ථාව පැමිණි විට දඩමුඩ පැමිණවීම් හිර අඩස්සියේ තැබීම් අත්පා කැපීම් ආදියෙන් දඬුවම්ද කරන්නේය. එමෙන් තෙජො රූපයද සවිඥනක අවිඥනක සන්තානයන්හි අන්‍යරූපයන් ක්ෂණයෙක් ක්ෂණයෙක්හි උණුසුම්ගන්වා තවමින් දියුණුද කරයි ක්ෂණයෙක් ක්ෂණයෙක්හි අන්‍යරූපයන් දවමින් නටබුන්ද කරයි. මේ කියන ලද්දේ තෙජො රූපය අන්‍යරූපයන්ගේ රාජ රූපය වන අඳැමයි.

ලෞකික ධාතු ශාස්ත්‍රඥයෝද රසදිය ලෝහ ආදී සාරධාතූ වර්ගී ක්ලිෂ්ට ඖදාරික ගති පහකොට ශුද්ධ කරගනු කැමැත්ත ඇතිවූ කල්හි මූල භෛෂජ්‍යාදින් සමඟ සංයොගකොට මේ තෙජො රූපය ලවා ඒ ක්ලිෂ්ට ඖදාරික ගති පහකොට ඒ රසදිය ලෝහ ආදී සාර ධාතු වර්ගී ශුද්ධ කරගන්නාහුය. එහෙයින් රසදිය ලෝහ ආදී ධාතූන්ගේ ක්ලිෂ්ට ඖදාරික ගති පහකොට ශුද්ධ කරන්නාද මේ තෙජො රූපය මැයි.

සත්ත්වශරීරයෙහිද මේ තෙජො රූපයාගේ ලක්ෂණ තේරුම්ගෙන ඊට ගැලපෙන පරද්දෙන් කෑම් බීම් ඉඳුම් හිටුම් ආදිය පවත්වත්නම් දීර්ඝායුෂ්කතාදි ඵල භුක්ති විඳිය හැකිවේ. අනමතග්‍ර සංසාරය මුළුදූ චක්‍රවාල පෘථිවී පර්වත සාගර චන්ද්‍ර සූර්‍ය්‍ය නක්ෂත්‍ර තාරකාදී කල්පොපකරණ මවා දියුණු කළ මැවුම්කාරයාද මේ තෙජො රූපය මැයි ඒවා විනාශ කළ කතෘද මේ තෙජො රූපයමැයි.

---

## වායො රූපය.

ලොහො ගුලිලොහොදිය ගිනි අඟුරු ආදී උෂ්ණවස්තූන්හි උෂ්ණවෙගයක්ද අයිස් පිනි ආදී සිසිල් වස්තූන්හි සිසිල් වෙගයක්ද විද්‍යමානයි. ඒ වෙගය ලොහොගුලි ලොහොදිය ගිනි අඟුරු අයිස් පිනි ආදී වස්තූන්හි පමණක් නොව සියලුම වස්තූන්හි ඒ ඒ වස්තූන්ගේ ප්‍රමාණයේසැටියට විද්‍යමානමය.

ඒ වේගය වායො රූපයයි කියනලදී. මෙසේකියනලදනයින් තෙජොරූපයෙහි වේගයක් විද්‍යමානනම් පෘථිවී ආපො රූපයන්හිද ඒ වේගය විද්‍යමාන වියයුතු.

එහෙයින් පෘථිවී ආපස් තෙජස් සඞ්ඛ්‍යාත ත්‍රිවිධරූපයන්හිම විද්‍යමානවූ ඒ උෂ්ණ සිසිල් වේගය වායො රූපයයිදතයුතු.

ඇල, දොල, ගං, හෝ ආදියෙහි ජලස්‍යන්දනයද රළවේගයද ඒ වායො රූපයාගේම කෘත්‍යයකි. ආපො රූපය ඉතා බරරූපයක් බැවින් ඇල දොල ගංහෝ ආදියෙහි ජලයෙහි ආබන්ධන කෘත්‍යයෙන් බැඳගැනීමට තරම් ඝනබද්ධ ලක්ෂණ පෘථිවියක් නැතිව ඒ ජලය මිටි තැන් කරා බැස්යාම ධර්මතාවවීතිබේ. වායො රූපයාගේ විජෘම්භණයට ස්ථානයනම් ආකාශ කුහරයයි. ජලයෙහි ගලායාමද ඒ ජලාභ්‍යන්තරයෙහි පහළවන තෙජො රූප වේගයවූ සුළඟින් තල්ලුකරන ලදින් අභිනව අභිනව ආපොඋත්සන්න රූප කලාප දෙශාන්තරොත්පත්ති වශයෙන් ඉපදී ඉපදී තල්ලුවියාමයි. ඒ එසේමය. ආපොරූපයෙන් තල්ලුකරනලද වායොරූපය පිටවීමට දැගලීමෙන් ආපොරූපයත් සමගම පහතට බරවියන්නේය. එසේ බරවීයාමෙන් ඇල දොල ගංහෝ ආදියෙහි ජලස්‍යන්දනය වන බව දතයුතු. එහෙත් ආපො රූපයට වායො රූපයාගේ අභ්‍යන්තරයෙහිමුත් පෘථිවී රූපයාගේ අභ්‍යන්තරයෙහි විජෘම්භණයට අවකාශයක් නැත්තේය. සමහර ආචාර්ය කෙනෙක් පෘථිවී රූපය වායො රූපයටද තෙජො රූපය ආපො රූපයටද විරුද්ධයයි කියත් ඒ විරුද්ධයද පෘථිවී තෙජො ආදී ඒ ඒ රූපඋත්සන්නකොට්ඨාසයන්හිම ඇති වන වෙනසකි. එහෙත් පෘථිවී, ආපො, තෙජො, යන ත්‍රිවිධ රූපම වායො රූපය බල කොටගෙන තම තමන් අයත් කිස ඉටු කිරීමෙහි පොහොසත් වන්නෝය.

ලොකයෙහි වායො රූපය අතුරුදන්වීනම් පෘථිවී, ආපො, තෙජො රූපද බලසුන්ව ක්ෂණයකින් අතුරුදන්වන්නාහුය. සත්ත්වයාසම්බන්ධ ඒ ඒ ශරීරාඞ්ගයන්ගේ සැළිමද අඞ්ගමඞ්ගානුසාරී චිත්තජ වායො රූපයාගේම කෘත්‍යයකි යම් වේලාවක යම් ශරීරාඞ්ගයක් සලනු කැමැතිවීනම් ඒ වේලාවෙහි ඒ ශරීරාඞ්ගය සැලීමට තරම් උත්සාහවත්වූ ජවනචිත්තවීථි උපදිමින් පහළකරනු ලබන වායො රූපයෙන් ඒ ශරීරාඞ්ගයට වැටී තිබෙන නහරකුහර ක්ෂණයකින් පරිපූර්ණවෙයි. විදුලි පණිවුඩ යැවීමේදී "කොළඹ" විදුලි කන්තෝරුවේ සවිකර තිබෙන විදුලි යන්ත්‍රයේ ඇණියට ඇඟිල්ලෙන් තට්ටු කළ

කල්හි "ගාල්ල, මහනුවර, කල්කට්ටා, එංගලන්තාදි" නගර දක්වා ඇද තිබෙන විදුලි කම්බි ක්‍ෂණයකින් වායො රූප යෙන් පිරීයන්නාක් මෙනි. විදුලි යන්ත්‍රයේ ඇණයට ඇඟිල් ලෙන් තට්ටු කිරීම් ව්‍යාපාර වේගය සමගම එහි නැග සිටි වායො රූප පරම්පරාව නිරුද්ධවන්නාක්මෙන් ඒ ඒ ශරීරාඞ්ග සැලීමෙහි පොහොසත්වූ වායො රූප නැගිටවූ චිත්ත වීථීන් සමග ඒ ඒ ශරීරාඞ්ගයන්හි නැගී සිටි අඞ්ගමඞ්ගානුසාරී චිත්තජ වායො රූපද ක්‍ෂණයකින් නිරුද්ධවන්නාහුය.

මෙසේ වන වෙනස සාමාන්‍ය මනුෂ්‍යයෝද දනිත්මුත් ඒ පූර්‍ණ චිත්තජ රූපයන්ගේ නිරෝධයෙන් වන අභිනව චිත්තජ රූපයන්ගේ පහලවීමක කියා පිරිසිඳ නොදනිත්.

ඒ අඞ්ගමඞ්ගානුසාරීවායො රූපයාගේ කෘත්‍යයවූ අධ්‍යාත්මික රූපයන්ගේ සැලීම දැක ඒ රූප සත්ත්වයෙක පුද්ගලයෙක යනාදීන් වරදවා ගැනීමද මේ සත්ත්වයන්ට ඇතිවී තිබෙන් නේ ඒ වායො ධාතු කෘත්‍යයාගේම අනුභාවයෙනි.

---

## 2. ප්‍රසාද රූප පස.

චක්‍ෂුඃප්‍රසාද රූපය ඇස්තරුව තුළද ශ්‍රොත ප්‍රසාද රූපය කන්සිදුරතුළද ඝ්‍රාණප්‍රසාද රූපය නැහැ සිදුරතුළද ජිහ්වා ප්‍රසාද රූපය දිවමැදද කායප්‍රසාද රූපය සකල ශරීරය සිසාරා සැම තැනමද පිහිටා තිබේ. මේ රූපපඤ්චකය කර්‍මජ මහාභූතයන්ගේ කාන්තියව ප්‍රසාද රූපනම්වේ. පාලියෙහි "පසාද, පසන්න, අච්ඡ, මණ්ඩ" යන නම් සතරින් ඒ කාන්තිය ප්‍රකාශිතයි. දූව ලොහො ආදියෙන් භාණ්ඩ වගී සාදා මට සිලුටුකොට මැද්ද කල්හි ඒ භාණ්ඩ වගීවල සහ බොරගතිය පහව පැහැදුණු ජල තෙල් රසදිය ආදි වස්තු වගී වල ඉදිරි යෙහි සිටින්නවුන්ගේ ඡායාව වැටෙන තරමට දිලෙන කාන්තියමෙන් සත්ත්වශරීරයෙහි කර්‍මජපෘථිවිධාතු ආපො ධාතුන්හිද කාන්තියක් ඇත්තීය. ඒ කාන්තිය ප්‍රසාද රූපයයි කියන ලදී.

නැවත නැවත පිහිරා දලගති අවුල්ගති පහකොට පිරිසිඳු කරගන්නාලද කපු පුළුන් සැහෙන තරමකටගෙන නැවත නැවත උණුකොට බොර ගතියපහකොටපිරිසිඳු කරගන්නා ලද තලතෙලේ දමා සියලු අවයව සම්පූර්‍ණකොට මැටියෙන් හෝ දැවයෙන් ඉදි කරනලද රූපයක මට සිලුටු ආකාරයෙන් ඒ කපු පුළුන් ආලෙපකර බලනු. කපු පුළුන් කාන්තිමත්ව

දිලියෙනාකාරයෙන් පෙනී යනවා ඇත. මේ ශරීරයෙහි කම්මජ පෘථිවි ආපො රූප දෙවර්ගය මේ උපමාවෙහි කී කපු පුළුන් හා සදෘශයි. පඤ්චප්‍රසාද රූප එහිවූ කාන්තිය හා සදෘශයි. ඒ ප්‍රසාද රූප පඤ්චකයද චක්‍ෂුර්විඥෙය නොවේ හුදෙක් වර්ණ ශබ්ද ගන්ධ රස ප්‍රෂ්ටව්‍යයන පඤ්චාලම්බනච්ඡායාවන් වැටෙන තරමට දිලෙන කාන්ති පඤ්චකයක් බැවින් මනොවිඥෙයමවේ.

මනුෂ්‍ය ගො මහිෂ පෘථිවී පර්වත චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකාදිවූද ගෘහ විමාන වස්ත්‍රාභරණාදිවූද ගිනිරැස් ඉරුරැස් සඳරැස් තරුරැස් මිණිරැස් ආදිවූද ප්‍රාණය ඇති නැති දූව් සටහන් දූව් අරමුණු සෙව නැලි වගී සියල්ලක් චක්‍ෂුඃ ප්‍රසාදයෙහි ඝට්ටණයට පැමිණෙන්නේය. ඒ ඝට්ටණයද හෙන පහරක් සේ අතිශයින් බලවතරවේ. එහෙයින් ඒ ඝට්ටණයෙන් ඇතිවන ජවන් සිත් අනුරාවය බොහෝ වේලාවක් සන්තතිය නොසිඳ පවතින්නේය. එකපහරක් ඝණ්ටාදිවවැදීමෙන් ඇතිවන්නාවූ ඝණ්ටා අනුරාවය බොහො වේලාවක් සන්තතිය නොසිඳ පවත්නාක් මෙනි. ආලම්බන ඝට්ටණ වෙගය දුර්වල නම් ජවන් සිත් ගණන ස්වල්පවේ. දැක්කා නොදැක්කා මෙනැයි කියයුතු තරමට ස්වල්පවේ. එසේ ඇතිවන දැකීමද ආලම්බනච්ඡායාවන්ගේ ප්‍රසාදඝට්ටණයෙන් වන කම්පාවක් මෙන් ජවනොත්පත්ති මාත්‍රයක කියා පිරිසිඳ දැනීමක් නැති හෙයින් මේ සත්ත්වයන්ට "මමදක්නෙමි" යන වැරදි වැටහීම ඇතිවී තිබේ. ඝණ්ඨා ප්‍රහාර වේගය සමගම ශබ්ද රූප අනුරාවය නිරුද්ධවන්නාක්මෙන් ආලම්බනයන්ගේ ප්‍රසාද ඝට්ටණවෙගය සංසිඳීම සමගම තත්සමුත්පිත විඥාන චිත්ත ජවන චිත්ත සන්තතීහුද නිරුද්ධව සංසිඳියන්නාහුවෙත්.

ශ්‍රොත්‍රප්‍රසාදයෙහි මිනිස් තිරිසන් දිය සුළං හෙන ශබ්දාදි ශබ්ද සෙවනැලිද ඝ්‍රාණප්‍රසාදයෙහි නානාවිධ ඉෂ්ටානිෂ්ට ගන්ධ සෙවනැලිද ජිව්හා ප්‍රසාදයෙහි නානාවිධ ලොණම්බිලාදි රස සෙවනැලිද කායප්‍රසාදයෙහි නානාවිධ තද මොලොක් පෘථිවි ශීත උෂ්ණ තෙජෝ විස්තම්භන සමීරණ වායො සඞ්ඛ්‍යාත ත්‍රිවිධ ප්‍රෂ්ටව්‍ය සෙවනැලිද ඝට්ටණය වන්නාහුය.

මේ සතරෙහිද ආලම්බන ඝට්ටණාකාරය චක්‍ෂුඃ ප්‍රසාදයෙහි කී නයින් දතයුතු. චිත්තසන්තතීද ශබ්දාලම්බනය ශ්‍රවණය කරන චිත්තසන්තතිය, ගන්ධාලම්බනය ආඝ්‍රාණය කරන චිත්තසන්තතිය, රසාලම්බනය ආස්වාද කරන චිත්ත සන්තතිය, ප්‍රෂ්ටව්‍යාලම්බනය ස්පර්ශකරන චිත්තසන්තතිය කියා

බෙදා ගතයුතු. සණ්ඨාප්‍රහාරෙපමාවද වාරයක් පාසාම යොදාගත යුතු. සාමාන්‍ය මනුෂ්‍යයෝ මේ ප්‍රසාද පඤ්චකයද තදාශ්‍රයෙන් උපදින විඥානපඤ්චකයද ඇසට පෙනෙන්නේය, කනට ඇසෙන්නේය, නැහැයට ගඳ සුවඳ දැනෙන්නේය, දිවට රස දැනෙන්නේය, ශරීරයට ස්පර්ශ දැනෙන්නේයයි ගන්නා පමණමුත් වෙනම උපදින ධාතූන්යයි පිරිසිඳ නොදනිත්. එසේ පිරිසිඳ නොදන්නා හෙයින්ම චක්ෂුඃප්‍රසාදය මමයයි ගෙන මම දක්නෙමියි චක්ෂුඃප්‍රසාදයෙහි ආත්මදෘෂ්ටික වන්නාහුය. ශ්‍රොත්‍රප්‍රසාදය මමයයි ගෙන මම ශ්‍රවණයකරමියි ශ්‍රොත්‍රප්‍රසාදයෙහි ආත්මදෘෂ්ටික වන්නාහුය. ඝ්‍රාණප්‍රසාදය මමයයි ගෙන මම ආඝ්‍රාණය කරමියි. ඝ්‍රාණප්‍රසාදයෙහි ආත්මදෘෂ්ටික වන්නාහුය. ජිව්හාප්‍රසාදය මමයයි ගෙන මම රස දනිමියි ජිව්හාප්‍රසාදයෙහි ආත්ම දෘෂ්ටික වන්නාහුය. කායප්‍රසාදය මමයයිගෙන මම ස්පර්ශදනිමියි කායප්‍රසාදයෙහි ආත්ම දෘෂ්ටික වන්නාහුය. එසේ ගෙන ආත්මදෘෂ්ටිකයන් වන නමුත් මේ පඤ්චප්‍රසාදයන්හිද පුද්ගලයක සත්ත්වයක ජීවයක ස්වාමියක කියා නැත්තේය. දැනීමක ඇඳිනීමක කියාද නැත්තේය. හුදෙක් මේ පඤ්චප්‍රසාදද නිස්සත්ත්ව නිර්ජීව අව්‍යාකෘත ධාතු මාත්‍රයෝමය.

---

## 3. අරමුණුරූ සත.

වර්ණය, ශබ්දය, ගන්ධය, රසය, ප්‍රෂ්ටව්‍යය යන 7 සත අරමුණු රූපයයි කියන ලදහ. (ප්‍රෂ්ටව්‍යාලම්බනය පෘථිවිය තෙජොය වායොයයි තෙවැදෑරුම්වන හෙයින් අරමුණුරූප සතයයි කියන ලදහ) ඔවුන් අතුරෙන් වර්ණය චක්ෂුඃ ප්‍රසාදයෙහිද ශබ්දය ශ්‍රොත්‍රප්‍රසාදයෙහිද ගන්ධය ඝ්‍රාණප්‍රසාදයහිද රසයජිහ්වා ප්‍රසාදයෙහිද ප්‍රෂ්ටව්‍යය කාය ප්‍රසාදයෙහිද වැද ගන්නේය. ඝට්ටණයවන්නේයි සේයි. ආපො රූපය ආපො උත්සන්න ජලයට බැසදස්පර්ශකරවා ගතහැකි රූපයක් නොවේ. එහෙයින් ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහිලා නොවදෑරනලදි. ජලය ආපොඋත්සන්න කොට්ඨාසයකි එහෙයින් එහි පෘථිවි රූපකැපිව ඝන බඩ භාවයට පැමිණගත නොහෙන්නෝයහ. මනුෂ්‍යයෝ ජලය ස්නානාදි කාලවල ශරීරයෙහි ස්පර්ශවන්නේයයි හගිත්මුත් එහි ඝට්ටණ ලක්ෂණය පෘථිවි ස්පර්ශය මුත් ආපො ස්පර්ශයක් නොවේ. උණු සිසිල් ස්පර්ශයද තෙජො ස්පර්ශය මුත් ආපො ස්පර්ශයක් නොවේ. ජලයට බැස පරීක්ෂා කාරීව සිටිතහොත් ශරීරයට තල්ලු වන ආකාරදැනීමක් ඇතිවේ.

ඒ තල්ලු වන ආකාරයද වායො ස්පර්ශය මුත් ආපො ස්පර්ශයක් නොවේමය. එහෙයින් ආපො රූපය හැර ඉතිරි පෘථිවි, තේජො, වායො යන රූපත්‍රයම ප්‍රෂ්ටව්‍යාලම්බනයකොට වදාරන ලදි.

මෙසෙයින් වර්ණය, ශබ්දය, ගන්ධය, රසය පෘථිවි තෙජො වායො ප්‍රෂ්ටව්‍යත්‍රයයි අරමුණු රූප සතෙක. ගොචර රූප යනුද මීටම නම්වේ. මේ සප්තවිධ ආරම්මණ රූපයන් කෙරෙහි මේ සත්වයෝ දරුණු තියුණු අතිශය බලවතර තෘෂ්ණා ආලයකින් බැඳී ගෙනි වාසය කරන්නාහුය. මේ සප්තවිධ ආරම්මණ රූපයන් කෙරෙන් වෙන්වූ කල සත්වයන්ගේ සිත අසරණ වෙයි දිළිඳු වෙයි මලානිකවෙයි. රූප කාම ගුණය, ශබ්ද කාම ගුණය, ගන්ධ කාම ගුණය, රස කාම ගුණය, ප්‍රෂ්ටව්‍ය කාමගුණයයි කියනු ලබනේත් මේ ආරම්මණ රූප සප්තකයයි. මේ ආරම්මර රූප 7 සත ප්‍රසාද රූප 5 පස හා පිඩුකරනු. රූප 12 දොළොසෙක. ඒ 12 දොළොස සත්වයන්ට ප්‍රකට බැවින් ඖදාරික රූපයයි වදාරන ලදහ. ආපො රූපය අබන්ධන කෘත්‍යයෙන් ප්‍රකටවූවද පඤ්චෙන්ද්‍රියයන්ට විෂය වන රූපයක් නොවේ. ශුද්ධ මනො විඥානයටම විෂය වන රූපයකි. එහෙයින් ආපො රූපය සූක්ෂ්ම රූපයන්හි ලා වදාරනලදි මෙතෙකින් ආපො රූපය සමග ඖදාරික රූප 12 දොළොස කියා නිමවන ලදහ.

---

## 4. ස්ත්‍රී පුරුෂ භාව රූප දෙක.

ගැනු බව ස්ත්‍රීභාව රූපයයිද පිරිමි බව පුරුෂභාව රූපයයිද කියන ලදි. පෘථිවි රස ආපො රස බීජ යන ත්‍රිවිධ ධාතූන්ගේ අභිසංස්කරණයෙන් ලොකයෙහි වෘක්ෂ ලතා පහළව දියුණුවීමෙහි බීජධාතුවට අයත්වන්නේ පළමුකොට අඞ්කුරය ඉපදවීම පමණයි. අඞ්කුරය ඉපදී මුල් ඇදගත් පසු බීජය දිරා අතුරුදන්වෙයි. එතැන් පටන් පෘථිවි ආපො රස ධාතූහුම එය දියුණු කරමින් වෘක්ෂලතා භාවයට පමුණුවා අවුරුදු සියදහස් ගණන් මුළුල්ලෙහි පවත්වාගෙනයන්නාහුය. අඞ්කුරය ඇදගත් පසු දියුණුව පෘථිවි රස ආපො රස ධාතූන්ටම අයත්වේ. බීජනියාම ධාතුවට අනුගතවීම වනාහි වෘක්ෂ ලතා දිරා අතුරුදන්වනතුරුද අත් නොහරීමය. එහෙත් ඒ පෘථිවි රස ආපො රස ධාතූන්ට වෘක්ෂලතාවන්ගේ දියුණුව මුත් සංස්ථාන අභිසංස්කරණය'කළ හැකි නොවේ.

ඒ ඒ වෘක්‍ෂලතාවන්ගේ අඞ්කුර, මුල්, පොතු, එළේ, අරටු අතු, රිකිළි, කොළ, මල්, ගෙඩි සටහන් සමග වර්‍ණ ගන්‍ධ රසා දියද එක වර්‍ගයකට එකවර්‍ගයක් වෙනස්ව ඇතිවන්නේ බීජ නියාම බලයෙනි බීජ නියාම ආඥාවෙනි. අඹ බීජයෙන් හට ගන්නා අඹ වෘක්‍ෂය බීජය දිරා අතුරු දන්වූ පසුද අවුරුදු සියදහස් ගණන් මුළුල්ලෙහි වැවෙමින් පවත්නා නමුදු අඹ සටහන අඹ ආකාරය අත් නොහරීමය. වැරදිවත් අඹ ආකාරයෙන් අඹ සටහනින් එක කොළයක් එක ගෙඩියක් එක මලක් පමණද ඇති නොකෙරේමය. වෘක්‍ෂ ලතා සම්බන්‍ධ දීර්‍ඝමන්‍දශුෂ්කතාවද මේ බීජනියාම බලයෙන්ම සිද්ධවන බව දත යුතු. මෙසෙයින් බීජ ධාතුන්ගේ ආඥාචක්‍රයේ විශාලතාවය ලෙව්හි අතිශයින් ප්‍රකටය.

සත්ත්වයන්ගේ ප්‍රතිසන්‍ධි කාලයෙහි මවු පිය දෙදෙනාගෙන් ඇතිවන ශුක්‍ර ශ්‍රොණිත ජන්‍ම නියාම ධාතුබලය ජන්‍මනියාම ධාතු ආඥාවද මේ වෘක්‍ෂ ලතාවන්ගේ බීජනියාම බලය බීජ නියාම ධාතු ආඥාව හා සදෘශවේ. ඒ එසේමය මවු පිය දෙදෙනාගෙන් ඇතිවන ශුක්‍ර ශ්‍රොණිත ජන්‍ම නියාම ධාතු බලයට ජන්‍ම නියාම ධාතු ආඥාවට යටත්වම පුත්‍ර දුහිතෘන්ගේ ශීර්‍ෂ, හස්ත, පාද, හෘදය, සම්, මස්, නහර, ඇට, හොඬු, නගුටු, කරමල්, ලොම්, පියාපත්ආදි ශරීරාඞ්ග සංස්ථාන සහ කළු, නිල්, කහ, රතු ආදි වර්‍ණ ධාතුද ප්‍රඥා, වීර්‍ය්‍ය, චිත්ත, චෙතනාදි අරූපී ධර්‍මද ඇති වන බවප්‍රත්‍යක්‍ෂය. පුත්‍ර දුහිතෘන්ගේ මරණයදක්වා පවත්නා ඒ වර්‍ණසංස්ථානාදිය සහ ප්‍රඥා වීර්‍ය්‍යාදි ගුණ ගති මවුපිය දෙදෙනාගෙන් මුහුවූ ශුක්‍ර ශ්‍රොණිත බීජ නියාම ආඥාවට කීකරුවමුත් අකීකරුව ඇති නොවන්නාහුමය. එහෙයින් සත්ත්වයන්සම්බන්‍ධ ශුක්‍ර ශ්‍රොණිත ජන්‍ම නියාම ධාතුන්ගේ ආඥාචක්‍රයේ විශාලතාවද ලෙව්හි ප්‍රකටය.

මෙසේ වෘක්‍ෂලතාවන් පිළිබඳවූද සත්ත්වයන් පිළිබඳවූද බීජනියාම ජන්‍ම නියාම ධාතූන් මෙන් සත්ත්වයා පිළිබඳවූ ගැහැනු පිරිමි සටහන් සංස්කරණය කරන්නාවූ භාවරූපද්වය ප්‍රතිසන්‍ධික්‍ෂණයෙහිම ඇතිවී ස්ත්‍රීසන්තාන පුරුෂසන්තානවයෙහි චතුජ රූපසන්තතීන් ආණ්ඩු මට්ටු කරගෙන යන ආකාරය දතයුතු. ඒ ස්ත්‍රී පුරුෂ සන්තානවයෙහි ඇතිවනතාක් රූප ඒ භාව රූපයන්ගේ ආඥා බලයට යටත්වම ඇතිවන්නාහුය. ස්ත්‍රී පුරුෂ සන්තානද්වය දියුණු කරන්නෝ නම් කර්‍ම චිත්ත ඍතු ආහාර යන චතුර්විධ ප්‍රත්‍යයෝයි. භාවරූපයන්ට ස්ත්‍රී පුරුෂසංස්ථාන සංස්කරණයමුත් ස්ත්‍රීපුරුෂ සංස්ථානයන්

පොෂ්‍යකොට දියුණු කිරීමෙහි පොහොසත් කමක් නැත්තේය. ප්‍රතිසන්ධි ක්ෂණයෙහි ජනක කර්මය විසින් ස්ත්‍රී පුරුෂ සංස්ථාන නිර්මිත කිරීමේදී යම් සංස්ථානයක් ස්ත්‍රීභාව රූපයෙන් යුක්තකොට නිර්මිතකරනු ලැබීනම් ඒසංස්ථානය ස්ත්‍රී ආකාරයෙනුත් යම් සංස්ථානයක් පුරුෂ භාවරූපයෙන් යුක්තකොට නිර්මිතකරනු ලැබීනම් ඒසංස්ථානය පුරුෂාකාරයෙනුත් කර්මාදිචතුර්විධ ප්‍රත්‍යයෝම දියුණු කරන්නාහුය. එහෙත් ඒප්‍රත්‍යයන්ට භාව රූපයාගේ අඥවක්‍රයට යටත්නොවී රූප දියුණු කිරීමට සමර්ථකමක් නැත්තේය උපමාව නම්. රජදරුවෝ දෙන්නෙක් රටදෙකක රාජ්‍යානුශාසනා කෙරෙත්තම තමන් අයත් රටෙහි ගෙවල්සාදන්නන් විසින් ගෙවල් සෑදියයුතු ආකාරය (පලැන) නියමකොට නීති දෙකක්ද පනවා තිබේ. යමෙක් ඒ නීතියට විරුද්ධව ගෙයක්සෑදුවේවීනම් ඕහට දඬුවම් කෙරෙත්. ඒ රජදරුවන්ගේ පලැන්දෙකද එකකට එකක් සම නොවේ. ස්ත්‍රීසංස්ථාන පුරුෂසංස්ථාන හෙවත් ස්ත්‍රී පුරුෂ ශරීරවය මේ උපමාවෙහි රට දෙක හා සදෘශයි. කුඩුමහත් ශරීරාඞ්ග ප්‍රාසාදශාලා මණ්ඩපාදිය හා සදෘශයහ. කර්මාදි චතුර්විධ ප්‍රත්‍යයෝ ගෙවල්සාදන වඩුවන් හා සදෘශයහ. ස්ත්‍රී පුරුෂ සංස්ථාන දෙක ගෘහයන් හා සදෘශයහ. භාව රූප දෙක රජදරුවන් දෙදෙන හා සදෘශයහ. රජදරුවෝ ගෘහ නිර්මාණය නොකරත් ගෘහ නිර්මාණය කරන්නෝනම් වඩුවෝය. එහෙත් ඒ වඩුවන්ට සිය අදහස් පරිදි ගෘහ නිර්මාණයට අවකාශයක් නැත්තේය රජදරුවන්ගේ අඥවට යටත් වම වඩුවන් විසින් ගෘහනිර්මාණය කටයුතුවේ. මේ නයින් පෘථිවී අපො සෘතුධාතුන් ප්‍රත්‍යයකොට ගෙන වැඩෙන වෘක්ෂලතාවන්තුල බීජනියාම ධාතුන්ගේද කර්ම චිත්ත සෘතු ආහාරයන් ප්‍රත්‍යයකොටගෙන වැඩෙන ගබ්භසෙය්‍යකාදි සත්ත්වයන් තුළ ජනම නියාම ධාතුන්ගේද තෘෂ්ණා විශෙෂ කර්ම විශෙෂප්‍රත්‍යයකොට ගෙන රූප සටහනින් සහ චිත්ත ක්‍රියාවන්ගෙන් වෙනස්ව උපදින ස්ත්‍රී පුරුෂයන් තුළ භාව නියාම ධාතුන්ගේද ආධිපත්‍යය තේරුම්ගත යුතු එහෙයින්ම ඊශ්වරාර්ථ වාචී ඉන්ද්‍රිය ශබ්දයහා සමාසකොට ස්ත්‍රී පුරුෂ භාව රූපවය වදාරණ ලදි. ඒ භාව රූපවය වනාහි අති සූක්ෂමවේ. එහි ඵලයවූ ස්ත්‍රී පුරුෂාකාර සංස්ථානයන්ම මනුෂ්‍යයෝ ස්ත්‍රී පුරුෂයන්කොට හඳුණගන්නාහුය. භාව රූපවය ගැන දැනීමක් ඔවුන් තුළ නැත්තේය.

## 5. ජීවිත රූපය.

සත්ත්ව සන්තානයෙහි චිත්ත, ඍතු, ආහාරයන් ප්‍රත්‍යයකොට ගෙන පහළවන චිත්තජ ඍතුජ ආහාරජ රූප තුන්කොටස ස්වකීය ස්වකීය ජනකප්‍රත්‍යයන් විද්‍යමානකල්හිම සන්තතිවශයෙන් පහළවීමත් ස්වකීය ස්වකීය ජනකප්‍රත්‍යයන් සමඟ නිරුද්ධවීමත් ස්වභාවකොට ඇත්තේය. ලොභසහගත චිත්තය ප්‍රත්‍යයකොටගෙන පහළවනලොභසහගත චිත්තජ රූප සන්තතිය ඒ ලොභසහගත චිත්තය සමගම නිරුද්ධවෙයි. ද්වෙෂ සහගත චිත්තය ප්‍රත්‍යයකොටගෙන පහළවන ද්වෙෂ සහගත චිත්තජ රූප සන්තතිය ඒ ද්වෙෂ සහගත චිත්තය සමගම නිරුද්ධ වෙයි. මොහ සහගත චිත්තය ප්‍රත්‍යයකොට ගෙන පහළවන මොහ සහගත චිත්තජ රූප සන්තතිය ඒ මොහ සහගතචිත්තය සමගම නිරුද්ධ වෙයි. ශ්‍රද්ධා ප්‍රඥාදි සහගත චිත්තයන් ප්‍රත්‍යයකොටගෙන පහළවන ශ්‍රද්ධා ප්‍රඥාදි සහගත චිත්තජ රූපද ඒ ඒ චිත්තයන් සමගම නිරුද්ධවන්නාහුය. මෙසේ ඒ ඒ චිත්තවාරයක් ප්‍රත්‍යයකොට ගෙන පහළවන ඒ ඒ චිත්තජ රූප සන්තති ඒ ඒ චිත්තවාරය සමගම නිරුද්ධවන ආකාරය දතයුතු. මේ නයින් ඒ ඒ ඍතූන් ප්‍රත්‍යයකොටගෙන පහළවන ඒ ඒ ඍතුජ රූප සන්තති ඒ ඒ ඍතූන් සමගම නිරුද්ධවන ආකාරයද ඒ ඒ ආහාරයන් ප්‍රත්‍යයකොටගෙන පහළවන ඒ ඒ ආහාරජ රූප සන්තති ඒ ඒ ආහාරයන් සමගම නිරුද්ධවන ආකාරයද දතයුතු. මෙසේ චිත්තජ ඍතුජ ආහාරජ රූපයන්ගේ නිරොධය අති ශීඝ්‍ර හෙයින්ම මේ සත්ත්වයන්ට දවස දෙතුන් වේලේ ආහාර අනුභව කරන්ටද ශරීරයට අහිතවූ ඍතුගුණ ඉවතලා හිතවූ ඍතුගුණ ඇතිකරගනු පිණිස හිඳිනා, හොත්නා, ගෘහාවාස සපයන්ටද අඳිනා, පොරෝනා, වස්ත්‍ර කොට්ට, මෙට්ට, ඇඳ, ඇතිරිලි නිතර සොයා පරිභොග කරන්ටද එසේම යාන වාහන වහන් සැරයටි නිතර සොයා පරිභොගකරන්ටද සිදුවී තිබේ. කෑම් බීම් ගමන් බිමන් ඉඳුම් හිටුම් ආදි අහිත විෂම ආහාර පානවලින් විෂමක්‍රියාවලින් වෙන්ව කලට වෙලාවට සුදුසු කෑම් බීම් ඉඳුම් හිටුම් ආදිය වෙනුවෙන් මොහොතකුදු පමානොවී ජීවිතානතය දක්වා ව්‍යාවෘතතවන්නටද සිදුවීතිබේ. එහෙයින් යාම් සිටීම් හිඳීම් හොවීම් යන සතර ඉරියව් පවත්වන කාලවල නිරන්තරව උපදිනජවන් සිත්වලින් පහළකරනලද චිත්තජ රූපයන්ගේ සන්තති ඝට්ටණයෙන්ම සත්ත්වයන්ගේ ස්කන්ධකායයන්ට ඇද නොවැටී ධරා සිටිය හැකිවී තිබේ. ඉඳින් ඒ අතර නිද්‍රාවක් සිහිසන්නැති කමක් ඇතිවීනම් මළ

කඳක්සේ ස්කන්ධකය ඇද වැටෙන්ට පිළිවන. ගමන් යන කල නිරන්තරව උපදින ජවන් සිත් වලින් ඔසවා දමන ලදුව පාදොත්ක්ෂෙපනික්ෂෙපයෙන් ස්කන්ධකය ගමන ක්‍රියාවෙන් යුක්ත වන්නේය. ඒ පාදොත්ක්ෂෙපයන්ටත් නික්ෂෙපයන්ටත් අතරවෙන වෙනම පහළවන්නාවූ ජවන චිත්ත සන්තති ඌර්ධ්වකාය ඇද වැටෙන්ට නොදී කෙළින් කරඅල්වා ගන්නාහුය. මෙසේ චිත්ත ඍතු ආහාරයන් ප්‍රත්‍යයකොට ගෙන පහළවන චිත්තජාදි ත්‍රිජ රූපයන්ට ස්වකීය ජනක ප්‍රත්‍යයන්ගේ අනුපාලකත්වය හැර කර්මජ රූපයන්මෙන් අනුපාලක ජීවිතෙන්ද්‍රියක් නැති ආකාරය දතයුතු. එහෙයින් ඒ ත්‍රිජ රූප යම් කිසිවෙකු විසින් නැඟිටවූ මෘත ශරීරයක් මෙන් ස්වකීය ජනක ප්‍රත්‍යයන් විද්‍යමාන කල්හිම නැඟිට ඒ ජනකවූ ප්‍රත්‍යයන්ගේ නිරොධය සමගම නිරුද්ධවන සුළු යහ. නිරුද්ධවූ අතීත කුශලා කුශල කර්ම ප්‍රත්‍යයකොටගෙන පහළවන කර්මජරූප විනාශ ලුහුබැඳ යමින් ආරක්ෂාකරන ජනක ප්‍රත්‍යයෙන් යුක්ත රූප වර්ගයක් නොවේ. කුශලා කුශල කර්මයන් විසින් නිපදවන අවස්ථාවෙහිම ජීවිතෙන්ද්‍රිය යෙන් යුක්තකොට නිපදවනු ලබන රූපවර්ගයකි එහෙයින් ඒකර්මජ රූප සහජාත ජීවිතෙන්ද්‍රියයෙන් අතර සිඳිය නොදී සන්තතිවශයෙන් පාලනය කරනු ලබන රූපයන්බව දත යුතු. අතීතකුශලාකුශල කර්ම්‍ය චිත්තාදි ප්‍රත්‍යයන්මෙන් තමා විසින් උපදවන ලද කර්මජ රූප ලුහුබැඳ යමින් කර්මජ රූප සමගම නිරුද්ධවන ප්‍රත්‍යයෙක් නොවේ. හුදෙක් ඒ කුශලා කුශලකර්මයන් විසින් ඒ රූපයම් ජීවිත රූපයකින් යුක්ත කොට නිපදවනුලැබීනම්ඒ ජීවිත රූපයෙන්ම ඒ කර්මජ රූප අතර සිඳිය නොදී සන්තතිවශයෙන් පාලනය කරනු ලබන් නාහුය. එහෙයින් කර්මජරූප ජීවිතෙන්ද්‍රිය සහිත රූපයන්බව දතයුතු. ප්‍රතිසන්ධික්ෂණයෙහි පටන් මරණය දක්වා සත්ව ශරීරයෙහි පූර්වකර්මයෙන් ජනිත කර්මජ රූප ශීඝ්‍ර නදී ශ්‍රොත සක් මෙන් සහජාත ජීවිතෙන්ද්‍රියයෙන් අනුපාලනය කරන ලදුවම අතර නොසිඳී සන්තති වශයෙන් පවත්නාහුය. චිත්තජාදි රූපසන්තති සම්පූර්ණයෙන්ම නිරුද්ධවී යතත් කර්මජ චක්ෂුඃප්‍රසාද රූපසන්තතිය එසේ නිරුද්ධවී නොයයි. ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිව්හා, කාය ප්‍රසාද රූපසන්තති ස්ත්‍රීභාව පුරුෂභාව රූපසන්තති සහ හෘදයවස්තු රූපසන්තතිය එසේ නිරුද්ධවී නොයෙන් නිරුද්ධවීයාමක් නැත්තේ යථොක්ත ජීවිතෙන්ද්‍රිය රූපයාගේ අනුපාලනයාගේ බලයෙනි එහෙයින් මරණාස න්නකාලයෙහි අන්තිම කර්මජරූපයන්ගේ නිරොධය දක්වා

සත්ත්වසන්තානයෙහි කර්මජරූප සන්තති නිරුද්ධවියනොදී රක්ෂාකරගෙන යන සහජාතරූප විශෙෂය ජීවිත රූපයයි කියන ලදී.

යටමහාභූත නිර්දේශයෙහි ලෞකිකමහජනයා විසින් අධාන ප්‍රවෘත්තයයි වරදවාගන්නාලද ජීවිතය සඳහා ජීවිතයක් නැතයයි කියනලදී.

## 6. හෘදය වස්තු රූපය.

හෘදය කොෂාභ්‍යන්තරයෙහි ලේධාතුව ආධාරකොට ගෙන පහළවන රූප විශෙෂය හෘදය වස්තු රූපයයි කියනලදී. කුශල විපාක අකුශල විපාක චක්ෂුර්විඥානවය චක්ෂුඃප්‍රසාද රූපයද, ශ්‍රොත්‍ර විඥානවය ශ්‍රොත්‍රප්‍රසාද රූපයද ඝ්‍රාණ විඥානවය ඝ්‍රාණප්‍රසාද රූපයද ජිව්හා විඥානවය ජිහ්වාප්‍රසාද රූපයද කායවිඥානවය කායප්‍රසාද රූපයද නිඃශ්‍රයකොටගෙන පහළවේ. එහෙයින් ඒ ප්‍රසාද රූප පඤ්චකය ද්වාර නාම යෙනුත් වස්තු නාමයෙනුත් වදාරනලදී. ඒ ප්‍රසාද රූප පඤ්චකය නිඃශ්‍රයකොටගෙන පහළවන කුශලාකුශල විපාක විඥාන දශය හැර කාමරූප භූමිවයෙහි පහළවන අවශෙෂ චිත්ත චෛතසික සියල්ලම හෘදය වස්තු රූපය නිඃශ්‍රයකරගෙන පහළවන බව දතයුතු. හෘදය වස්තු රූපය සමග වස්තු රූප ෂට්කයෙක් වේ. ප්‍රසාද රූප පඤ්චකය ආදාස තලයක්සේ මටසිලුටු රූපපඤ්චකයෙකි, ආදාසතලය මටසිලුටුවූවත් නිස රුවනොඅඟනා වස්තුවක් වන්නාක්මෙන් ප්‍රසාද රූප පඤ්චකයද රූප ශබ්දාදි ආලම්බනච්ඡායා පතනයට තරම් මටසිලුටු කමක් ඇතත් නිසරුවනොඅඟනා වස්තුපඤ්චකයෙකි. එහෙයින් ඒ ප්‍රසාද රූප පඤ්චකය නිඃශ්‍රයකොට ඉතාදුර්වලවූ පඤ්ච විඥාන චිත්ත චෛතසිකයන් මුත් කුශලාකුශලාදී බලසම්පන්න චිත්තචෛතසික පහළවීමක් නැත්තේය. හෘදයවස්තු රූපය වනාහි මටසිලුටුනුවූයෙන් අරමුණු සෙවනැලි වැටීමක් එහි නැත්තේය. තදාශ්‍රයෙන් පහළවන භවාඞ්ග සන්තානයෙහිම අරමුණු සෙවනැලි වැටෙන්නාහුය. හෘදයවස්තු රූපය අරමුණු සෙවනැලි වැටීමට තරම් මටසිලුටු නූවත් එයනිඃශ්‍රයකොටගෙන ඉතා බලසම්පන්න චිත්ත චෛතසික පහළවන්නාහුය. හිමාලපර්වතය නිඃශ්‍රයකොටගෙන හටගන්නාවූ වෘක්ෂ ලතාවන්මෙනි. මෙසේ කියනලදනයින් සත්ත්වයන් තුළ ඇතිවන බල සම්පන්න චිත්තචෛතසිකයන්ට නිඃශ්‍රය වන රූප විශෙෂය හෘදය වස්තු රූපයයි දතයුතු.

## 7. ආහාර රූපය.

කබලීකාර ආහාරය හෙවත් පරමාණු ධාතු සොහය ආහාර රූපයයි කියන ලදි. සතරමහාභූත විද්‍යමානනම් මේ පරමාණු රූප සොහයද විද්‍යමානයි. සොහරහිත මහාභූතය කියා එකමහාභූතයක්ද නැත්තේය. සොහ මන්දමහාභූතය සොහාධික මහාභූතය යන වෙනසම ඇත්තේය. සදෙව්ලෝ දෙවියන් අතුරෙන් මතු මතු දෙව්ලෝ දෙවියන්ගේ සාන්තකයවූ මහාභූතද ඔවුන්ගේ දිව්‍යඔජාදී උපකරණ මහාභූතද අතිශයින් සියුම් යහ. අතිශයින් ප්‍රණීතයහ. අතිශයින් ඔජාධික යහ. යට යට දෙවියන්ගේ අජ්ඣත්තබහිද්ධා මහාභූත සන්තාන ඔජා සහ උපකරණ මහාභූත සන්තාන ඔජා වනාහි ඖදාරික යහ මන්දයහ මිනිස්ලෙව්හිද ඔජාධික අජ්ඣත්ත බහිද්ධා මහාභූත ඔජාමන්ද අජ්ඣත්ත බහිද්ධා මහාභූත විද්‍යමානයහ. අනුභව කරන ආහාර පානවර්ග අතුරෙන් වෙඩරු ගිතෙල් ආදී ආහාරපාන වර්ගයන්හි පරමාණු ධාතු සොහ ඔජාව අතිශයින් සියුම්ය අතිශයින් අධිකය අතිශයින් බලවත්ය. බත් කැවිලි ආදියෙහි ඔජාව ඖදාරිකද මන්දද වේ. ඔජාධික ආහාරයකින් ස්වල්පයක් අනුභවකොටද බොහෝ වේලාවක්ගත කළහැකිවේ. ශීඝ්‍රවසාගිනි නොවදී කායබලය කායශක්තියද අඩුනොවේ. ඖදාරිකවූද මන්ද ඔජාවත්වූද ආහාරවර්ග බොහෝ අනුභව කළයුතුවේ. ක්ෂුධාග්නියද ශීඝ්‍රව ඇතිවේ. කායබලකායශක්තියද වහා අඩුවේ. එහෙයින් සත්ත්වයෝ ඔජාධික ප්‍රණීත ආහාර වර්ග අධිකව අනුභවකොට දිරවාගත නොහී නොයෙක් රෝග පීඩාවලට පැමිණෙන්නාහුය. සිරියල් සාදිලිංගම් ආදී භෛෂජ්‍ය ධාතුඔජාව ගිතෙල්ඔජාවටත් වඩා සියුම්ය ප්‍රණීතය. වෙඩිඑනු ගෙන්දගම් ආදී ශෛලමයධාතු, යකඩ, තඹ, පිත්තල ආදී ලෝහමය ධාතු, රජත සුවර්ණ පාරදාදී ධාතුමය ඔජා වනාහි ප්‍රමාණයටත් වඩා සියුම්ය ප්‍රණීතය. ඒ ධාතුවර්ග දෙස් පහකළ හැකි ක්‍රමවලින් පාකයට පමුණුවා පිරිසිදු කොටගෙන ආහාර කෘත්‍ය පිණිස යොදා ගන්ට පිළිවන්නම් ඒ අමෘත භෛෂජ්‍යයක් යයි කිය යුතුවේ. නොමැරෙන බෙහෙතයි සේයි.

## 8. පරිච්ඡේද රූපය.

රූපකලාප එකිනෙක පිරිසිඳින ආකාශය පරිච්ඡේද රූප යයි කියන ලදි. අෂ්ටක, නවක, දසක, එකාදසක, ද්වාදසක තෙරසකයන්ගේ වශයෙන් එකට පහළවන්නාවූ එක එක රූපපිණ්ඩයක් රූපකලාපයක්නම් වේ. එක අණුරේණුවකම

එබඳු රූප කලාප දහසකටද අධිකයහ. එකාබඩවූ තිල බීජයන්ගේ අනතරයන් මෙන් අණුරෙණුත්තවයෙන් කැපිවූ ඒ රූපකලාපයන්ටද ඒකානතයෙන් අනතරාකාශ ඇත්තාහු මය. අනතරාකාශ ඇති හෙයින්ම පරමාණු, අණු, තජ්ජාරි, රථරෙණු, ලික්ඛා, ඌකාදි සංස්ථානත්තවයෙන් කැපිව පහළ වන්නාවූ ඒරූපකලාප මේත් එකලාපයක මේත් එක කලාප, යක කියා වෙන්කොට දතහැකිවීතිබේ. ලීදඬු කපා පලා, සැස, විද, වෙන් කිරීමේදී කියත්. පොරෝ, වෑ. නියන් මුවාත් ඒ අනතරාකාශානු සාරයෙන් ලිදඬු තුළට ප්‍රවිෂ්ට වන්නාහු ය. අෂ්ටක, නවකාදී පරමාණු රූප කලාප වනාහි කපා, පලා, විද, වෙන්කළහැකි නොවේ සත්වශරීරයෙහිද දුම් හුමාර ලේ වායු වගී යථොක්තාකාර අනතරාකාශානුසාරයෙන් ගමනාගමනය කරන්නාහුය එබඳු අනතරාකාශමේ ශරීරයෙහි ඉඳිකටු මුණතක් පොව්වන පමණද නොහැර හැමතන්හිම ඇත්තාහුය.

## 9. විඥප්තිරූප දෙක.

විඥප්ති රහිත ශුධවායො ධාතු බලයෙන් ඒ ඒ ද්‍රව්‍යයන්ගේ සැලීම වායො ධාතුහු විසින් ගිස ලූ ලූ අතකට අනුගතව මුත් පුද්ගලයාගේ අදහසට අනුගත නොවේ. සවිඥප්තික වායො ධාතු බලයෙන් වන සැලීම වනාහි පුද්ගලයාගේ අදසහට අනුගත වේ.

එහෙයින් කායවිඥප්ති රූපය නැව්පස්ස අල්වන්නෙකු හා සදෘශවේ නැව් පස්ස අල්වන්නෙකු නැතිව පදිනු ලබන නැවක් පුද්ගලයාගේ අදහසට නොඅනුගතවැ නැව් ගිස ලූ ලූ අතකටම යාත්‍රා කරනසුලුය පස්ස අල්වන්නෙකු පඬුපතින් (හබලෙන්) ප්‍රතිපාදනය කරන ලදුවම පුද්ගලයාගේ අදහසට අනුගතවැ යාත්‍රා කරන්නීය. එපරිද්දෙන් ඒ ඒ කායාඞගවල උත්සාහ ජනකවූ ජවන් සිත් පෙලවල් ඉපදී ඒ ඒ අග පසගට වැටී තිබෙන කුදුමහත් නහර වායො ධාත්වාධික චිත්තජරූපකලාපයන් ගෙන් පූරවන්නාහුය. ඒ පිරවීමත් වලාහපටලයෙන් නික්මෙන විදුලි කළඹින් මුළු අහස්කුස ක්‍ෂණයකින් පූරවාලන්නාක්මෙන් ඉතා ශීඝ්‍රයි. එසේ පහළ වනරූපකලාපයක් පාසා මුලින් මුලින් ඇතිවන කලාපප්‍රතිපාදක රූපවිකාරය ඇතිවම ඒ ඒ අඟ පසඟ සොලවාලීමෙහිපොහොසත් චිත්තජවායො ධාතුන්විසින් පාදෙත්ක්‍ෂෙප නිඃක්‍ෂෙපාදි ක්‍රියා කරවනු ලැබේ ඒ රූපවිකාරය කායවිඥප්ති රූපයයි කියනු ලැබේ.

වාග් විඥප්තියෙහි ශුද්ධ පෘථිවී ධාතු ඝට්ටණයෙන් ඇතිවන ශබ්දකලාප පුද්ගලාභිප්‍රායානුකූල අක්ෂරබවට වචන බවට පැමිණ ගත නොහෙත් සවිඥප්තික චිත්තජ පෘථිවී ධාතුඝට්ටණයෙන් ඇතිවනශබ්දකලාපම පුද්ගලාභිප්‍රායානුකූලව එකතුවී අක්ෂරබවට වචන බවට පැමිණෙන්නාහුය. මේ වාග් විඥප්ති රූපය වනාහි චිත්තජ පෘථිවී ධාත්වාධික රූපකලාප අක්ෂරභාවයෙන් එකතුවීම පිණිස පිළියෙළකරන හෙයින් නලාපිඹීමේදී නලාහඬ පිළියෙළ කරන හස්තවිකාරය හා මදක් සදෘශයයි කිව හැකිවේ. අසූරු සැණක් ඇස් පියවරක් පමණ උච්චාරණයෙන් එබඳු එක අකුරක්, ඉපදවිය යුතු වේ. එසේ උපදවනු ලබන අකුරුනම් සංස්කෘත භාෂාවේ හැටියට අ, ආ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, ඏ, ඐ, එ, ඓ, ඔ, ඖ, අං, අඃ. ක, ඛ, ග, ඝ, ඞ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ, ත, ථ, ද, ධ, න, ප, ඵ, බ, භ, ම, ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ, යන මොව්හුයි. පාළිභාෂාවේ හැටියට අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ. ක, ඛ,—පෙ—ය, ර, ල, ව, ස, හ, ළ, අං යන මොවුහුයි. සිංහල භාෂාවේ හැටියට. අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ, ඇ, ඈ, ක, ග, ජ, ට, ඩ, ණ, ත, ද, න, ප, බ, ම, ය, ර, ල, ව, ස, හ, ළ, අං, යන මොව්හුයි.

උත්පත්තිස්ථාන වශයෙන් වනාහි ළය, ග්‍රීව, තල්ල, මූඳුන, දත්, තොල්, නැහැ යන සප්තස්ථානයෙහි උපදිත් කායචලනය ඇසින් දුක කාය විඥප්තිය මනොවිඥනයෙන් දැන ගනු ලැබේ. උච්චාරණ ශබ්දය කණින් අසා වාග්විඥප්තිය මනොවිඥනයෙන් දැන ගනු ලැබේ. විඥප්තිවය චක්ෂුශ්‍රොත්‍ර විඥනයන්ට අරමුණුනොවේ. සියලු සත්වයන් තුළම මේ විඥප්තිවය විද්‍යමාන බැවින් එකෙකුගේ අදහස අන්‍යයෙකුට කාය වාග් දෙකින් හැඟ විය හැකිව්තිබේ. කායකම්මං වචීකම්මංයි ආතන්හි චෙතනාව කර්ම නම් වේ. කාය විඥප්ති රූපය කාය නම්වේ. වාග්විඥප්තිරූපය වචීනම්වේ. කායවිඥප්ති සම්බන්ධයෙන් ඇතිවන කුශලාකුශල චෙතනා දෙකොටස කාය කර්ම වෙයි. වාග් විඥප්ති සම්බන්ධයෙන් ඇතිවන කුශලාකුශල චෙතනා දෙකොටස වාග් කර්ම වෙයි. කායවාග්දෙක රූප ධර්ම නම් කර්මය නාම ධර්ම නම් 'මනො කම්මං'යි ආතන්හි කුසල් අකුසල් සිත් දෙකොටස මනො නම් චෙතනාව කර්ම නම් විඥප්ති විරහිත ශුද්ධ කුශලාකුශල චිත්ත සහජාත චෙතනාව මනඃ කර්ම නම් එයින් කායවචී මනො යන තුන ද්වාරයෝයි කායද්වාර, වාග්ද්වාර, මනොද්වාරයි සේයි. කායාඞ්ගයකින් කළාම සම්පාදනය වන ප්‍රාණඝාතාදි කර්මරාශිය කාය විඥප්තිය ඇතිවම සම්පාදනය වන්නේයි.

එහෙයින් කායවිඤ්ඤත්තිය ප්‍රාණඝාතාදී කම්ම පැන නැඟීමට මාර්ගවූ ද්වාරයයි කියන ලදී. වචී මනො දෙක්හිද ද්වාරභාවය මේනයින් දතයුතු. චක්‍ෂු, ශ්‍රොත්‍ර, ඝ්‍රාණ, ජිව්හා, කාය සඞ්ඛ්‍යාත පඤ්ච ප්‍රසාද ද්වාරයන් සමග මේ විඤ්ඤත්තිවය එකතු කල කල්හි රූපද්වාර සප්තකයෙක් වේ.

ප්‍රසාද රූප පඤ්චකය අධ්‍යාත්ම සන්තානයෙහි ඇතිවන චිත්තචෛතසිකයන්ගේ සහ බාහ්‍ය ආලම්බනයන්ගේ එකතු වීමට ස්ථානවූ හෙයින්ද විඤ්ඤත්තිවය කායවචී කර්මයන්ගේ පැනනැගීමට මාර්ගයවූ හෙයින්ද ද්වාරයයි කියනලදී. කායවිඤ්ඤත්තිය ඇතිවැම අධ්‍යාත්ම සන්තානයෙහි කාය කර්ම රාශියත් වාග් විඤ්ඤත්තිය ඇතිවැම අධ්‍යාත්ම සන්තානයෙහි වාක්කර්ම රාශියත් මනඃ සඞ්ඛ්‍යාත චිත්තය ඇතිවැම අධ්‍යාත්ම සන්තානයෙහි අභිද්‍යාදිචෛතසික මනඃ කර්ම රාශියත් සම්පාදනය වන්නේයි. දොර ජනෙල් කවුළු ඇති කල්හිම චක්‍ෂුෂ්‍යසීයන්ගේ ආලොකය සහ සුළඟ ගෘහයතුළ ඇතිවන්නාක්මෙන් සත්ත්වයා තුලද කායවාග්මනඃ සඞ්ඛ්‍යාතද්වාරත්‍රය ඇති කල්හිම කාය වාග්මනඃ කර්මත්‍රය ඇතිවන්නේයයි දතයුතු.

### 10 විකාර රූපත්‍රය.

සත්ත්වයන්ගේ ස්කන්ධ කායෙහි මහාභූත ධාතු සතර ව්‍යප ශාන්තවැ පවත්නාකල කායලඝුතා, කායමුදුතා, කාය කම්ම ඤ්ඤතා සඞ්ඛ්‍යාත විකාර රූපත්‍රය ඇතිවේ. මුළු ශරීරයෙහි හෝ ශරීරෙක දෙශයෙක්හි කාෂ්ට මුඛ සර්ප පෘථිවී ධාතුව හෝ පූති මුඛසර්ප ආපො ධාතුව හෝ උත්සන්නවී අකල්හි නැගිටින්ට ඒ මේ අත පෙරලෙන්ට බැරිතරම් ශරීරයෙහි බරගතියක් ඇතිකෙරේ. එකල ශරීරයෙහි ලඝුතා රූපය නිරුද්ධවූයේ වේ. ඖෂධ සෙවනයෙන් ඒ බරගතියට කරුණුවූ අධික පෘථිවීආපො ධාතුන් ව්‍යපශමණයට පමුණුවාගත් කල්හිමනැවත නැගිටීම ඒ මේ අත පෙරළීම පහසුවීමෙන් ශරීරයෙහි ඒ ලඝුතා රූපය ඇතිවන්නේය. මේ නයින් කාෂ්ටමුඛ සර්ප පෘථිවී අධික කායාඞ්ග ශස්ත්‍රමුඛසර්පවායොඅධික කායාඞ්ගස්තබ්ධවීමෙන් රූපයන්ගේ මොළොක්කමයයි කියනලද කාය මුදුතා රූපය නැතිවන සැටි සහ ඖෂධ සෙවනයෙන් ඒ අධික පෘථිවී වායො ධාතුන් ව්‍යපශමණයට පමුණුවා ගත් කල්හිම ඒ කාය මුදුතා රූපය නැවත ඇති වන සැටිද දතයුතු.

කාෂ්ටමුඛ සර්ප පෘථිවී, පූතිමුඛ සර්ප ආපො, අග්නිමුඛ සර්ප තෙජො, ශස්ත්‍ර මුඛ සර්ප වායො යන සතර මහාභූත ධාතුන් ව්‍යපශමණයට නොපැමිණි කායාඞ්ගයන්හි කර්මක්‍ෂමතා

සඞ්ඛ්‍යාත කායකර්මණ්‍යතා රූපය ඇති නොවේ. ඖෂධ සේවනයෙන් සතර මහාභූතධාතූන් ව්‍යුපශමණයට පමුණුවා ගත්කල්හිම නැවත ඒ කර්මණ්‍යතා රූපය ඇතිවේ.

යථොක්ත ලඝුතා මුදුතා කම්මඤ්ඤතා රූපතුනද මහාජනයාට ප්‍රකට රූප තුනකි. කෑම්, බීම්, ඉඳුම්, හිටුම්, ආදියෙහි සුපරීක්ෂා කාරිත්වය ඒ රූපතුන වෙනුවෙන් ඇතිවී තිබේ. ඒ එසේමය කාෂ්ට, පූති, අග්නි, ශස්ත්‍ර මුඛ වශයෙන් සර්පයෝ සතර දෙනෙක. එයින් කාෂ්ට මුඛ සර්පවිෂ විහිද ගිය සත්ත්වයා පෘථිවි ධාතුව උත්සන්නව දරදඬුවී මරුමුවට පැමිණෙයි මරණින් පසුද ශරීරය දරකඩක්සේ ස්තබ්ධවන්නේයි. පූති මුඛ සර්පවිෂ විහිද ගියසත්ත්වයා ස්කන්ධකය ආපොඋත්සන්නව දියාරුවී ක්ෂණයකින් මරුමුවට පැමිණෙයි මරණින් පසුද ශරීරය ජුහුජුහුව කුණුවීයන්නේයි. අග්නි මුඛ සර්ප විෂ විහිදගිය සත්ත්වයා ඇස්වලින් ගිනිගෙන දැල්වී ක්ෂණයකින් මරුමුවට පැමිණෙයි. මරණින් පසුද ශරීරය ජුහුජුහුව වියලීයන්නේයි, ශස්ත්‍ර මුඛ සර්පවිෂ විහිදගිය සත්ත්වයා වායො උත්සන්නව ක්ෂණයකින් සන්ධිපූරුක් ගැලවී මරුමුවට පැමිණෙයි, මරණින් පසුද ශරීරය ජුහුජුහුව සන්ධි පූරුක් ගැලවී විසිරයන්නේයි. ස්කන්ධලොකයෙහි සර්පයෝ සතර දෙනෙක එයින් පෘථිවිධාතුව කාෂ්ට මුඛ සර්පනම්. ආපො ධාතුව පූති මුඛ සර්ප නම්. තෙජො ධාතුව අග්නි මුඛ සර්ප නම් වායො ධාතුව ශස්ත්‍ර මුඛ සර්පනම්.

ඒ සර්පයන් සතරදෙන අතුරෙන් යම් සර්පයෙක් යම් කායාඞ්ගයක විෂම ගතිකවීද ඒ කායාඞ්ගයෙහි විකාර රූපතුන අතුරුදන්වන්නාහුය. සෑහෙන ප්‍රතිසංස්කරණයකින් ප්‍රතිසංස්කරණයට පැමිණවූ කල්හිම ඒ කායාඞ්ගයෙහි නැවත ඒ විකාර රූප පහළවන්නාහුය. එසේ විකාර රූප පහළවන්ට පටන්ගත් කල්හිම ඒ ඒ කායඞ්ගා චලනයෙහි සුවපහසු ලැබියහැකි වන්නේය. ඒ විකාර රූප තුන පූර්ව කර්මයෙන් ඇතිවනරූපයෝ නොවෙත් ඒ ඒ චිත්ත සෘතු ආහාරයන්ට අනුකූලව ඇතිවීමට අවකාශ එලඹ සිටි කල්හිම චිත්තජව සෘතුජව ආහාරජව අවස්ථාවශයෙන් ඇතිවන රූපයෝයහ. විකාරරූපතුන නිම්.

ද්වි චිත්තජ විඥප්තිවයද විකාර රූපයන්බැවින් කියනලද විකාර රූපත්‍රයට එකතුකල කල්හි විකාර රූප පඤ්චකයෙක් වේ. මහාභූතයන්ගේ ආකාර මාත්‍රයන්ව විකාර රූපයයි කිය

## 11. ලක්‍ෂණ රූප සතර.

නලදහ. මේ විකාර රූපසාමාන්‍ය මනුෂ්‍යයන්ටද ප්‍රකටයහ· එහෙත්ධාතු විශෙෂ බර්‍ම විශෙෂයන් බව නොදත් හෙයින් ඔව්හු ඒ විකාර රූපයන් මමයමාගේයයි හගින්නාහුය.

උපචය, සන්තති, ජරතා, අනිච්චතා යන සතර ලක්‍ෂණ රූප සතරයයි කියන ලදහ. ප්‍රථමකොට පහළවීම වැඩීම උපචය නම්. පරම්පරාවට පහළවීම වැඩීම සන්තතිනම්. ඒ උපචයසන්තතිමය එක්කොට ගෙන ජාති රූපයයි කියන ලදි. දිරීම ජරතා නම්. බිඳී අතුරුදන්වීම අනිත්‍යතා නම්. භඞ්ගය මරණය යනුද අනිත්‍යතාවට නම්. කර්‍මජ, චිත්තජ, සෘතුජ, ආහාරජ රූප සතර කොටසෙහිම ලක්‍ෂණ රූප සතර විද්‍යමානයහ. නිෂ්පන්න රූප සම්පූර්ණවීම දක්වා පහළවීම වැඩීම උපචයනම්. පරම්පරාවට පහළවීම වැඩීම සන්තතිනම්. පැසීම, මුහුකිරීම, පරණව මැලවීම, දිරා මහලුවීම, පිරිහීම ජරතා නම්. බිඳී අතුරු දන්වීම අනිත්‍යතානම්යි සේයි.

අඹ දඹ කොස් දෙල් ලබු පුසුල් ආදී වෘක්‍ෂ ලතාවන්හි පල තරු ඇදුණු තැන් පටන් ක්‍ෂණයෙන් ක්‍ෂණය පහළවීම වැඩීමඋපචයනම්. වැඩී කෙළවරවූ තැන් පටන් රූප කලාපයන් පරම්පරාවට පහළවීම වැඩීම සන්තතිනම්. පහළවෙමින් වැඩෙමින් පවත්නා නිෂ්පන්නරූපයන්ගේ උත්පාදය උපචවයනම්. වැඩී කෙළවරවූ තැන් පටන් නදී ශ්‍රොත සක්මෙන් පරම්පරාවට පවත්නා උත්පාදය සන්තති නම්යි සේයි.

කර්‍මජරූපයන් තුළ ප්‍රතිසන්ධි කාලයෙහි පටන් ඒ කර්‍මජරූප සම්පූර්ණවනතුරු අලුතෙන් අලුතෙන් පහළවීම වැඩීම ඇත්තේය. වැඩී කෙළවරවූ පසු වැඩුණු පරිද්දෙන් පරම්පරාවට පහළවෙමින් වැඩෙමින් පැවැත්ම මුත් අලුතෙන් අලුතෙන් පහළවීමක් වැඩීමක් නැත්තේය. අලුතෙන් අලුතෙන් පහළවීම වැඩීම ඇතිතාක් උපචයට ක්‍ෂෙත්‍රයි. වැඩීකෙළවරවූ පසු වැඩුණු පරිද්දෙන් පරම්පරාවට පහළවෙමින් වැඩෙමින් පැවැත්ම සන්තතියට ක්‍ෂෙත්‍රයි.

චිත්තජ රූපයන් තුළ වනාහි ඒ ඒ ඡන්දාභිප්‍රායයන්ගේ වශයෙන් උත්සාහවත්වූ ඒ ඒ චිත්තයන්ගෙන් යෑම් ඊම් ඉඳුම් හිටුම් අග පසග සෙලවීම් කථා බස්කිරීම් ආදී කායික වාචසික ක්‍රියා පවත්වන කල්හිද ඒ ඒ රූප විශෙෂ ජනක ලොභ වෙෂාදි චෛතසික ක්‍රියා විශෙෂ පවත්වන කල්හිද චිත්තජ රූපයන්ගේ නැඟීම් ඉදිරීම් සෙලවීම්වල ආදී මධ්‍යපරියො

සාන ඇතිවීම ධර්මතායි. එහි ආදියෙහි පටන් වැඩී කෙළ වරවීම දක්වා උපචයට ක්ෂෙත්‍රයි. වැඩී කෙළවරවූ තැන් පටන් ඒ ඒ සන්තතීන්ගේ අන්තර්ධානය දක්වා පරම්පරාවශයෙන් පැවැත්ම සන්තතියට ක්ෂෙත්‍රයි. මේ නයින් සෘතුජ, ආහාරජ රූපයන්හිද ඒ ඒ සෘතුජ ඒ ඒ ආහාරජ රූප පිරිසිඳ පිරිසිඳ උපචය සන්තති ක්ෂෙත්‍රද්වය බෙදාගතයුතු.

චිත්තජ රූපයන්හි වරක් ඇස්පිය හෙළිමෙහි අකුරක් උච්චාරණයෙහි වරක්ආශ්වාස කිරීමෙහි පවා පළමුකොට පහළවීම වැඩීම සන්තති වශයෙන් පහළවීම වැඩීම සහ අතුරුදන්වීම විද්‍යමානයි අඟපසඟසලා යෑම් ඊම් ඉඳුම් හිටුම් පැවැත්වීමෙහි වනාහි කියනුම කවරේද?

සෘතුජ රූපයන් තුළ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්හි උණුසුම් සිසිල් දූවීම් කැක්කුම් හිරි කොර මර වෙහෙස විඩා සුවපහස් පෙරළෙමින් පවත්නා ආකාරයද ආහාරජ රූපයන් තුළ උදෑසන අනුභව කරනලද ආහාරය ප්‍රත්‍යයකොටගෙන නගින උදෑසන රූපයන් ගේ සහ සවස අනුභව කරන ලද ආහාරය ප්‍රත්‍යයකොට ගෙන නගින සවස රූපයන්ගේ වැඩෙන පිරිහෙන ආකාරයද පරීක්ෂාකර බලා උපචය සන්තතික්ෂෙත්‍රද්වය බෙදා ගතයුතු.

මේ සත්තවයෝ ස්වකීය ස්කන්ධකයෙහි අනිෂ්ටරූපයන් පහළවීමවැඩීම සන්තති වශයෙන් පැවත්මයයි කියනලද උපචය සන්තති ලක්ෂණ දැන ස්කන්ධකය පරිහරණයකර ගෙනයන්නාහුය. දිරා පිරිහෙන බිඳී නටබුන් වන අයුරුද දැනගන්නාහුය. උපචය සන්තති ජරතා අනිච්චතා රූප සතර සූක්ෂ්මා කාරයෙන් දක්ක පුද්ගලයාහට සියලු රූපයෝම අනිත්‍යය හ, දුඃඛයහ, අනාත්මයහයි ප්‍රත්‍යක්ෂවන්නේයි. එසේ ප්‍රත්‍යක්ෂවීමට කරුණු වන හෙයින්ම ඊට ලක්ෂණ රූපයයි ව්‍යවහාර කරනලදී.

ලොකයෙහි සවිඥානක අවිඥානක වස්තූන් තුළ ක්ෂණයෙන් ක්ෂණය පැයින් පැය දවසින් දවස රූපයන්ගේ පහළවීම වැඩීම, පරම්පරාවශයෙන් පැවැත්ම, පිරිහී යාම, බිඳී අතුරුදන්වීම, යන ලක්ෂණ සතර සියලු මනුෂ්‍යයෝම දන්නාහුය. ඒ එසේමය පහළවෙයි වැඩෙයි කියාද නොවැඩී නොඅඩුවී සිටියි පිහිටා සිටියි දිගාකල් පවතියි ක්ෂණයක් පවතියි කියාද පිරිහෙයි බසියි නැතිවෙයි බිඳෙයි අතුරුදන්වෙයි සංසිඳෙයි කියාද ව්‍යවහාරකරනු ලබන්නේ මේ ලක්ෂණ රූප චතුෂ්කයයි.

ලොකයෙහි ඇතිවීමට හෝ නැතිවීමටද වැඩීමට හෝ නොවැඩීමටද දිගාකල් පැවැතිමට හෝ දිගා කල් නොපැවැතිමටද පිරිහීමට හෝ නොපිරිහීමටද අතුරුදන්වීමට හෝ නොඅතුරුදන්වීමටද වැයම් කරන්නේ මේ ලක්‍ෂණ රූපයන් සතර දෙනා වෙනුවෙනි. අතිශයින් සියුම් රූපයන් බැවින් නැවත නැවත මතුකරකර කීවෙමු.

සමුට්ඨාන වශයෙන් විභාග.

රූප ජනකප්‍රත්‍යයෝ කර්‍මය, චිත්තය, සෘතුව, ආහාරයයි 4 රෙක. පූර්‍ව පූර්‍ව භවයන්හි කායාදිවාරත්‍රයෙහි පැවති සුචරිත දුශ්චරිත දෙකොටස මෙහි කර්‍මයයි කියනලදි. "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි"යි වදාළ පරිද්දෙන් කුශලාකුශල චෙතනා දෙකොටසයි සේයි.

දැන් ඉපදෙමින් පවත්නා චිත්ත පරම්පරාව චිත්තයයි කියන ලදී ඒ චිත්තය සහජාත චෛතසිකයන් සමග එක්ව රූප උපදවන්නේවේ.

සෘතුවනම් ශීතොෂ්ණ තෙජො ධාතුවයයි.

ආහාරයනම් ඕජාව හෙවත් මහා භූත ධාතුසොභයයි.

ප්‍රසාදරූප 5, ජීවිතරූප 1, හෘදය වස්තු රූප 1, ස්ත්‍රීභාව පුම්භාව රූප 2, යන 9 නවදෙන ශුද්ධ පූර්‍ව කර්‍මයෙන්ම හට ගන්නා හෙයින් කර්‍මජඑකාංසිකනම්වෙත්.

කායවාග් විඥප්ති රූපවය ශුද්ධ චිත්තයෙන්ම හටගන්නා හෙයින් චිත්තජ එකාංසික නම් වේ.

ශබ්දය චිත්තයෙනුත් සෘතුවෙනුත් හටගන්නා හෙයින් විජ රූපය නම්වේ. ලඝුතා මුදුතා කම්මඤ්ඤතාත්‍රය චිත්තයෙනුත් සෘතුවෙනුත් ආහාරයෙනුත් හටගන්නා හෙයින් ත්‍රිජ රූප නම්වේ.

මහාභූත 4, වර්‍ණ, ගන්ධ, රස, ඕජා 4, ආකාශ ධාතුව යන නවදෙන 9 කර්‍මයෙනුත් චිත්තයෙනුත් සෘතුවෙනුත් ආහාර යෙනුත් හටගන්නා හෙයින් චතුජ රූප නම්වෙත්.

ලක්‍ෂණ රූප 4 කිසි ප්‍රත්‍යයකින් හට නොගන්නා බව අභි ධර්‍මාර්‍ථ සංග්‍රහයෙහි කියන ලදි.

පාලියෙහි වනාහි උපචය සන්තතිවය චතුසමුට්ඨානික කොට වදාරනලදි. ජරතා අනිච්චතාදෙක පමණක් පිරිහීම් අතුරුදන්වීම් මාත්‍රවූ ජාති නාමයෙන් ව්‍යවහාරයට යොග්‍ය නොවූයෙන් නොවදාරන ලදහ. ශබ්දය චිත්තජය සෘතුජ යයි විවිධාවේ. ලඝුතාදිත්‍රය චිත්තජය, සෘතුජය, ආහාරජයයි

ත්‍රිවිධවේ. ආකාශ ධාතුව හා අවිනිර්භොගරූපාෂ්ටකය යන නවදෙන 9 කර්‍මජය, චිත්තජය, ඍතුජය, ආහාරජයයි චතුර් විධවෙත්. එකංසික නවය 9 අනෙකංසික නවය 9 එකතුවී කර්‍මරූප 18 ක්ද, එකංසික 2 අනෙකංසික 13 එකතුවී චිත්තජ රූප 15 ක්ද වේ.

ඍතුජරූප අනෙකංසික 13 ක. ආහාරජරූප අනෙකංසික 12 ක. මේ දෙකොටසෙහි එකංසික නැත්තේය. මේ සියලුම රූප අවයව හෙයින් 58 ක්ද සංක්ෂෙපයෙන් 24 ක්ද වේ.

---

## කලාප වශයෙන් විභාග.

මහාභූත 4, වර්‍ණ, ගන්ධ, රස, ඕජා 4 යනමේ අෂ්ටකය එකට ඉපද එකට නිරුද්ධවී යන රූප පිණ්ඩව බෙදා වෙන් නොකට හැකි හෙයින් අවිනිර්භොගාෂ්ටකයයි කියන ලදී. ඒ අෂ්ටකය කඳ (අඩිතාලම) කොට ගෙන ඊටජීවිත රූපය එකතුකරනු ජීවිත නවක කලාපනම්වෙයි 1. ඒ ජීවිත නවක කලාපයට පඤ්ච ප්‍රසාද හෘදය වස්තු ස්ත්‍රීභාවපුම්භාව රූපයන්ගෙන් එක එක එකතු කරනු චක්‍ෂුදශක කලාපනම්වෙයි 1. ශ්‍රොත්‍ර දශක කලාප නම්වෙයි 1. ඝ්‍රාණ දශක කලාප නම්වෙයි 1. ජිව්හාද ශක කලාප නම්වෙයි 1. කාය දශක කලාප නම්වෙයි 1. වස්තු දශක කලාප නම්වෙයි 1. ස්ත්‍රීභාව දශකකලාප නම් වෙයි 1 පුම්භාව දශක කලාප නම්වෙයි 1. කර්‍මජකලාප නවය නිමි.

චිත්තජ අවිනිර්භොගාෂ්ටකය චිත්තජ ශුද්ධාෂ්ටක කලාප නම් වෙයි 1. ඊට චිත්තජ ශබ්දය එකතු කරනු ශබ්දනවක කලාප නම්වෙයි 1. කායවිඥප්ති රූපය එකතු කරනු කායවිඥප්ති නවකකලාපනම්වෙයි 1. ශබ්දනවකකලාපයට වාග්විඥප්ති රූපයඑකතු කරනු ශබ්දවාග් විඥප්ති දශක කලාපනම් වෙයි 1. මේ මූල කලාප 4 යි.

මේ සතරට පිළිවෙලින් චිත්තජ ලඝුතාදිත්‍රය එකතුකරනු. ලඝුතාදි එකාදශක කලාප නම්වෙයි 1. ශබ්ද ලඝුතාදි ද්වාද ශක කලාප නම්වෙයි 1. කාය විඥප්ති ලඝුතාදි ද්වාදශක කලාප නම් වෙයි 1 ශබ්දවාග් විඥප්ති ලඝුතාදි තෙරසක කලාපනම්වෙයි 1. මේ සම්භව කලාප 4 යි. චිත්තජකලාප අට නිමි.

ඍතුජ අවිනිර්භොගාෂ්ටකය ඍතුජ ශුද්ධාෂ්ටක කලාපනම් වෙයි1. ඊට ශබ්දය එකතු කරනු ශබ්ද නවක කලාපනම්වෙයි 1. මේ දෙකට පිළිවෙළින් ඍතුජ ලඝුතාදිත්‍රය එකතු කරනු

ලඝුතාදි එකාදශක කලාප නම්වෙයි 1. ශබ්ද ලඝුතාදි ද්වාද ශක කලාප නම්වෙයි 1. ඍතුජ කලාප සතර නිමි.

ආහාරජ අවිනිර්භොගාෂ්ටකය ආහාරජ ශුද්ධාෂ්ටක කලාප නම්වෙයි 1. ඊට ආහාරජ ලඝුතාදිත්‍රය එකතුකරනු ලඝුතාදි එකාදශක කලාපනම්වෙයි 1. ආහාරජ කලාපදෙක නිමි.

කර්මජ කලාප 9, චිත්තජ කලාප 8, ඍතුජ කලාප 4, ආහාරජ කලාප 2 එකතු කරනු චතුසමුට්ඨානික රූප කලාප 23 වන්නේය. ශබ්ද නවක කලාපයත් ශබ්දලඝුතාදි ද්වාදශක කලාපයත් අභිධර්‍මාර්ථ සංග්‍රහයෙහි නො ආ නමුත් අටුවාවල ඇවිත් තිබෙන හෙයින් ඒ දෙකත් ගෙන අපි මෙහි චිත්තජ කලාප 8ක් දක්වීමු. ආකාශධාතුවයයි කියන ලද්දේ ඒ ඒ කලාපයන්ගේ අන්තරාකාශ මාත්‍රයයි එහෙයින් ඒ ආකාශ ධාතුව කලාප යොජනාවට ඇතුළත් නොකරන ලදි. ලක්‍ෂණ රූප 4 ද සියලුම කලාපයන්ගේ පළමුකොට පහළවීම්, සන්තති වශයෙන් පහළවීම්, මුහුකිරීම්, බිඳී නටබුන්වීම් මාත්‍රයන්වූ කලාප පිරවීමෙහි අපොහොසත් හෙයින් කලාප යොජනාවට ඇතුළත් නොකරන ලද්දහ.

අවිඥානක සන්තානයන්හි ඍතුජ අෂ්ටක නවක කලාප දෙකද සවිඥානක සන්තානයන්හි සියලු කලාප තෙවිස්සම්ද ලැබෙත්. එසින් කර්මජකලාප නියමයෙන්මත් චිත්තජ, ඍතුජ, ආහාරජ කලාප ඔවුන්ගේ වකවානු පැමිණිකල්හිත් ලැබෙන බව දතයුතු.

යට විස්තර කරනලද පරිද්දෙන් ශබ්ද විඥප්ති විකාර රූපයන්ගේ ලක්‍ෂණ අවබොධවූ තැනැත්තාට චිත්තජාදි රූප කලාප ඔවුන්ගේ වකවානු පැමිණි කල්හිම පහළවන ආකාරය පහසුවෙන් පෙනී යනවා ඇත. බ්‍රහ්මයන්ට ඝ්‍රාණ, ජිව්හා, කාය, ස්ත්‍රීභාව, පුම්භාව දශක 5ද ආහාරජ කලාප 2ද යන කලාප 7 නොලැබෙත්.

---

### ප්‍රතිසන්ධිච්‍යුති වශයෙන් ප්‍රවෘත්ති නිවෘත්ති ක්‍රමය මෙසේයි.

අණ්ඩජය, ජලාබුජය, සංසෙදජය, ඕපපාතිකයයි ප්‍රතිසන්ධි 4 ක. අණ්ඩයෙහි පිළිසිඳගන්නා කාක කුක්කුටාදි සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය අණ්ඩජ ප්‍රතිසන්ධිය නම්වේ. ගර්භාශයෙහි(වැදූමසෙහි)පිළිසිඳගන්නා මනුෂ්‍ය ගොමහිෂාදිසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිය ජලාබුජ ප්‍රතිසන්ධිය නම්වේ. ගවරවල ආදියෙහි අසම්පූර්ණව පිළිසිඳගෙන ක්‍රමයෙන් දියුණුවන්නාවූ ක්‍රිමි ආදි සත්ත්ව

යන්ගේ ප්‍රතිසන්ධිය සංසෙදජ ප්‍රතිසන්ධිය නම්වේ. ප්‍රතිසන්ධි කාලයෙහිම සම්පූර්ණ දියුණුවෙන් යුක්තව පිළිසිඳගන්නාවූ දෙව බ්‍රහ්ම නෛරයිකාදි සත්ත්වයන්ගේ ප්‍රති සන්ධිය ඖපපාතික ප්‍රති සන්ධිය නම්වේ. අණ්ඩජ ජලාබුජ ප්‍රතිසන්ධිවලය ගර්භශය්‍යකයයිද කියනු ලැබේ. ඒ දෙකින් පිළි සිඳ ගන්නාවූ සත්ත්වයන්ට ප්‍රතිසන්ධි කාලයෙහි ස්ත්‍රී ප්‍රතිසන්ධියක් නම් කාය දශක ස්ත්‍රීභාව දශකවස්තු දශකත්‍රයද පුරුෂ ප්‍රතිසන්ධියක් නම් කායදශක පුරුෂභාව දශක වස්තු දශකත්‍රයද ලැබේ. සංසෙදජ ඖපපාතික ප්‍රතිසන්ධිදෙකින් පිළිසිඳගන්නාවූ සත්ත්වයන්ට ජීවිත නවක කලාපය හැර ප්‍රතිසන්ධි කාලයෙහි චක්ෂු, ශ්‍රොත්‍ර ඝ්‍රාණ, ජිව්හා, කාය, භාව, වස්තු දශක සඞ්ඛ්‍යාත දශක 7 ලැබෙත්. ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාද ක්ෂණය ප්‍රතිසන්ධිකාලයයිද ස්ථිතික්ෂණය පටන් මතුකාලය ප්‍රවෘත්තිකාලයයිද දතයුතු. ඒ ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිති ක්ෂණය පටන් ඍතුජ කලාපද ප්‍රතිසන්ධි චිත්තයෙන් මතු ප්‍රථම භවාඞ්ගචිත්තයාගේ උත්පාදක්ෂණය පටන් චිත්තජ කලාපද ආහාර වැළදූ තැන් පටන් ආහාරජ කලාපද ලැබෙත්.

මරණකාලයෙහි කර්මජරූපච්‍යුති චිත්තයසමගද චිත්තජ ආහාරජ රූපදෙකොටස ච්‍යුති චිත්තයෙන් මතු ස්වල්පවේලාවක් සිටද නිරුද්ධවන්නාහුය. ඍතුජ රූපවනාහි මෘතකලෙවර (මළසිරුරු) බවට පැමිණ පසුද ඉපදෙමින් නිරුද්ධවෙමින් සන්තති ඝට්ටණයට පැමිණෙන්නාහුය.

---

සිරිධම්මාභිධානෙන විසුද්ධාරාමවාසිනා,
ථෙරෙනාබ්භතිකාඛ්‍යාය කතායං රූපවණ්ණනා.

## සංක්ෂෙප රූප සංග්‍රහ වර්ණනාව නිමි.

නිබ්බාන පච්චයො හොතු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු